# වාර්ෂික වාර්තාව

# 2019


කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල,

නුගේගොඩ.

# පටුන


- වාර්තාව ගරු ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම 03
- සභාපතිතුමාගේ පණිවුඩය 04
- ආයතනයේ දර්ශනය හා මෙහෙවර ප්‍රකාශය 05
- අධ්‍යක්ෂ මණ්ඩලය 06
- ආයතනයේ සංවිධාන ව්‍යුහය 07
- පෙරවදන 08


**අංශභාර අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා**


- මෙහෙයුම් අංශය 11
- රක්ෂණ අංශය 16
    - ❖ කෘෂිකාර්මික රක්ෂණ කටයුතු සහ පශු සම්පත් රක්ෂණ කටයුතු
- ගොවි විශ්‍රාම වැටුප් අංශය 24
    - ❖ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා දීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- පරිපාලන හා මානව සම්පත් අංශය 32
- අභ්‍යන්තර විගණන අංශය 38
- සැලසුම් අංශය 43
- මුදල් අංශය 46


**ගිණුම්**


- පෙර වසර පහක මූල්‍ය තොරතුරු 48
- සමස්ථ යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන 52
- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය 55
- ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 81
- දීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 100


**විගණකාධිපති වාර්තා**


- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය 118
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 127
- දීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 136


**විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු**


- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය 144
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 148
- දීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 153

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams: රක්ෂණ / ரக்ஷன / Rakshana
117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No.: 4/5/මු/ර/11
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.:
දිනය / திகதி / Date: 2021-10-15

ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමඟ,
බත්තරමුල්ල.

**වාර්ෂික වාර්තාව - 2019**

2019 වසර තුළ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලනය, මෙහෙයුම් හා මූල්‍ය කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය සහ වර්ෂය තුළ සිදු කරන ලද සියළුම ක්‍රියාකරම් ඇතුලත් 2019 මණ්ඩලීය වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2812571, 011-2812572, 011-2812573
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2812571, 011-2812572, 011-2812573
සභාපති / தலைவர் / Chairman: 011-2812571, 011-2812572, 011-2812573
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 011-5732397, 011-2812574
ප්‍රධාන කාර්යාලය / தலைமையகம் / Head Office: 011-5384000

## ගරු සභාපතිතුමාගේ පණිවිඩය

2018 වර්ෂයේදී යල කන්නයේ සිට රජය මඟින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත වී, බඩ ඉරිඟු, ලොකු ඵෑණු, අර්තාපල්, සෝයා සහ මිරිස් යන ප්‍රධාන බෝග වර්ග හය සඳහා ගොවීන්ගෙන් රක්ෂණ වාරික මුදල් අයකිරීමකින් තොරව අක්කරයක් සඳහා වූ රු. 3,600/-ක රක්ෂණ වාරික මුදල රජය විසින් මහා භාණ්ඩාගාරය යටතේ ගෙවීමට යටත්ව, අක්කරයකට රු.40,000/-ක රක්ෂණ ආවරණයක් ලබා දීමේ රක්ෂණ වැඩසටහනක් 2018 යල කන්නයේ සිට ක්‍රියාත්මක කරන ලදී. එය 2019 වර්ෂය තුළද ක්‍රියාත්මක කිරීම තුළින් ගොවි ජනතාවට මෙම භෝග 06ට සිදුවන හානි ආවරණය කරගැනීමට හැකිවීම මත ඔවුන් තවදුරටත් වගා කිරීමට උනන්දුවක් ඇතිකිරීම කෙරෙහි සෘජුවම බලපාන විශේෂ හේතුවක් වශයෙන් දැක්විය හැක.

නොමිලේ ක්‍රියාත්මක වන මෙම වගා රක්ෂණ වැඩසටහන මණ්ඩලයේ මූල්‍ය ආදායම් උත්පාදනයට බලපාන කරුණක් වන නමුත් දේශීය ගොවිජනතාව සුරක්ෂිත කර ඔවුන්ගේ ආර්ථිකය ස්ථායී කිරීම සඳහා වන රජයේ අරමුණ සඳහා දායකවීමට හැකිවීම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් සිදුකරන ලද සමාජ සත්කාරයක් ලෙස සළකමි.

මෙම තත්ත්වය යටතේ වුවද මණ්ඩලය විසින් 2019 වර්ෂයේදී කෘෂි රක්ෂණ යෝජනා ක්‍රම මඟින් රු.මි. 652.3ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇති අතර, මෙම වර්ෂයේ උපයාගෙන ඇති මෙහෙයුම් ලාභය රු.මි. 878.1කි. වර්ෂය තුළ මණ්ඩලයේ අනෙකුත් රක්ෂණ ආදායම රු.මි. 298.6 ක් වූ අතර, එය 2018 වර්ෂයට සාපේක්ෂව 53%ක වර්ධනයකි.

විපතට පත් ගොවිජනතාව වෙනුවෙන් කඩිනමින් වන්දි මුදල් ගෙවීම මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යභාරය වන අතර, 2019 වර්ෂයේදී ද දිවයිනේ ප්‍රධානතම කෘෂිකාර්මික දිස්ත්‍රික්ක ගණනාවක අධික වර්ෂාව, ගංවතුර හේතුවෙන් සහ සේනා දළඹු උවදුරින් විපතට පත් ගොවිජනතාව වෙනුවෙන් මණ්ඩලයේ අනිවාර්යය වගා රක්ෂණ වන්දි වගකීම රු.මි. 2,155ක් පමණ වී ඇත.

මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ මත පත් කරන ලද විද්වත් කමිටුව ගොවීන්ගේ අර්ථිකයට බරක් නොවන පරිදි දායකත්වය ලබාගත හැකි, කෘෂිකාර්මිකයින්ගේ වයෝවෘද්ධ කාලය සැපවත්ව ගතකිරීම ප්‍රධාන අරමුණ කරගනිමින් වඩාත් ආකර්ෂණීය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම සඳහා දිගින් දිගටම සාකච්ඡා කරමින් අදාල යෝජනා ක්‍රමය සකස් කරමින් පවතී. ඒ අනුව නව යෝජනා ක්‍රම ස්ථාපනය කෙරෙන තෙක් පවත්නා යෝජනා ක්‍රමවල දායකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප්, මරණ හා බෙලහීන ප්‍රතිලාභ 2019 වර්ෂයේදී ද නියමිත පරිදි ගෙවා ගොවීන්ගේ අවශ්‍යතා සපුරා ඇත.

මීට අමතරව කෘෂිකාර්මික දත්ත පද්ධතියක් ඇති කිරීමේ ජාතික වැඩසටහනට සුවිශේෂ දායක්වයක් ලබාදීමේ කටයුතු ද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් සිදුකර ඇත.

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

# කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

## ➢ දැක්ම ..

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගණ්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම.

## ➢ මෙහෙවර ..

කෘෂිකාර්මික රක්ෂණය සහ ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකි විශිෂ්ඨ සේවාවක් සැපයීම.

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2019

| | නම | තනතුර |
|---|---|---|
| 01 | සුමිත් වර්ණකුලසූරිය මහතා<br>සභාපති<br>කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය<br>නුගේගොඩ | සභාපති |
| 02 | ආචාර්ය ඩබ්.එම්. වීරකෝන් මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්,<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>පේරාදෙණිය | සාමාජික |
| 03 | ඩබ්.එම්.එම්.බී. වීරසේකර මහතා<br>ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | සාමාජික |
| 04 | එච්.ඒ.එන්.එස්. කුමාර මහතා<br>අධ්‍යක්ෂ<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>කොළඹ 01 - 2019 ජූලි මාසය දක්වා<br><br>දර්ශනී ද සිල්වා මෙනවිය - 2019 ඔක්තෝබර් සිට<br>අධ්‍යක්ෂ<br>තොරතුරු, සම්පත් සම්බන්ධීකරණය සහ ප්‍රතිපත්ති පර්යේෂණ අධ්‍යයන අංශය<br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | සාමාජික |
| 05 | නිමල්කා ඩයස් මහත්මිය<br>අතිරේක ලේකම් ( පාලන හා මානව සම්පත් සංවර්ධන)<br>කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | සාමාජික |
| 06 | ආචාර්ය කේ.ඩී. ආරියපාල<br>අතිරේක ලේකම් (පශු සම්පත් දෙපාර්තමේන්තුව)<br>කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය - 2019 සැප්තැම්බර් දක්වා<br><br>ආචාර්ය කේ.ජී.ජී.කේ. හඳුලතා - 2019 ඔක්තෝබර් සිට<br>අතිරේක ලේකම් (පශු සම්පත් දෙපාර්තමේන්තුව)<br>පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | සාමාජික |
| 07 | එන්.බී.එම්. රණතුංග මහතා<br>අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික)<br>කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | සාමාජික |
| 08 | ඩී.එම්. නෙවිල් දිසානායක මහතා<br>මහජන බැංකුව<br>මරදන්කඩවල | සාමාජික |
| 09 | ආර්.එම්.පුංචිරාල මහතා<br>(ජාතික ගොවි සමිතියේ සාමාජික) | සාමාජික |

# <u>ආයතනික ව්‍යුහය</u>

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය



# පෙරවදන

කෘෂිකර්මාන්තයේ තිරසර සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන්නාවූ ජාතික වැඩපිළිවෙලේදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය දැවැන්ත කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

එහි ප්‍රමුඛතම කාර්යය ලෙස අවදානම් කළමනාකරණයේදී කෘෂිකාර්මිකයා වෙනුවෙන් මැදිහත් පාර්ශවකරුවෙකු ලෙස සම්බන්ධ වීම විශේෂයෙන් වැදගත් වේ. මෙහිදී කෘෂිකාර්මිකයාගේ බෝගවල අවදානම භාරගැනීමට අමතරව, කෘෂිකාර්මිකයින්ගේ රථවාහන, උපකරණ හා ගබඩා වෙනුවෙන්ද රැකවරණය සලසමින් කෘෂිකාර්මිකයාගේ සමාජ ආරක්ෂණය උදෙසා කටයුතු කිරීමද විශේෂ වේ.

කෘෂිකාර්මිකයාගේ මෙන්ම කෘෂිකර්මාන්තයේ තිරසර ප්‍රවර්ධනය උදෙසා රටේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වඩාත් ස්ථාවර සහ වේගවත් කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය මූලික කරගනිමින් රජය මඟින් කෘෂිකාර්මිකයින් උදෙසා ක්‍රියාත්මක කළ පොහොර සහනාධාරය වැනි ගොවීන් උදෙසා ක්‍රියාත්මක කළ පහසුකම් දිරි ගැන්වීම් යටතට දිවයිනේ වගා කරන ප්‍රධාන බෝග වර්ග 06 සඳහා 2018 යල කන්නයේ ආරම්භ කරන ලද නොමිලයේ ලබාදුන් අනිවාර්ය රක්ෂණ ක්‍රමයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයට ලක්වූ වසරක් ලෙස 2019 වර්ෂය සැලකිය හැකිවේ.

**වාර්ෂික වාරික ආදායම 2015 සිට 2019 දක්වා**

| **රක්ෂණ ක්‍රමය** | 2015 (රු.මි.) | 2016 (රු.මි.) | 2017 (රු.මි.) | 2018 (රු.මි.) | **2019 (රු.මි.)** |
|---|---|---|---|---|---|
| වගා රක්ෂණ යෝජනා ක්‍රම | 104.60 | 94.85 | 95.66 | 128.01 | **61.11** |
| පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය | 9.00 | 10.56 | 13.39 | 10.59 | **7.87** |
| ගබඩා/ කෘෂි උපකරණ හා තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රම | 1.08 | 7.82 | 42.11 | 137.85 | **220.15** |
| සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම | 16.43 | 15.61 | 5.31 | 6.34 | **9.42** |
| පොහොර සහනාධාර රක්ෂණ යෝජනා ක්‍රම | 1,006.40 | 608.19 | - | - | - |
| **එකතුව** | 1,137.51 | 737.03 | 156.47 | 282.79 | **298.55** |

**වාර්ෂික ශුද්ධ ලාභය 2015 සිට 2019 දක්වා**

| | 2015 (රු.මි.) | 2016 (රු.මි.) | 2017 (රු.මි.) | 2018 (රු.මි.) | **2019 (රු.මි.)** |
|---|---|---|---|---|---|
| මුළු ආදායම | 1,156.10 | 782.20 | 5735.10 | 4,398.50 | **3,365.10** |
| මෙහෙයුම් වියදම | (1,116.10) | (404.50) | (5654.20) | (3,253.80) | **(2,487.00)** |
| මෙහෙයුම් අතිරික්තය | 40.00 | 377.70 | 80.90 | 1,144.7 | **878.10** |
| රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් ආදායම් | 100.80 | 122.50 | 130.10 | 4.00 | **9.10** |
| මුළු වියදම් (වෙන් කිරීම් ද ඇතුළුව) | (132.00) | (160.30) | (168.70) | (227.70) | **(234.90)** |
| **වාර්ෂික ශුද්ධ ලාභය/ අලාභය** | 8.80 | 339.90 | 42.30 | 921.00 | **652.30** |

2019 වර්ෂය තුළදී මණ්ඩලයේ ආදායමේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කර ගැනීමට තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ ක්‍රමය සමත්විය. 2018 වර්ෂයේ රුපියල් මිලියන 137.85ක් වූ ආදායම 2019 වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 220.15 දක්වා වර්ධනය කර ගැනීම මෙම වර්ෂයේ විශේෂ විය. තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ ක්‍රමයේ නීතිමය බාධාවන් නිරාකරණය කර ගැනීම සහ දිස්ත්‍රික් මට්ටමින් පුළුල් අලෙවි සහ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ අදාල යෝජනා ක්‍රමය

සම්බන්ධ විශ්වාසය කෘෂිකාර්මිකයින් තුළ ඇති කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රගතිය අත්පත් කරගත හැකිවිය. මේ මඟින් උපයාගත් ආදායම මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

2018/19 මහ කන්නයට අදාලව වගා හානි සැළකිය යුතු ප්‍රමාණයක් මෙවර වාර්තා විය. විශේෂයෙන් උතුරු පළාත තුළ 2018 දෙසැම්බර් මාසයේ පැවති දරුණු ගංවතුර තත්ත්වය හේතුවෙන් වගා හානි පරීක්ෂාව උදෙසා විශේෂ ජංගම සේවා වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කරන්නට සිදුවූ වර්ෂයක් ලෙස 2019 වර්ෂය හැඳින්විය හැකිවේ. ඒ අනුව, මහ කන්නය සඳහා රුපියල් මිලියන 946ක මුදලක් වන්දි වශයෙන් ගොවීන් වෙත ගෙවීමට කටයුතු කරන ලදී.

මීට අමතරව අනුරාධපුරය, මොණරාගල, අම්පාර, බදුල්ල දිස්ත්‍රික් ප්‍රධානකොට පැතිරගිය සේනා දළඹු උවදුරින් හානියට පත් බඩඉරිඟු වගා ඉඩම් අක්කර 4,711ක් වෙනුවෙන් ගොවීන් 4,265 දෙනෙකු අතරේ රුපියල් මිලියන 168ක මුදලක් ගෙවීමට අවශ්‍ය කටයුතු සියළු හානි තක්සේරු කිරීම් සහ වන්දි ගණනය කිරීමෙන් අනතුරුව සිදුකරන ලදී. එසේම, මෙම උවදුර හේතුවෙන් අර්ධ සහ සුළු පරිමාණ හානි ලෙස වාර්තා වූ ගොවීන් සඳහාද වන්දි මුදල් ගෙවීම මෙම කාලය තුළදීම සිදුකරන ලදී.

2019 වර්ෂය අවසාන වනවිට වගා කන්න තුනක එනම්, 2018 යල, 2018/19 මහ සහ 2019 යල කන්නයන්හි සිදුවූ වගා හානි සඳහා වන්දි ගණනය කර මුදල් නිදහස් කිරීමට හැකිවිය.

2019 යල කන්නය සඳහා ජාතික රක්ෂණ වැඩසටහනට ඇතුළත්වන සියළු වගාවන් සඳහා ප්‍රතිරක්ෂණ පහසුකම ජාතික රක්ෂණ භාර අරමුදලින් ලබාගෙන රක්ෂණ ආවරණය තහවුරු කිරීමටද කටයුතු කර ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ මහ පෙන්වීම යටතේ ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය තාක්ෂණික සහාය ඇතිව දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතියේ කටයුතු 2019 වර්ෂය තුළදී දිවයිනේ දිස්ත්‍රික් කීපයක්ම මුල් කර ගනිමින් ක්‍රියාත්මක වූ අතර, එයට අමතරව කෘෂිකාර්මික දත්ත ඇතුළත් කළමණාකරණ දත්ත පද්ධතියක් (MIS) සහිත Cloud Based වෙබ් / ජංගම යෙදවුමක් ගොඩ නැගීමේ වැඩසටහනද 2019 වර්ෂය තුළදී සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මේ මඟින් ගොවිබිම් සිතියම්ගත කිරීමේ සහ ගොවීන්ගේ හා ගොවිබිම්වල දත්ත ඇතුළත් කිරීමේ කටයුතු නෝරා ගත් දිස්ත්‍රික්කයන්හිදී ක්‍රියාත්මක කරන ලදී. උතුරු පළාතේ ඇතිවූ දැඩි ගංවතුර තත්ත්වය හේතුවෙන් විශාල වශයෙන් හානියට පත්වූ වගා බිම් වන්ද්‍රිකා ඡායාරූප හා ඩ්‍රෝණ තාක්ෂණය උපයෝගී කරගෙන තක්සේරු කිරීම නව තාක්ෂණය හා මුසුවුනු මණ්ඩලයේ ක්‍රියාකාරීත්වයේ ප්‍රශංසනීය වෙනසක් ලෙස සඳහන් කළ හැකිවේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ප්‍රධානතම සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයවන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2019 වර්ෂය අවසානයේදී දායක වී ඇති සමස්ත දායකයින් ප්‍රමාණය 959,254ක් වන අතර, මෙම වර්ෂය තුළදී මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ සපයන ගොවීන් සංඛ්‍යාව 159,425කි.

මෙයට අමතරව ධීවර ප්‍රජාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක වන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2019 වර්ෂය අවසානයේදී 69,049ක් වන ධීවරයින් සාමාජිකත්වය

දරණ අතර, ධීවර විශ්‍රාම වැටුප්ලාභීන් 4,755 දෙනෙකු වෙත මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකර තිබුණි.

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 වර්ෂය අවසානය වනවිට වර්තමාන වගකීම රු.බිලියන 70.2ක් විය. මෙම වගකීමට මුහුණ දීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ගොඩනැඟීමට භාණ්ඩාගාර බැඳුම්කර ලබාදීම එවකට ගත් තීරණ අනුව ලැබිය යුතු බිලියන 05ක අරමුදල මෙම වර්ෂයේදීද මණ්ඩලය වෙත නොලැබුණු අතර, සෑම වර්ෂයකම විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රාජ්‍ය අයවැය ලේඛනය මඟින් වෙන් කරනු ලැබේ.

දැනට ක්‍රියාත්මක මෙම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවට කෘෂිකාර්මිකයින් සඳහා වඩාත් ප්‍රතිඵලදායක නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් කෘෂිකර්ම අමාත්‍යාංශයේද මහපෙන්වීමෙන් පත් කරන ලද කමිටුවේ උපදෙස් මත සකස්කර අවසන් අතර, එය 2020 වර්ෂයේදී අදාල අනුමැතියන් ලබාගෙන ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු නිලධාරීන් 07 දෙනෙකු අවස්ථා කීපයකදී ඉන්දීය රජය මඟින් අමාත්‍යාංශය වෙත ලබාදී තිබූ පුහුණු වැඩමුළු සහ විශේෂ කෘෂිකාර්මික රක්ෂණ සමුළු සඳහා සහභාගී කරවීම මෙම වර්ෂයේදී විශේෂ වූ විදේශීය පුහුණු වැඩසටහන් විය. එයට අමතරව සියළුම දිස්ත්‍රික් ක්ෂේත්‍ර කාර්යය මණ්ඩල හා විෂයානුබද්ධ කළමනාකරණ සහකාරවරුන් සඳහා කලාපීය මට්ටමෙන් මණ්ඩලීය යෝජනා ක්‍රම සම්බන්ධව මූල්‍ය, පරිගණක ක්ෂේත්‍ර සහ ප්‍රවර්ධනය මූලික කර ගත් එක් දින වැඩමුළු මාලාවක් පැවැත්වීමට කටයුතු කළ අතර, දිස්ත්‍රික් කාර්යය මණ්ඩල හා සෘජුව සම්බන්ධ වීම මත ඔවුන්ගේ බොහොමයක් ප්‍රායෝගික කාර්යාලයීය ගැටලු සඳහා විසඳුම් ලබා දීමට මේ මඟින් හැකිවිය. මෙම පුහුණු වැඩමුළු ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන්ගේ මෙහෙයවීම මත පැවැත්වුණි.

2019 වර්ෂයේදී විශ්‍රාම ගැනීමෙන් සහ මියයෑමෙන් මණ්ඩලයේ නිලධාරීන් 24 දෙනෙකු ඉවත් වූ අතර, බාහිර වශයෙන් බඳවා ගැනීම් 21ක් සහ එක් උසස්වීමක් ලබා දීමට කටයුතු කරන ලදී. මේ වන විට මණ්ඩලයේ සමස්ත සේවක සංඛ්‍යාව 282ක් වන අතර, 421ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 139ක් පුරප්පාඩුව පවතී.

ජාතික කෘෂිකාර්මික, පශු සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියේදී පුළුල් දායකත්වයක් ලබා දෙමින් අවදානම් අවම කිරීම සඳහාවන ශක්තිය කෘෂිකාර්මියා ප්‍රමුඛ ජාතික කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලියට ලබා දෙමින්, රටේ සමස්ත ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමුඛ්‍ය කාර්යය කොටසක් ඉටුකරනු ලබන ආයතනයක් ලෙස කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සිය වගකීම 2019 වර්ෂය තුළදී ද ඉටුකරන ලදී.

# මෙහෙයුම් අංශය

## මෙහෙයුම් අංශය - 2019

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කෘෂිකාර්මික රක්ෂණය හඳුන්වාදී දේශීය කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීම මුඛ්‍ය කර්තව්‍යය කරගනිමින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක වේ. නියඟය, ගංවතුර, වන අලි හානි ඇතුළු ස්වභාවික ආපදා තත්ත්වයන් තුළදී ගොවීන් මුහුණ දෙන ආර්ථික ගැටළුවලට මනා විසඳුමක් ලෙස කෘෂි රක්ෂණ ක්‍රමවේදය වැදගත් වේ. එමෙන්ම, කෘෂි ආර්ථික රටාවක් තුළින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේදී කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය වඩාත් ප්‍රායෝගික අයුරින් යොදා ගැනීම දේශීය කෘෂි ආර්ථික හා ජීවන රටාව ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාමට මහඟු පිටිවහලක් වී ඇත. විශේෂයෙන් ගොවීන්ට වඩාත් සමීප වගා රක්ෂණ යෝජනා ක්‍රමය, පශු රක්ෂණ යෝජනා ක්‍රමය, සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය, කෘෂි උපකරණ රක්ෂණය, ගබඩා රක්ෂණය හා තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණය වැනි වැඩි ප්‍රතිලාභ සහිත රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් ගොවි ජනතාව වෙනුවෙන් මණ්ඩලය මඟින් ක්‍රියාත්මක වේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සේවාවන් ගොවි ජනතාව අතර ව්‍යාප්ත කිරීමේදී වඩාත් වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට මෙහෙයුම් අංශයට පැවරී ඇත. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ඉදිරි වැඩපිළිවෙල ඇතුළත් සංයුක්ත සැලැස්මට අනුකූලව සියළුම ආයතනික සැලසුම් සකස් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කරවීම සඳහා දීප ව්‍යාප්තව පැතිරී ඇති දිස්ත්‍රික් කාර්යාල මෙහෙයවීම, ඒ සඳහා වූ මානව හා භෞතික අවශ්‍යතා පූරණය කිරීම ඇතුළු සුවිශේෂී වූ කාර්යභාරයක් මෙහෙයුම් අංශය මඟින් ඉටු කරනු ලබයි.

- කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ සේවා සපයන ප්‍රධාන රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථාවර කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටුකිරීම අරමුණු කරගනිමින්, 2019 වර්ෂයේදීද රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් අංශය කටයුතු කර ඇත.
    1. වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - බඩ ඉරිහු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - ලොකු ළූණු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අර්තාපල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - මිරිස් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - සෝයා වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අතිරේක බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තල, කුරක්කන්, කොල්ලු, මුංඇට, කව්පි, උඳු)
        - උක් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අපනයන බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (ගම්මිරිස්, කුරුඳු)
        - වැවිලි බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තේ වගාව)
        - පොල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය

- මල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- ඉහුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- එළවළු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- කෙසෙල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
- පළතුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය

2. ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය
3. කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය
4. පශු රක්ෂණ යෝජනා ක්‍රමය
    - ගවයන්
    - එළුවන්
5. හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය
6. සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
7. තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය
8. සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම
    - ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
    - ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

නියඟය, ගංවතුර හා වන අලින්ගෙන් සිදුවන ආපදාවලින් වගා කටයුතුවලට ඇති වියහැකි හානි නිසා ගොවි ප්‍රජාවට මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවලට පිළියමක් වශයෙන් වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකුළූණු, සෝයා හා මිරිස් වගාවන් සඳහා ගොවීන්ගේ සහ රජයේ දායකත්වය සහිත අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයකට ගොවීන් දායක කරගැනීම සිදුවූ අතර, 2018 යල කන්නයේ සිට ගොවීන්ගෙන් වාරික මුදල් අය කිරීමෙන් තොරව රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත අක්කරයක් සඳහා උපරිමය රු.40,000/-ට යටත්ව රක්ෂණ ආවරණයක් ලබා දීමට රජය විසින් කටයුතු කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු ඇතුළු අදාල සියළු ආයතන සම්බන්ධීකරණයෙන් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය 2018 යල කන්නයේ සිට මණ්ඩලය විසින් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලැබේ.

**<u>මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් :</u>**

- 2018/19 මහ කන්නයේ වී අස්වැන්න නෙළා ගැනීමෙන් අනතුරුව අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස ජාතික අලුත් සහල් මංගල්‍යය 2019.04.06 හා 07 දෙදින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, පිරිත් මණ්ඩපය ඉදිකිරීම, ශබ්ද විකාශන පහසුකම් සැපයීම ඇතුළු කාර්යයන් බොහොමයක් මණ්ඩලයේ අනුග්‍රාහකත්වයෙන් හා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.
- 2018/19 මහ කන්නයේදී උතුරු පළාතේ ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් යාපනය, කිලිනොච්චිය, වව්නියාව, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්කවල බොහොමයක් වගාවන් හානියට පත්විය. විශේෂයෙන්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉරණමඩු වැවෙහි සිදුවූ හානියේ

ප්‍රතිඵලයක් ලෙස වී වගා අක්කර 27,000ක් පමණ හානිවී ඇති බවට වාර්තා විය. එහිදී, කෘෂිකර්ම අමාත්‍යතුමා සහ අදාල ආයතන ප්‍රධානීන් ඇතුළු නිලධාරීන් සිදුකළ සාකච්ඡාවේදී සහ ක්ෂේත්‍ර නිරීක්ෂණයේදී හානි වී ඇති වගා බිම්වලට වන්දි ගෙවීමේ ක්‍රමවේදයක් සැකසීමට තීරණය විය. ඒ අනුව, 2019.01.07 දින සිට සති 03ක කාලසීමාවක් තුළ මණ්ඩලීය දිස්ත්‍රික් කාර්යාලයීය නිලධාරීන්, ගොවිජන සේවා නිලධාරීන්, ගොවි සංවිධාන නිලධාරීන් එකතුව ක්ෂේත්‍ර නිරීක්ෂ කටයුතු සිදුකරන ලදී. එලෙස, උතුරු පළාතේ හානි වූ වගා බිම් හඳුනාගනිමින් වඩාත් නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කරමින් ගොවීන් වෙත වන්දි ලබා දීමේ වඩාත් ප්‍රායෝගික හා නිවැරදි වැඩසටහන් සිදුකරන ලදී.

- 2018/19 මහ කන්නයේදී බඩඉරිඟු වගාවට සේනා දළඹු හානිය මඟින් වැඩි බලපෑමක් ඇති කළ අම්පාර, මොණරාගල සහ මඩකලපුව දිස්ත්‍රිකයන්හි ප්‍රථම අදියර ලෙස පූර්ණ හානි සිදුවූ ගොවීන්ගේ වගා බිම් පරීක්ෂා කිරීම සිදුකරන ලදී. 2019 වර්ෂයේ මාර්තු මාසයේ සිට අප්‍රේල් මස 11වන දින දක්වා මෙම ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු සිදු කළ අතර, හඳුනාගත් ගොවීන් වෙත වඩාත් නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කරමින් වන්දි ලබා දීමට කටයුතු කෙරිණි.

- 2019 යල කන්නයේ කුරුණෑගල, ගම්පහ සහ මාතර දිස්ත්‍රික්කයන්හි නියඟය හා අධික වර්ෂාව හේතුවෙන් හානිවූ වගා බිම් නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයීය හා දිස්ත්‍රික් කාර්යාලයීය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු සිදුකෙරිණ. මෙහිදී, වැඩි වශයෙන් වගා හානි වාර්තා වී ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන තෝරා නිරීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

- 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සේවාව කරගනිමින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ හා මුදල් අමාත්‍යාංශයේ Enterprises Sri Lanka – 2025 ප්‍රදර්ශනය 2019 ජූලි මස 24 දින සිට 27 දින දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වලිසිංහ හරිස්චන්ද්‍ර උද්‍යාන පරිශ්‍රයේදී පැවැත් වූ අතර, එහි මණ්ඩලය නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යන ලදී. එහිදී අත්පත්‍රිකා, බැනර්, පෝස්ටර් හා නව තාක්ෂණය භාවිතා කරමින් මණ්ඩලය මඟින් ක්‍රියාත්මක වන සියළු වැඩසටහන් ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන සියළු ප්‍රේක්ෂකයින්ට ලබා දීමට කටයුතු කරන ලදී.

- 2018 යල කන්නයේ වගා හානිවූ ගොවිජනතාව වෙත වන්දි ප්‍රදානය කිරීමේ උත්සව මාලාවක් 2019 අගෝස්තු මාසය තුළදී ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අනෙකුත් මැති ඇමතිවරුන්ගේ සහභාගීත්වයෙන් මොණරාගල, පොළොන්නරුව, අනුරාධපුර, අම්පාර, කුරුණෑගල, මාතලේ, තඹුත්තේගම, යාපනය, ගම්පහ, පුත්තලම, හම්බන්තොට යන දිස්ත්‍රික්කයන් කේන්ද්‍ර කරගනිමින් පැවැත්වීමට කටයුතු කෙරිණ.

- 2018/19 මහ කන්නයේ බඩඉරිඟු වගාවට ඇතිවූ සේනා දළඹු හානිය මඟින් අසරණ වූ ගොවීන් වෙත වන්දි ලබා දීමේ උත්සවයක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මැති ඇමතිවරුන්ගේ සහභාගීත්වයෙන් 2019.07.31 දින ත්‍රිකුණාමල මහ ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු කෙරිණ.

- මණ්ඩලීය සේවාවන් කාර්යක්ෂම හා නිවැරදිව ඉටුකිරීම වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් භාර සියළුම විධායක නිලධාරීන් සහ සියළුම සංවර්ධන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2019.10.25 හා 26 දෙදින වැඩමුළුවක් මහනුවර, නිල්ලඹ පිහිටි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙහිදී, පවත්නා චක්‍රලේඛ අනුව කාර්යන් සිදුකරන ආකාරයත් පවතින ප්‍රායෝගික ගැටළු සාකච්ඡා කර ඒවාට විසඳුම් ලබාදීමත් සිදුකළ අතර, නිලධාරීන්ගේ ධනාත්මක චින්තනය ඇති කිරීම වෙනුවෙන් විශේෂ දේශනද පවත්වන ලදී.

- බෝග වගා රක්ෂණය, තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණය හා පශු සම්පත් රක්ෂණය පිළිබඳව කාර්යාලයීය ක්‍රමවේදයක් පිළිබඳව මණ්ඩලීය කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| දිනය | වැඩසටහනට සහභාගී වූ දිස්ත්‍රික් කාර්යාල | වැඩසටහන පැවැත්වූ ස්ථානය |
|---|---|---|
| 2019.12.17 | කොළඹ, කළුතර, ගම්පහ, රත්නපුර | ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරය |
| 2019.12.19 | මොණරාගල, බදුල්ල, අම්පාර, ඇඹිලිපිටිය | NAQDA ආයතනය- මොණරාගල |
| 2019.12.23 | යාපනය, කිලිනොච්චිය, මන්නාරම, ත්‍රිකුණාමලය, මුලතිව්, මඩකලපුව, වව්නියාව | ගොවිජන සේවා ශ්‍රවණාගාරය - වව්නියාව |
| 2019.12.24 | අනුරාධපුර, පොළොන්නරුව, තඹුත්තේගම, මහව, කුරුණෑගල, දෙහිඅත්තකණ්ඩිය, මනම්පිටිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය |

- තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් නියෝජිතයින් (රාජ්‍ය අංශය) පත් කිරීම සිදු කරන ලදී. එහිදී, කෑගල්ල, මාතර, මහව, ගම්පහ, අනුරාධපුර, මොණරාගල, බදුල්ල, රත්නපුර දිස්ත්‍රික්කයන් තුළ රක්ෂණ නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී.

- දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන විශේෂ ප්‍රචාරක හා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය පෝස්ටර්, බැනර් හා අත් පත්‍රිකා දිස්ත්‍රික් කාර්යාල මඟින් පිළියෙල කර ගැනීමට අවශ්‍ය කටයුතුද ඉටුකර දී ඇති අතර ගම්පහ, අනුරාධපුර, තඹුත්තේගම, මහනුවර, කළුතර, කුරුණෑගල, කොළඹ, හම්බන්තොට, රත්නපුර, බදුල්ල යන දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබුණු ඉල්ලීම්වලට අනුව අදාල අවශ්‍යතා මෙහෙයුම් අංශය මඟින් සපයා දීමට කටයුතු කර ඇත.

- තෙවන පාර්ශවීය රක්ෂණය සම්බන්ධ විශේෂ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් අලෙවි අංශයේ මැදිහත් වීමෙන් සහ දිස්ත්‍රික් කාර්යාලයන්හි මෙහෙයවීමෙන් දීප ව්‍යාප්තව පවත්වන ලදී.

# රක්ෂණ අංශය

## කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය

## හා

## පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

## රක්ෂණ අංශය - 2019

රක්ෂණ යෝජනා ක්‍රම සකස් කිරීම හා රක්ෂණ යෝජනා ක්‍රම යටතේ ලැබෙන වගකීම් සඳහා වන්දි මුදල් නිදහස් කිරීමට අදාල රාජකාරි කිරීම රක්ෂණ අංශයේ ප්‍රධාන වගකීම වේ. විශේෂයෙන්ම වගා රක්ෂණ, පශු රක්ෂණ හා සමාන්‍ය රක්ෂණ කටයුතු මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව 2019 වර්ෂය තුලදී කරන ලද ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

### 2018 යල කන්නය

2018 යල කන්නය සඳහා ජාතික රක්ෂණ වැඩසටහනට සමගාමීව අමාත්‍යාංශය මගින් වගා රක්ෂණය සංශෝධනය වූ බැවින් වගා හානි වන්දි ගෙවීම් ක්‍රමවේද යාවත් කාලීන කර ගැනීමට සිදුවිය . ඒ අනුව භෝග වර්ග 6 සඳහා වගා හානි වන්දි ගෙවීම සඳහා පසුබිම සකස් කර ගන්නා ලදී . 2018 යල කන්නය සඳහා වගා හානි වන්දි මුදල් නිදහස් කිරීම පිණිස ජංගම වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. 2018 යල කන්නයේ විශාල වශයෙන් වගා හානි සිදු වූ නුවරඑළිය, මහනුවර, ගම්පහ ආදී දිස්ත්‍රික්කයන් සඳහා කණ්ඩායම් යොදවා එමඟින් වගා හානි පිළිබඳව අහඹු අධීක්ෂණයක් සිදු කරවන ලදී. ජංගම වැඩසටහන් නොපැවැත්වූ දිස්ත්‍රික්කයන්හි 2018 යල කන්නයේ වන්දි ගණනය කිරීම් දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් නිලධාරීන් යොදවා සිදු කිරීමට කටයුතු කරන ලද අතර 2019.06.20 දින වන විට යල කන්නයේ වගා හානි සඳහා වන්දි ගණනය කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

2018 යල කන්නය සඳහා 2019 වර්ෂය තුලදී ගෙවීම් කරන ලද වන්දි මුදල් සාරාංශය පහත පරිදි වේ.

**2018 යල වන්දි ගෙවීම් සාරාංශ වාර්තාව**

| අංකය | දිස්ත්‍රික් කාර්යාලය | ගොවීන් සංඛ්‍යාව | අක්කර ප්‍රමාණය | වන්දි මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | ගම්පහ | 1,571 | 1,829.79 | 23,236,958.00 |
| 2 | පුත්තලම | 1,282 | 2,153.74 | 43,694,540.00 |
| 3 | කෑගල්ල | 206 | 116.60 | 1,787,515.00 |
| 4 | මනම්පිටිය | 994 | 1,141.50 | 35,721,200.00 |
| 5 | කුරුණෑගල | 5,036 | 4,067.49 | 101,763,986.00 |
| 6 | මහව | 1,623 | 1,490.22 | 39,200,308.00 |
| 7 | මොණරාගල | 713 | 997.55 | 25,908,050.00 |
| 8 | රත්නපුර | 82 | 46.25 | 685,950.00 |
| 9 | වවුනියා | 5 | 25.00 | 500,000.00 |
| 10 | පොළොන්නරුව | 2,165 | 4,407.50 | 111,896,650.00 |
| 11 | බදුල්ල | 570 | 689.70 | 17,676,024.25 |
| 12 | දෙහිඅත්තකණ්ඩිය | 152 | 193.19 | 3,591,050.00 |
| 13 | හම්බන්තොට | 600 | 709.76 | 17,920,207.00 |
| 14 | අම්පාර | 372 | 726.81 | 16,418,172.00 |
| 15 | අනුරාධපුරය | 1,839 | 2,335.38 | 54,716,450.00 |
| 16 | කළුතර | 349 | 321.92 | 3,835,141.00 |
| 17 | මහනුවර | 64 | 37.95 | 868,870.00 |
| 18 | මාතලේ | 1,091 | 1,052.36 | 27,345,485.00 |
| 19 | මාතර | 398 | 362.95 | 7,578,570.00 |
| 20 | නඹුත්තේගම | 969 | 870.58 | 21,026,984.00 |
| 21 | නුවරඑළිය | 334 | 153.58 | 3,376,896.00 |
| 22 | ගාල්ල | 57 | 54.50 | 1,114,450.00 |
| 23 | ත්‍රිකුණාමලය | 175 | 313.50 | 7,579,600.00 |
| 24 | මුලතිවු | 8 | 20.00 | 364,000.00 |
| | **එකතුව** | **20,655** | **24,117.82** | **567,807,056.25** |

## 2018/19 මහ කන්නය

2018/19 මහ කන්නයට අදාල වගා හානි 2018.12.07 වන විට සැලකිය යුතු ප්‍රමාණයක් වාර්ථා විය.ඒ අනුව 2019 වර්ෂය ආරම්භයේ සිටම හානි වූ බිම් පරීක්ෂා කිරීම සඳහා නිලධාරීන් සම්බන්ධ කිරීමටත්, වන්දි ගණනය කිරීම් කටයුතු සඳහා ජංගම වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමටත් සිදු විය. එසේම මෙම වර්ෂයේදී 2018 දෙසැම්බර් මාසය තුල උතුරු පළාතේ ඇතිවූ හදිසි ගංවතුර තත්වය හේතුවෙන් සිදුවූ වගා හානි සඳහා වන්දි මුදල් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. ඒ සඳහා අංශයේ නිලධාරීන් උතුරු පළාතේ රාජකාරි සඳහා නිරත කරන ලදී.

18/19 මහ කන්නයේ ගංවතුරින් හානි වූ වගා හානි සඳහා වන්දි මුදල් නිදහස් කිරීම පිණිස ජංගම වැඩසටහන් කීපයක්ම 2019 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව පහත සටහනේ පරිදි වන්දි මුදල් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී.

**2018-19 මහ වන්දි ගෙවීම් සාරාංශ වාර්තාව**

| අංකය | දිස්ත්‍රික් කාර්යාලය | ගොවීන් සංඛ්‍යාව | අක්කර ප්‍රමාණය | වන්දි මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | අම්පාර | 5,183 | 8,648.24 | 163,311,988.00 |
| 2 | අනුරාධපුරය | 3,078 | 5,442.39 | 111,408,850.00 |
| 3 | බදුල්ල | 684 | 874.63 | 18,766,294.00 |
| 4 | මොණරාගල | 1,720 | 1,748.89 | 39,493,800.00 |
| 5 | මඩකළපුව | 1,087 | 3,439.98 | 43,996,602.00 |
| 6 | ගම්පහ | 479 | 473.78 | 6,343,760.00 |
| 7 | හම්බන්තොට | 380 | 348.39 | 8,707,967.00 |
| 8 | නුවරඑළිය | 52 | 25.17 | 458,700.00 |
| 9 | තඹුත්තේගම | 478 | 406.44 | 11,337,640.00 |
| 10 | ත්‍රිකුණාමලය | 1,959 | 3,235.04 | 69,861,739.00 |
| 11 | යාපනය | 1,039 | 939.84 | 15,565,813.00 |
| 12 | කිළිනොච්චිය | 3,605 | 8,904.00 | 187,381,060.00 |
| 13 | පොළොන්නරුව | 960 | 2,039.30 | 37,228,000.00 |
| 14 | මනම්පිටිය | 640 | 625.40 | 16,303,150.00 |
| 15 | මාතර | 609 | 517.06 | 14,168,923.00 |
| 16 | මාතලේ | 451 | 483.03 | 9,918,961.00 |
| 17 | නුවරඑළිය | 193 | 135.82 | 2,540,815.00 |
| 18 | මහව | 500 | 438.02 | 9,676,725.00 |
| 19 | කෑගල්ල | 158 | 76.62 | 1,437,581.00 |
| 20 | රත්නපුර | 47 | 29.38 | 443,700.00 |
| 21 | මන්නාරම | 833 | 1,740.50 | 21,610,200.00 |
| 22 | වවුනියාව | 88 | 144.75 | 2,515,910.00 |
| 23 | ගාල්ල | 122 | 140.68 | 3,413,924.00 |
| 24 | කුරුණෑගල | 278 | 182.63 | 4,299,608.00 |
| 25 | පුත්තලම | 518 | 1,076.45 | 15,103,910.00 |
| 26 | දෙහිඅත්තකණ්ඩිය | 439 | 358.13 | 7,249,950.00 |
| 27 | මුලතිව් | 3,747 | 7,790.35 | 124,301,750.00 |
| | **එකතුව** | **29,327** | **50,264.91** | **946,847,320.00** |

**බඩඉරිගු වගාවේ සිදුවූ සේනා දළඹු හානි**

එසේම 2018/19 මහ කන්නයට අදාලව බඩ ඉරිගු වගාවේ සිදුවූ සේනා දළඹු හානි වලට වන්දි මුදල් නිදහස් කිරීමටද මෙම වර්ෂයේ සිදුවිය. ඒ අනුව අනුරාධපුරය, මොණරාගල, අම්පාර, බදුල්ල දිස්ත්‍රික්ක මුල් කරගෙන සිදුවූ වගා හානි සඳහා වන්දි ගණනය කිරීම් සිදුකිරීමට කටයුතු කරන ලදී.

මේ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කර පූර්ණ වශයෙන් හානි සිදුවූ වගාවන්ට මුදල් නිදහස් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලදී.

පහත සඳහන් A සටහනේ වන්දි මුදල් නිදහස් කිරීමට අදාළ විස්තර ඇතුලත් වේ. එසේම B සටහනේ අර්ධ හා සුළු හානි යටතේ දළ වගකීම පෙන්නුම් කර ඇත.

**2018/19 සේනා දළඹු හානි සඳහා වන්දි මුදල**

**A. පූර්ණ හානි සඳහා වන්දි ගෙවීම**

| අංකය | දිස්ත්‍රික්කය | ගොවීන් ගණන | අක්කර ගණන | වන්දි මුදල (රු.) | |
|---|---|---|---|---|---|
| 1 | අම්පාර | 302 | 409.19 | 16,367,400.00 | අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පූර්ණ හානි සඳහා ගෙවීම් කර ඇත. සංදේශ අංකය 19/0166/118/010 |
| 2 | අනුරාධපුරය | 56 | 55 | 2,200,000.00 | |
| 3 | තඹුත්තේගම | 87 | 86.38 | 3,455,000.00 | |
| 4 | මොණරාගල | 3101 | 5879.92 | 127,952,200.00 | |
| 5 | මඩකලපුව | 613 | 477.25 | 19,090,000.00 | |
| 6 | හම්බන්තොට | 79 | 52.18 | 2,087,200.00 | |
| 7 | රත්නපුර | 51 | 32.83 | 1,313,107.00 | |
| 8 | බදුල්ල | 388 | 529.13 | 21,165,000.00 | |
| 9 | මහව | 97 | 92.12 | 3,684,800.00 | |
| 10 | කුරුණෑගල | 6 | 4.5 | 180,000.00 | |
| 11 | පොළොන්නරුව | 94 | 68.25 | 2,730,000.00 | |
| 12 | මනම්පිටිය | 95 | 69.25 | 2,770,000.00 | |
| 13 | ත්‍රිකුණාමලය | 325 | 258 | 10,320,000.00 | |
| 14 | ගම්පහ | 7 | 3.6 | 147,200.00 | |
| 15 | මහනුවර | 62 | 33.17 | 1,326,000.00 | |
| 16 | මන්නාරම | 10 | 13 | 520,000.00 | |
| 17 | මුලතිව් | 24 | 27.75 | 1,090,000.00 | |
| 18 | වවුනියා | 22 | 21.5 | 860,000.00 | |
| 19 | කිළිනොච්චිය | 3 | 4 | 40,800.00 | |
| 20 | යාපනය | 3 | 0.79 | 31,600.00 | |
| 21 | පුත්තලම | 32 | 28.25 | 1,090,000.00 | |
| 22 | නුවරඑළිය | 4 | 1 | 40,000.00 | |
| | **එකතුව** | **5,461** | **8,147** | **218,460,307.00** | |

**B. අර්ධ හා සුළු හානි සඳහා ගණනය වී ඇති වන්දි මුදල**

| අංකය | දිස්ත්‍රික්කය | ගොවීන් ගණන | අක්කර ගණන | වන්දි මුදල (රු.) | |
|---|---|---|---|---|---|
| 1 | අම්පාර | 14,677 | 19,600.00 | 226,886,846.00 | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොමැත.සංදේශ අංකය 19/2633/118/010-II |
| 2 | මොණරාගල | 11,068 | 21,766.57 | 180,407,646.00 | |
| 3 | මඩකලපුව | 2,690 | 1,770.90 | 19,232,126.00 | |
| 4 | හම්බන්තොට | 30 | 20.64 | 178,092.00 | |
| 5 | රත්නපුර | 68 | 11.77 | 437,978.00 | |
| 6 | බදුල්ල | 7,568 | 14,166.39 | 105,663,733.90 | |
| 7 | මහව | 789 | 878.34 | 5,965,459.00 | |
| 8 | කුරුණෑගල | 34 | 4.81 | 68,086.43 | |
| 9 | පොළොන්නරුව | 80 | 76.75 | 915,705.00 | |
| 10 | මනම්පිටිය | 883 | 1,641.60 | 25,218,480.00 | |
| 11 | ත්‍රිකුණාමලය | 814 | 938.28 | 8,104,436.78 | |
| 12 | මහනුවර | 57 | 16.87 | 126,547.58 | |
| 13 | කිළිනොච්චිය | 1 | 2.50 | 15,300.00 | |
| 14 | පුත්තලම | 96 | 99.95 | 1,234,225.50 | |
| 15 | යාපනය | 4 | 1.19 | 47,500.00 | |
| | **එකතුව** | **38,859** | **60,996.56** | **574,502,162.19** | |

ඒ අනුව 2019 අවසන් වන විට 2018/19 මහ කන්නයේ සියළු වගා හානි සඳහා වන්දි මුදල් ගණනය කිරීම් සිදු කර අවසන් කරන ලදී.

එසේම වගා රක්ෂණයට අමතරව සෙසු රක්ෂණ යටතේ ඉදිරිපත් වූ වන්දි ඉල්ලිම් සඳහා සාමාන්‍ය පරිදි වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කර ඇත. ඒ පහත පරිදි වේ.

**පශු රක්ෂණය**

පශු රක්ෂණය යටතේ 2019 වර්ෂය තුලදී සතුන් 2800 ක් රක්ෂණය කරන ලද අතර එමගින් උපයා ඇති රක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 7.7 ක් වේ . පහත සඳහන් පරිදි රක්ෂණ වාරික අය කිරීමට කටයුතු කරන ලදී.

එසේම පශු රක්ෂණය යටතේ 2019 වර්ෂය තුල වන්දි ගෙවීම් හි සාරාංශය පහත පරිදි විය.

**2019 වර්ෂයේ පශු රක්ෂණ වන්දි ගෙවීම් (ජන.-දෙසැ.)**

| මාසය | ගව | | එළු | | කේරළ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | මුළු මුදල (රු.) | සතුන් ගණන | මුළු මුදල (රු.) | සතුන් ගණන | මුළු මුදල (රු.) | සතුන් ගණන | මුළු මුදල (රු.) | සතුන් ගණන |
| ජනවාරි | 317,228.50 | 5 | - | | | | 317,228.50 | 5 |
| පෙබරවාරි | 502,477.50 | 6 | - | | | | 502,477.50 | 6 |
| මාර්තු | 187,000.00 | 4 | - | | | | 187,000.00 | 4 |
| අප්‍රේල් | 903,694.50 | 13 | 82,125.00 | 6 | | | 985,819.50 | 19 |
| මැයි | 308,125.00 | 7 | 11,745.00 | 1 | | | 319,870.00 | 8 |
| ජූනි | 436,937.00 | 7 | - | | | | 436,937.00 | 7 |
| ජූලි | 541,450.00 | 7 | 13,500.00 | 2 | | | 554,950.00 | 9 |
| අගෝස්තු | 457,937.50 | 6 | 13,950.00 | 3 | | | 471,887.50 | 9 |
| සැප්තැම්බර් | 301,962.50 | 5 | 12,120.00 | 1 | | | 314,082.50 | 6 |
| ඔක්තෝබර් | 92,208.00 | 2 | 4,500.00 | 1 | | | 96,708.00 | 3 |
| නොවැම්බර් | 376,584.00 | 7 | 72,000.00 | 4 | | | 448,584.00 | 11 |
| දෙසැම්බර් | 1,244,145.00 | 19 | 122,580.00 | 12 | | | 1,366,725.00 | 31 |
| **එකතුව** | **5,669,749.50** | **88** | **332,520.00** | **30** | **-** | **-** | **6,002,269.50** | **118** |

**සුවසෙත / හදිසි අනතුරු රක්ෂණය**

සුවසෙත රක්ෂණය යටතේ සැලකියයුතු වන්දි ප්‍රමාණයක් වාර්තා නොවූ අතර මුළු වන්දි ගෙවීම රුපියල් ලක්ෂයකට අඩු විය.හදිසි අනතුරු රක්ෂණය යටතේ වගකීම් පැන නැගී නොමැත.

**රක්ෂණ කටයුතු වල කාර්ය සාධනය ඉහල නැංවීම සඳහා අපේක්ෂා කරන ලද මධ්‍ය කාලීන ක්‍රියා මාර්ග පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරන ලදී.**

2019 වර්ෂය තුළදී 2019 යල කන්නයේ වගා හානි සඳහා වන්දි ගණනය කිරීම සඳහාද ජංගම වැඩසටහන් කිහිපයක් පැවැත්වූ අතර 2019.12.31 දින වන විට 2019 යල කන්නයට අදාල වගා හානි සඳහා වන්දි ගණනය කිරීම් වලින් 90% ක් ම එනම් ඉහල විභවතාවයක් සහිත සියලු දිස්ත්‍රික් හා කලාපයන්හි වගා හානි වන්දි ගණනය කිරීම් දෙසැම්බර් මාසය වන විට අවසන් කරන ලදී . ඒ අනුව ඉහත සඳහන් කර ඇති පරිද්දෙන් 2019 වර්ෂය තුළදී කන්න 03 එනම් 2018 යල, 2018/19 මහ සහ 2019 යල කන්න වලදී වගාවන්ට සිදු වූ හානි සඳහා වන්දි ගණනය කිරීම් සිදු කර මුදල් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

**ප්‍රතිරක්ෂණ කටයුතු**

2018 මැයි මාසය වන විට 2019 යල කන්නය සඳහා අවශ්‍ය වූ ප්‍රතිරක්ෂණ වැඩසටහන් ජාතික රක්ෂණ භාර අරමුදලින් සලසා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. එය පහත පරිදි වේ.

| | |
|---|---|
| වී ඇතුළු අනෙකුත් භෝග වර්ග හය (වී, බඩඉරිගු, අර්තාපල්, ලොකු ඵණු ,මිරිස්,සෝයා) වගා කර ඇති වගා වපසරිය (අක්කර - දල ) | 450,000 |
| ප්‍රකාශිත රක්ෂිත මුළු මුදල (රු.) | 1,232,876,701.00 |
| ප්‍රතිරක්ෂණය කළ මුදල (Excess of loss sum Insured) (රු.) | 873,796,276.00 |
| රක්ෂිතයාගේ සම්පූර්ණ රඳවා ගැනීම(Total Retention) (රු.) | 359,080,425.00 |
| ගෙවිය යුතු වාරිකය (MDP 80%) (රු.) | 148,380,848.00 |
| ආවරණය වන අවධානම | ගංවතුර, නියගය, වනඅලි, වෙනත් ස්වාභාවික ආපදා |

ඒ අනුව 2019 යල කන්නය සඳහා ජාතික රක්ෂණ වැඩසටහනට ඇතුලත් වන සියළු වගාවන් සඳහා ප්‍රතිරක්ෂණ පහසුකම්ද ජාතික රක්ෂණ භාර අරමුලින් ලබා ගෙන රක්ෂණ ආවරණය තහවුරු කර ගෙන ඇත.

2019 වර්ෂයේ අවසන් භාගයේ ක්‍රියාත්මක කරන ලද ඉදිරි රක්ෂණ කටයුතු කිරීම සඳහා මණ්ඩලීය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබාදීමට කටයුතු කර ඇත. වගා හානි වලට අදාල රාජකාරි වලට අමතරව සංශෝධනය කරන ලද චක්‍රලේඛයන්ට අනුකූලව අදාල ලේඛනයන්ද යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.

එසේම අනිවාර්ය වගා රක්ෂණය යටතේ  වන්දිලාභීන් ආවරණය වන පරිදි හදිසි අනතුරු රක්ෂණ ඔප්පුවක් සකස් කරන ලදී.එම රක්ෂණ ඔප්පුව 2019/20 මහ කන්නයේ සිට නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

එසේම උක් වගා රක්ෂණය කිරීම සඳහා සකස් කරන ලද වක්‍රලේඛ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එම යෝජනා ක්‍රමයද 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

තවද 2019/20 සහ 2020 යල කන්නය සඳහා රක්ෂණය කරන වගාවන්ට අදාලව ප්‍රතිරක්ෂණ පහසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලු වාර්තා සකස් කර තාක්ෂණ කමිටුවේ නිර්දේශය අමාත්‍යාංශ ප්‍රසම්පාදන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.

එසේම මණ්ඩලයේ සමස්ථ කාර්යමණ්ඩලය සඳහා ලබා දීමට නියමිත දිරි දීමනා ක්‍රමවේදය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය සැපයීමට කටයුතු කරන ලදී.

# විශ්‍රාම වැටුප් අංශය

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## සහ

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත මඟින් ආරම්භ කරන ලද ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට 2019 වර්ෂය වන විට දායක වී ඇති මුළු දායකයින් සංඛ්‍යාව 959,254 කි. 2019 වර්ෂය වන විට මෙම යෝජනා ක්‍රමය මඟින් ප්‍රතිලාභ ලබන ගොවීන් සංඛ්‍යාව 159,425 ක් වූ අතර ඒ සඳහා රු.මි. 3,164,343,659 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී.

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත මඟින් සලසා ඇති ප්‍රතිපාදන අනුව වැඩි වයස් කාණ්ඩවලට අයත් වයස අවුරුදු 60 සම්පූර්ණ කල පසු ලැබිය යුතු විශ්‍රාම වැටුප රු. 200ක් වුව ද මේ සම්බන්ධයෙන් අවස්ථා 02 ක දී ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ලැබිය යුතු විශ්‍රාම වැටුප රු. 1000 දක්වා වැඩි කිරීම, විශ්‍රාමිකයා මිය ගිය දින සිට විශ්‍රාමිකයා ජීවත්ව සිටියේ නම්, විශ්‍රාමිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප් ගෙවීම, වයස අවුරුදු 46 සිට 59 දක්වා වූ වයස් කාණ්ඩවලට අයත් පුද්ගලයින්ට මෙම යෝජනා ක්‍රමයට දායක වීමට පනත මඟින් සලසා තිබූ අවුරුදු 02ක කාල සීමාව 2007 වර්ෂය දක්වා දීර්ඝ කිරීම යන හේතු සාධක මත මෙම යෝජනා ක්‍රමයේ අරමුදල 2010 වර්ෂයේ මැදභාගය වන විට ශූන්‍ය විය. මෙම හේතුව මත 2011 දෙසැම්බර් මස දක්වා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සහ මණ්ඩලය මඟින් පවත්වාගෙන ගිය වෙනත් අරමුදල් යොදා ගනිමින් 2011 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් ගෙවීම් කරන ලදී. කෙසේ වුව ද අරමුදල් සම්පාදනය නොවීම මත 2012 වර්ෂයේ ජනවාරි මස සිට 2013 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් ගෙවීම අකර්මණ්‍ය විය. එහෙත්, මරණ හා බෙලහීන දීමනා ලාභීන්ට එම දීමනාව අඛණ්ඩව ගෙවන ලදී.

මෙම යෝජනා ක්‍රමයේ ඇතිව තිබූ මූල්‍ය අර්බුදයට තිරසාර විසඳුමක් ලබා දී යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිසංවිධානයන් ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 අයවැය යෝජනා අනුව වැඩි ප්‍රතිලාභයක් සහිතව මෙම යෝජනා ක්‍රමය නව යෝජනා ක්‍රමයක් වශයෙන් නීතිගත කිරීමටත්, 2014 වර්ෂයේ සිට නව යෝජනා ක්‍රමයට අනුරූප වන පරිදි වැඩි ප්‍රතිලාභයක් සහිතව විශ්‍රාම වැටුප් ගෙවීම නැවත ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය පියවර ගන්නා ලදී.

2019 වර්ෂය අවසානය වන විට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වර්තමාන වගකීම රුපියල් බිලියන 70.2 ක් වේ. මෙම වගකීමට මුහුණ දීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ගොඩ නැඟීමට භාණ්ඩාගාර බැඳුම්කර ලබා දීම සඳහා ගත් තීරණයට අනුව 2015 අයවැය මඟින් බිලියන 5 ක අරමුදල් ලබා දීමට යෝජනා වුව ද එම මුදල් මණ්ඩලය වෙත නොලැබුණි. සෑම වර්ෂයකම විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රාජ්‍ය අයවැය ලේඛනය මඟින් වෙන් කරනු ලැබේ.

## ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම - 2019

| අනු අංකය | දිස්ත්‍රික් කාර්යාලය | විශ්‍රාම වැටුප් ලබන දායකයින් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.) |
|---|---|---|---|
| 1 | අම්පාර | 4,063 | 77,681,691 |
| 2 | අනුරාධපුරය | 7,778 | 142,708,996 |
| 3 | බදුල්ල | 6,678 | 131,643,006 |
| 4 | මඩකලපුව | 1,160 | 21,945,811 |
| 5 | කොළඹ | 5,311 | 111,843,923 |
| 6 | ගාල්ල | 14,237 | 309,690,031 |
| 7 | ගම්පහ | 11,244 | 228,113,535 |
| 8 | හම්බන්තොට | 8,946 | 168,183,184 |
| 9 | යාපනය | 2,554 | 51,472,113 |
| 10 | කළුතර | 8,712 | 183,688,458 |
| 11 | මහනුවර | 16,098 | 327,165,961 |
| 12 | කෑගල්ල | 9,947 | 191,983,422 |
| 13 | කුරුණෑගල | 19,345 | 366,150,541 |
| 14 | මන්නාරම | 95 | 1,493,470 |
| 15 | මාතලේ | 4,874 | 91,720,094 |
| 16 | මාතර | 10,055 | 207,387,964 |
| 17 | මොනරාගල | 5,404 | 103,288,047 |
| 18 | මුලතිව් | 137 | 2,900,208 |
| 19 | නුවරඑළිය | 3,103 | 61,540,228 |
| 20 | පොළොන්නරුව | 5,140 | 101,915,142 |
| 21 | පුත්තලම | 5,557 | 107,065,687 |
| 22 | රත්නපුරය | 7,496 | 146,562,300 |
| 23 | ත්‍රිකුණාමලය | 914 | 17,867,073 |
| 24 | වවුනියාව | 577 | 10,332,774 |
| | **එකතුව** | **159,425** | **3,164,343,659** |

- කිලිනොච්චි දිස්ත්‍රික්කයට අදාළ විශ්‍රාම වැටුප් ගෙවීම් වවුනියා දිස්ත්‍රික්කය හරහා කරනු ලබයි.

## මරණ පාරිතෝෂික හා බෙලහීන ගෙවීම

## 2019 ජනවාරි - දෙසැම්බර්

| අනු අංකය | දිස්ත්‍රික් කාර්යාලය | මරණ සංඛ්‍යාව | ගෙවූ මුදල (රු) | බෙලහීන සංඛ්‍යාව | ගෙවූ මුදල (රු) | මරණ / බෙලහීන මුළු සංඛ්‍යාව | මුළු මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගාල්ල | 22 | 393,837 | 2 | 59,759 | 24 | 453,596 |
| 2 | මාතර | 12 | 204,217 | 1 | 38,497 | 13 | 242,714 |
| 3 | හම්බන්තොට | 22 | 404,746 | | | 22 | 404,746 |
| 4 | මොනරාගල | 22 | 454,084 | | | 22 | 454,084 |
| 5 | ගම්පහ | 14 | 255,626 | | | 14 | 255,626 |
| 6 | බදුල්ල | 10 | 233,587 | | | 10 | 233,587 |
| 7 | රත්නපුරය | 7 | 146,887 | | | 7 | 146,887 |
| 8 | කළුතර | 13 | 277,524 | | | 13 | 277,524 |
| 9 | අම්පාර | 8 | 165,149 | | | 8 | 165,149 |
| 10 | කොළඹ | 5 | 73,686 | | | 5 | 73,686 |
| 11 | ඇඹිලිපිටිය | 2 | 44,452 | | | 2 | 44,452 |
| 12 | මනම්පිටිය | 2 | 44,233 | | | 2 | 44,233 |
| 13 | කෑගල්ල | 22 | 396,756 | 1 | 28,400 | 23 | 425,156 |
| 14 | මහනුවර | 17 | 390,740 | | | 17 | 390,740 |
| 15 | කුරුණෑගල | 27 | 531,751 | | | 27 | 531,751 |
| 16 | මහව | 22 | 451,596 | | | 22 | 451,596 |
| 17 | අනුරාධපුරය | 21 | 475,061 | | | 21 | 475,061 |
| 18 | පොළොන්නරුව | 16 | 356,668 | | | 16 | 356,668 |
| 19 | පුත්තලම | 7 | 139,772 | | | 7 | 139,772 |
| 20 | තඹුත්තේගම | 6 | 115,656 | | | 6 | 115,656 |
| 21 | නුවරඑළිය | 21 | 393,756 | | | 21 | 393,756 |
| 22 | යාපනය | 10 | 193,581 | | | 10 | 193,581 |
| 23 | ත්‍රිකුණාමලය | 1 | 24,020 | 1 | 26,782 | 2 | 50,802 |
| 24 | මාතලේ | 27 | 557,133 | | | 27 | 557,133 |
| 25 | වවුනියාව | 2 | 29,155 | | | 2 | 29,155 |
| | **එකතුව** | **338** | **6,753,673** | **5** | **153,438** | **343** | **6,907,111** |

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතින් ස්ථාපිත කර 1996 සැප්තැම්බර් 09 දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයේ රෙගුලාසි අනුව ක්‍රියාත්මක කරනු ලබයි. සමුද්‍රයෙහි හෝ කලපුවෙහි හෝ අභ්‍යන්තර ජලාශ වල මසුන් ඇල්ලීම හෝ මසුන් බෝකිරීමෙන් තම ස්වකීය ජීවනෝපාය සලසා ගන්නා ධීවර ජනතාවට ආරක්ෂණය සැලසීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි.

යෝජනා ක්‍රමයේ පරමාර්ථ

- තම මහලු වයසේදී හෝ අබලතාවයකදී ධීවරයන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ධීවරයකු මියගිය විට එම ධීවරයාගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- තම ජීවනෝපායෙහි දිගටම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරලීම.
- තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම සහ
- ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩිදියුණු කිරීම වන්නේය.

2019 වර්ෂය අවසන් වනවිට දායකත්වය ලබා දී ඇති මුළු ධීවරයින් සංඛ්‍යාව 69,049කි. විශ්‍රාම වැටුප්ලාභීන් 4,755 ක් සඳහා රු. 66,976,774 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී. මෙම ගෙවීම් තැපැල් කාර්යාල 390ක් මඟින් සිදු කරනු ලැබේ.

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳ වාර්තාව -2019

| අනු අංකය | දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | විශ්‍රාම වැටුප් ගෙවීම | |
|---|---|---|---|
| | | දායක සංඛ්‍යාව | මුදල රු. |
| 1 | කලුතර | 113 | 1,577,212.00 |
| 2 | ගාල්ල | 130 | 1,758,276.00 |
| 3 | මහවැව | 400 | 5,705,220.00 |
| 4 | මාතර | 313 | 4,357,248.00 |
| 5 | කොළඹ | 64 | 896,930.00 |
| 6 | තංගල්ල | 256 | 3,522,804.00 |
| 7 | පුත්තලම | 60 | 848,286.00 |
| 8 | මීගමුව | 607 | 8,353,903.00 |
| 9 | මඩකලපුව | 471 | 6,518,550.00 |
| 10 | ත්‍රිකුණාමලය | 109 | 1,676,448.00 |
| 11 | මන්නාරම | 438 | 5,924,880.00 |
| 12 | කල්මුනේ | 363 | 5,056,564.00 |
| 13 | මූලතිව් | 69 | 936,352.00 |
| 14 | කිලිනොච්චි | 368 | 5,697,014.00 |
| 15 | යාපනය | 931 | 13,226,513.00 |
| | **මිරිදිය ධීවර ජලාශ** | | |
| 1 | නුවරඑළිය | 7 | 92,004.00 |
| 2 | පොළොන්නරුව | 2 | 37,800.00 |
| 3 | රත්නපුර | 3 | 40,428.00 |
| 4 | මොණරාගල | - | - |
| 5 | කුරුණෑගල | 3 | 68,343.00 |
| 6 | අනුරාධපුර | 5 | 67,248.00 |
| 7 | මාතලේ | 6 | 81,576.00 |
| 8 | මහනුවර | 9 | 134,739.00 |
| 9 | කෑගල්ල | - | - |
| 10 | බදුල්ල | 5 | 68,604.00 |
| 11 | වව්නියා | 2 | 28,608.00 |
| 12 | මඩකලපුව මිරිදිය | 21 | 301,224.00 |
| | **එකතුව** | **4,755** | **66,976,774.00** |

## 2019.12.31 දිනට බඳවා ගැනීම්

| අනු අංකය | දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | වයස අනුව දායක සංඛ්‍යාව (අවු.) | | | | | | 2019 මූළු දායක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | 18-29 | 30-35 | 36-45 | 46-50 | 51-54 | 55-59 | |
| 1 | කළුතර | 1,213 | 721 | 772 | 197 | 105 | 59 | 3,067 |
| 2 | ගාල්ල | 1,082 | 676 | 840 | 221 | 118 | 95 | 3,032 |
| 3 | මහවැව | 3,253 | 1,702 | 2,036 | 613 | 256 | 240 | 8,100 |
| 4 | මාතර | 1,750 | 980 | 1,232 | 346 | 201 | 164 | 4,673 |
| 5 | කොළඹ | 576 | 360 | 478 | 140 | 63 | 38 | 1,655 |
| 6 | තංගල්ල | 2,514 | 1,389 | 1,629 | 412 | 201 | 169 | 6,314 |
| 7 | පුත්තලම | 2,167 | 1,156 | 1,222 | 255 | 107 | 61 | 4,968 |
| 8 | මීගමුව | 2,538 | 1,599 | 2,167 | 735 | 419 | 378 | 7,836 |
| 9 | මඩකලපුව | 2,248 | 1,390 | 1,630 | 555 | 272 | 266 | 6,361 |
| 10 | ත්‍රිකුණාමලය | 654 | 516 | 550 | 129 | 81 | 78 | 2,008 |
| 11 | මන්නාරම | 2,066 | 1,227 | 1,343 | 429 | 222 | 257 | 5,544 |
| 12 | කල්මුනේ | 1,565 | 1,109 | 1,515 | 479 | 244 | 207 | 5,119 |
| 13 | මුලතිව් | 88 | 79 | 141 | 50 | 27 | 44 | 429 |
| 14 | කිලිනොච්චි | 519 | 340 | 540 | 250 | 185 | 183 | 2,017 |
| 15 | යාපනය | 2,185 | 1,117 | 1,444 | 668 | 402 | 617 | 6,433 |
| | **මිරිදිය ධීවර ජලාශ** | | | | | | | |
| 1 | නුවරඑළිය | 29 | 28 | 47 | 7 | 1 | 3 | 115 |
| 2 | පොළොන්නරුව | 45 | 35 | 27 | 11 | 2 | 1 | 121 |
| 3 | රත්නපුර | 27 | 15 | 9 | 1 | 3 | - | 55 |
| 4 | මොණරාගල | 17 | 14 | 10 | 1 | - | - | 42 |
| 5 | කුරුණෑගල | 45 | 24 | 24 | 1 | - | 2 | 96 |
| 6 | අනුරාධපුර | 169 | 81 | 84 | 17 | 7 | 5 | 363 |
| 7 | මාතලේ | 31 | 14 | 23 | 5 | 2 | 3 | 78 |
| 8 | මහනුවර | 13 | 12 | 25 | 5 | 3 | 3 | 61 |
| 9 | කෑගල්ල | 1 | 1 | 2 | - | - | - | 4 |
| 10 | බදුල්ල | 59 | 33 | 33 | 3 | - | 3 | 131 |
| 11 | වව්නියා | 59 | 33 | 41 | 15 | 4 | - | 152 |
| 12 | මඩකලපුව මිරිදිය | 84 | 52 | 67 | 27 | 20 | 25 | 275 |
| | **මුළු එකතුව** | **24,997** | **14,703** | **17,931** | **5,572** | **2,945** | **2,901** | **69,049** |

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් 2019 ජනවාරි - දෙසැම්බර්**

| අනු අංකය | දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | මරණ පාරිතෝෂික ගෙවීම් | |
|---|---|---|---|
| | | දායක සංඛ්‍යාව | මුදල (රු) |
| 1 | කළුතර | | |
| 2 | ගාල්ල | | |
| 3 | මහවැව | 1 | 8,000.00 |
| 4 | මාතර | | |
| 5 | කොළඹ | | |
| 6 | තංගල්ල | 1 | 20,000.00 |
| 7 | පුත්තලම | | |
| 8 | මීගමුව | 1 | 15,000.00 |
| 9 | මඩකලපුව | 2 | 25,000.00 |
| 10 | ත්‍රිකුණාමලය | | |
| 11 | මන්නාරම | 6 | 83,000.00 |
| 12 | කල්මුනේ | 1 | 20,000.00 |
| 13 | මුලතිව් | | |
| 14 | කිලිනොච්චි | 5 | 54,000.00 |
| 15 | යාපනය | 7 | 103,000.00 |
| | **මිරිදිය ධීවර ජලාශ** | | |
| 1 | නුවරඑළිය | - | - |
| 2 | පොළොන්නරුව | - | - |
| 3 | රත්නපුර | - | - |
| 4 | මොණරාගල | - | - |
| 5 | කුරුණෑගල | - | - |
| 6 | අනුරාධපුර | - | - |
| 7 | මාතලේ | - | - |
| 8 | මහනුවර | - | - |
| 9 | කෑගල්ල | - | - |
| 10 | බදුල්ල | - | - |
| 11 | වව්නියා | - | - |
| 12 | මඩකලපුව මිරිදිය | - | - |
| | **එකතුව** | **24** | **328,000.00** |

**<u>මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම.</u>**

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයින් අතරින් මරණයට පත් වූ දායකයින් 24 දෙනෙකු සඳහා රු. 328,000 ක් මරණ පාරිතෝෂික වශයෙන් ගෙවා ඇත.

# පරිපාලන හා මානව සම්පත් අංශය

# පරිපාලන හා මානව සම්පත් අංශය - 2019

## කාර්ය මණ්ඩලය

2019.12.31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

## කාර්ය මණ්ඩල සංයුතිය

| සේවා ගණය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | | | | |
| HM | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | - |
| HM | අධ්‍යක්ෂ | 5 | 1 | 4 |
| කළමනාකරණ | | | | |
| MM | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | 45 | 30 | 15 |
| කනිෂ්ඨ කළමනාකරණ | | | | |
| JM | පරිපාලන නිලධාරි | 2 | - | 2 |
| | පද්ධති පරිපාලක | 1 | - | 1 |
| | මූල්‍ය නිලධාරි | 1 | - | 1 |
| | සැලසුම් නිලධාරි | 1 | - | 1 |
| ආශ්‍රිත නිලධාරි | | | | |
| ASS.O | සංවර්ධන නිලධාරි | 55 | 32 | 23 |
| | සැපයුම් නිලධාරි | 1 | - | 1 |
| | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | | | | |
| MA - Tech | ප්‍රවාහන සහකාර | 1 | 1 | - |
| | ලේකම් | 1 | 1 | - |
| | පොත් තබන්නා | 4 | 1 | 3 |
| | දෘඩාංග හා ජාලකරණ ශිල්පී | 1 | 1 | - |
| | කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය) | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | | | | |
| MA – Non Tech | කළමනාකරණ සහකාර | 220 | 156 | 64 |
| ප්‍රාථමික (ශිල්පීය) | | | | |
| PL - Skilled | රියදුරු | 38 | 26 | 12 |
| ප්‍රාථමික (ශිල්පීය නොවන) | | | | |
| PL - Non Skilled | කාර්යාල සහායක | 42 | 32 | 10 |
| | | **421** | **282** | **139** |

මණ්ඩලයේ කාර්යභාරය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් බඳවා ගන්නා තෙක් පවතින පුරප්පාඩු වලින් අත්‍යාවශ්‍යම තනතුරු කිහිපයක් සඳහා ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල සඳහා පහත සඳහන් තනතුරු වෙනුවෙන් කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් යොදවාගෙන ඇත.

| **කොන්ත්‍රාත් පදනම** | | |
|---|---|---|
| MM | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ | 5 |
| ASS.O | සංවර්ධන නිලධාරි | 2 |
| MA - NonTech | කළමනාකරණ සහකාර/ක්ෂේත්‍ර | 2 |
| PL - Non Skilled | කාර්යාල සහායක | 2 |
| | කාර්යාල සහායක(සනීපාරක්ෂක කම්කරු) | 2 |
| | **එකතුව** | 13 |
| | | |
| **දෛනික පදනම** | | |
| PL - Non Skilled | කාර්යාල සහායක | 01 |

## 2019.12.31 දිනට කාර්ය මණ්ඩල විශ්ලේෂණය

### ➢ කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී /පුරුෂ විශ්ලේෂණය

පුරුෂ -166

ස්ත්‍රී - 116

එකතුව - 282




### ➢ වයස් විශ්ලේෂණය

| වයස් කාණ්ඩය | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 56 - 60 | 46 | 16% |
| 51 - 55 | 39 | 14% |
| 46 - 50 | 35 | 12% |
| 41 - 45 | 53 | 19% |
| 36 - 40 | 60 | 21% |
| 31 - 35 | 24 | 9% |
| 30 ට අඩු | 25 | 9% |
| **එකතුව** | **282** | **100%** |



➢ **සේවා කාලය අනුව විශ්ලේෂණය**

| අවුරුදු | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 30 ට වැඩි | 51 | 18% |
| 26 - 30 | 15 | 5% |
| 21 - 25 | 15 | 5% |
| 16 - 20 | 11 | 4% |
| 15 ට අඩු | 190 | 67% |
| **එකතුව** | **282** | **100%** |




## 2019 වර්ෂය තුළ විශ්‍රාම යාම්, මිය යාම් හා සේවයෙන් ඉවත්වීම්

2019 වර්ෂය තුළදී මණ්ඩලයේ සේවයේ නියතු නිලධාරීන්ගෙන් පහත සඳහන් හේතූන් මත නිලධාරීන් 24 දෙනෙකු සේවයෙන් ඉවත්ව ගොස් ඇත.

| | තනතුරු නාමය | සංඛ්‍යාව | සේවය අවසන් කිරීමට හේතුව |
|---|---|---|---|
| 1 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 05 | විශ්‍රාම යාම |
| 2 | සහකාර අධ්‍යක්ෂ | 01 | විශ්‍රාම යාම |
| 3 | සංවර්ධන නිලධාරි | 04<br>02 | විශ්‍රාම යාම<br>සේවයෙන් ඉල්ලා අස්වීම |
| 4 | කළමනාකරණ සහකාර | 07<br>01<br>01 | විශ්‍රාම යාම<br>සේවයෙන් ඉල්ලා අස්වීම<br>මිය යාම |
| 5 | කාර්යාල සහයක | 01<br>01 | විශ්‍රාම යාම<br>සේවයෙන් ඉල්ලා අස්වීම |
| 6 | රියදුරු | 01 | සේවයෙන් ඉල්ලා අස්වීම |

## 2019 වර්ෂය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්

➢ බාහිර බඳවා ගැනීම් - කළමනාකරණ සහකාර -12
- රියදුරු - 02
- කාර්යාල සහයක - 07

එකතුව 21

➢ අභ්‍යන්තර බඳවා ගැනීම් - -

➢ උසස් වීම් - අධ්‍යක්ෂ - 01

**සේවක පුහුණු හා අධ්‍යාපන කටයුතු**

ඉන්දියාවේ හයිද්‍රාබාද් Integrated Management Strategies for major crop pests & Diseases in Developing Countries පුහුණු වැඩමුළුවට සහකාර අධ්‍යක්ෂ ඩබ්.ආර්.කුලරත්න මහතා සහභාගී කරවන ලදී.

ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැත්වුණු 6 වන ආසියාතික කෘෂි රක්ෂණ සැසිය සඳහා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඒ.එල්.ගාමිණී මහතා, නියෝජ්ය අධ්‍යක්ෂිකා එම්.එම්.සී.මන්තිලක මෙනවිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.පෙරේරා මහතා, සහකාර අධ්‍යක්ෂ එස්.එම්.යූ.ජී.එස්.කේ.සුභසිංහ මහතා, සහකාර අධ්‍යක්ෂ ඒ.එම්.එච්.යූ.වික්‍රමසිංහ මහතා, සහකාර අධ්‍යක්ෂ සතිෂ් කුමාර මහතා යන නිලධාරි මහත්ම/මහත්මීන් 07 දෙනෙකු සහභාගී කරවීමට කටයුතු කරන ලදී.

ඉන්දියාවේ කේරලයේ පැවති Production & post – Harvest Technology in Agricultural Crops පුහුණු වැඩමුළුවට සහකාර අධ්‍යක්ෂිකා ඩී.එස්.ආර්. හෙට්ටිආරච්චි මිය සහභාගී කරවන ලදී.

ඉන්දියාවේ පැවති Climate Smart Agriculture පුහුණු වැඩමුළුවට සහකාර අධ්‍යක්ෂ ඊ.එම්.නීල් බණ්ඩාර මහතා සහ සහකාර අධ්‍යක්ෂ චන්දන කොඩිප්පිලි මහතා සහභාගී කරවන ලදී.

ඉන්දියාවේ මුම්බායි නුවර පැවති පැවැත්වූ Agriculture Insuretech Forum සඳහා සභාපති සුමිත් වර්ණකුලසූරිය මහතා අධ්‍යක්ෂ ජනරාල් කේ.ඩී.පී.ආර්.වීරසිංහ මහතා, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ඩී.කේ. දිසානායක මිය හා සංවර්ධන නිලධාරි ආර්.ඒ.අයි.යූ.ධර්මරත්න සමරකෝන් මිය සහභාගී විය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් පැවැත්වූ ලැබූ පරිගණක ආශ්‍රිත බදු ගෙවීමේ ක්‍රමවේදය සම්බන්ධව එක් දින සම්මන්ත්‍රණයක් සඳහා සහකාර අධ්‍යක්ෂිකා දිනුෂා ප්‍රියදර්ශනී මිය සහභාගී කරවන ලදී.

**සේවක සුභසාධනය**

වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, යතුරු පැදි හිමි නිලධාරීන්ට යතුරුපැදි ණය ලබාදීම, මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා උදේ, සවස තේ සැපයීමේ වැඩපිළිවෙල පෙර වර්ෂයේ දී මෙන් මෙම වර්ෂය තුළ ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

**<u>සැපයුම් අංශය</u>**

මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රම වලට අදාළ පහත ලිපිලේඛන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් බාහිරින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.

**තෙවන පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ** - තෙවන පාර්ශව අයදුම්පත්, තෙවන පාර්ශව කුවිතාන්සි පොත්, තෙවන පාර්ශව ආවරණ පොත් සහ තෙවන පාර්ශව කාඩ්පත්

**වගා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ** - වගා රක්ෂණ අයදුම්පත්‍ර සහ හානි වාර්තා කිරීමේ ලේඛන

**ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ -** ගොවි විශ්‍රාම ගෙවීමේ කාඩ්පත්, ගොවි විශ්‍රාම වැටුප් හඳුනාගැනීමේ කාඩ්පත්

**ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ** - ධීවර විශ්‍රාම වැටුප් ගෙවීමේ පොත්, ධීවර විශ්‍රාම වැටුප් හඳුනාගැනීමේ කාඩ්පත්

**මූල්‍යමය කටයුතු සඳහා යොදා ගන්නා -** පොදු කුවිතාන්සි පොත්

මීට අතිරේකව ප්‍රධාන කාර්යාලයට හා දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය පොදු 35, නිවාඩු ඉල්ලුම් පත්‍ර, පශු රක්ෂණ අයදුම්පත්, පශු රක්ෂණ ඔප්පු, සුවසෙත අයදුම්පත්, සුවසෙත ඔප්පු හා ප්‍රවාහන රාජකාරි සඳහා අවශ්‍ය ලිපි ලේඛන මණ්ඩලීය ඩුප්ලෝ මුද්‍රණ යන්ත්‍රය මඟින් මුද්‍රණය කිරීම ද සිදු කරන ලදී.

දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුව කටයුතු කළ අතර, ඒ අනුව රත්නපුර, අම්පාර, කුරුණෑගල, ගාල්ල, කළුතර, අනුරාධපුර, තඹුත්තේගම යන දිස්ත්‍රික් කාර්යාල සඳහා කාර්යාල උපකරණ (මේස, පුටු, කබඩ්) මිලදී ගැනීම ද සිදු කරන ලදී.

ධීවර විශ්‍රාම වැටුප් අංශය සඳහා නව Server යන්ත්‍රයක් මිලට ගැනීම සිදු කළ අතර මණ්ඩලයේ රියදුරු, කාර්යාල කාර්ය සහයක තනතුරු දරණ සේවකයින් වෙත 2019 වසරට හිමි නිල ඇඳුම් ලබා දීමට හැකි විය.

ප්‍රධාන කාර්යාලයේ අංශවලින් ඉල්ලුම් කරන ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කරමින් මිලට ගෙන ගබඩාව වෙත ලබාදීම සිදුකරන ලදී.

**<u>කාර්යාල ගොඩනැගිලි</u>**

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මෙම වසර තුල දී ද නො:117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ලදී. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 30 ක් පවත්වාගෙන යන අතර, මින් මණ්ඩලයට අයත් ගොඩනැගිලි සංඛ්‍යාව 06කි. අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල මාසික කුලී පදනම මත රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි තුළ තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ.

# අභ්‍යන්තර විගණන අංශය

## අභ්‍යන්තර විගණන අංශය - 2019

2019 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාත්මක රක්ෂණ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා එක් එක් අංශ හා දිස්ත්‍රික් කාර්යාල අනුව පිළියෙල කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව අභ්‍යන්තර විගණන අංශයේ සීමිත මානව සම්පතෙහි සහකාර අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන, විගණන නිලධාරී වැ.බ සහ සංවර්ධන නිලධාරී - විගණන දායකත්වය හා එක් පුහුණු නිලධාරිනියකගේ සේවය සහිතව 2019 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන පරීක්ෂණ 23ක් ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශ සහ භූගෝලීය මට්ටමින් ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික් කාර්යාල 27 පදනම් කොටගෙන සිදු කරන ලදී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා පවතින කෘෂිකාර්මික අවදානම් කළමණාකරණය කිරීමේ අරමුණ මූලික කොටගෙන එක් එක් අංශ හා දිස්ත්‍රික් කාර්යාල වල කටයුතු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණාත්මක භාවය, නිවැරදිතාවය හා ඒවායේ ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා පහත එක් එක් අංශ යටතේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී.

පාලන අංශය ආවරණය වන පරිදි අය නොවන ආපදා ණය පරීක්ෂාව, වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම් පරීක්ෂාව, විනයානුකූල කටයුතු කිරීම් පරීක්ෂාව, සේවක වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම පරීක්ෂාව - 2019 යන ක්ෂේත්‍ර යටතේ විගණන පරීක්ෂණ සිදු කර ඇත.

මුදල් අංශය ආවරණය වන පරිදි ජංගම නොවන වත්කම් පිළිබඳ තහවුරු කරගැනීම, ගිණුම් අංක 100-170-112349 අතිරේක භෝග වගාරක්ෂණ රැස්කිරීමේ ගිණුම -බැංකු සැසඳුම් පරීක්ෂාව, ගෙවිය යුතු වියදම් හා උපචිත වියදම් පරීක්ෂාව - 2018 මුල්‍ය ප්‍රකාශන, ගොවි විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම (ගිණුම්අංක 014-100-180-112344) මුදල් පොත් හා බැංකු සැසඳුම් පරීක්ෂාව, දිස්ත්‍රික් කාර්යාලීය රැස් කිරීමේ ගිණුම පරීක්ෂාව (ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය) මිශ්‍ර අත්තිකාරම් පරීක්ෂාව -2019, සුළු මුදල් ශේෂ පරීක්ෂාව - 2019 දෙසැම්බර් යන ක්ෂේත්‍ර යටතේ විගණන පරීක්ෂණ සිදු කර ඇත.

රක්ෂණ අංශයේ කටයුතු වලට අදාළව උඳු වගා වන්දි ගෙවීම් පරීක්ෂාව - 2017 / 2018 මහ කන්නය (වව්නියාව/ අනුරාධපුරය), සුවසෙත රක්ෂණ යෝජනා ක්‍රමයේ වාර මුදල් ප්‍රේෂණය හා දිරිදීමනා ගෙවීම් පරීක්ෂාව හා මෙහෙයුම් අංශයට අදාළව, මාසික ඉදිරි වැඩසටහන් පිළියෙල කිරීම පරීක්ෂාව - ගාල්ල දිස්ත්‍රික්කය යන ක්ෂේත්‍ර යටතේ විගණන පරීක්ෂණ සිදු කර ඇත.

ගොවි විශ්‍රාම වැටුප් අංශය හා ධීවර විශ්‍රාම වැටුප් අංශය ආවරණය වන පරිදි ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - කලත්‍රයාට විශ්‍රාම වැටුප් ගෙවීම පරීක්ෂාව, මරණ පාරිතෝෂික හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම පරීක්ෂාව (2019) ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - කලත්‍රයාට විශ්‍රාම වැටුප් ගෙවීම යන විගණන පරීක්ෂණ කටයුතු සිදුකර ඇත.

දිස්ත්‍රික් කාර්යාල කටයුතු යටතේ මහව දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව සිදු කර ඇත.

අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් නියෝග කරන ලද විශේෂ පරීක්ෂණ යටතේ KT/P/06 අංක දරණ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව පරීක්ෂා කිරීම, තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමයේ වන්දි ගෙවීම් පරීක්ෂාව, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී සංවර්ධන නිළධාරී ටී.එම්.පියතිලක මහතා සතුව තිබූ රු. 248,550/- මණ්ඩලීය මුදල් පිළිබඳ පරීක්ෂණ සිදු කර ඇති අතර විශේෂ විමර්ශන යටතේ පුත්තලම දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්ත KP - 8723 දරණ මණ්ඩලීය මෝටර් රථය ධාවනය කිරීම සම්බන්ධව සිදු කර ඇති මූලික විමර්ශණ වාර්තාව හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලැබූ සංවර්ධන නිළධාරි ටී.එම්.පියතිලක මහතාගේ වැඩ තහනම් කිරීම සම්බන්ධ මූලික විමර්ශන වාර්තාව පිළියෙල කර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරගෙන යාම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කොට ඇත.

**<u>විගණන කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.</u>**

2019 වර්ෂයට අදාළව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් පවත්වා ඇති අතර විගණන කළමනාකරණ කමිටු සමාජිකයින් පහත පරිදි වේ.

**2019.02.26 දිනැති විගණන කළමණාකරණ කමිටු සමාජිකයින්**

| | |
|---|---|
| එච්.ඒ.එන්.එස්.කුමාර මහතා | කමිටු සභාපති - අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව |
| ඩබ්.එම්.එම්.බී.වීරසේකර මහතා | කමිටු සාමාජික - කොමසාරිස් ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| පී.එස්.කේ.ආර්. වීරකෝන් මහතා | කමිටු සාමාජික - අතිරේක ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය |

**2019.07.22 දිනැති විගණන කළමණාකරණ කමිටු සමාජිකයින්**

| | |
|---|---|
| එච්.එ.එන්.එස්.කුමාර මහතා | කමිටු සභාපති - අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව |
| ඩබ්.එම්.එම්.බී.වීරසේකර මහතා | කමිටු සාමාජික - කොමසාරිස් ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| නිමල්කා ඩයස් මහත්මිය | කමිටු සාමාජික - අතිරේක ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය |

**2019.11.07 දිනැති විගණන කළමණාකරණ කමිටු සමාජිකයින්**

වයි.දර්ශනි ද සිල්වා මහත්මිය කමිටු සභාපති - අධ්‍යක්ෂිකා - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

ඩබ්.එම්.එම්.බී.වීරසේකර මහතා කමිටු සාමාජික - කොමසාරිස් ජනරාල්

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

නිමල්කා ඩයස් මහත්මිය කමිටු සාමාජික - අතිරේක ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය

එහිදී වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කර ඇති විගණන පරීක්ෂණ වාර්තා ඇගයීම, රජයේ විගණන විමසුම් සමාලෝචනය කිරීම, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලට අදාල විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීම සිදු කර ඇත.

# සැලසුම් අංශය

## සැලසුම් අංශය - 2019

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර අනුව ක්‍රියාත්මක වෙමින්, සැලසුම් අංශය විසින් 2019 වර්ෂය තුළද, මණ්ඩලයේ සියලු අංශයන් සම්බන්ධීකරණය කොට අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සැලසුම් කිරීම, දත්ත හා සංඛ්‍යාත, කාල ක්‍රමානුගතව රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, නිගමන හා නිර්දේශ ඉදිරිපත් කිරීම, පර්යේෂණ කටයුතු සිදු කිරීම ආදී කර්තව්‍යන්හි නිරත විය.

### අංශ අතර සම්බන්ධීකරණය, දත්ත හා තොරතුරු රැස්කිරීම හා බාහිර ආයතන සම්බන්ධීකරණය

සැලසුම් අංශය විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සියලුම අංශ සමඟ මනා සබඳතාවයක් පවත්වා ගනිමින් මණ්ඩලීය මූලික ක්‍රියාවලීන්ට අදාලව එක් එක් අංශයන්ගේ දත්ත හා සංඛ්‍යාත තොරතුරු ක්‍රමානුකූලව රැස් කිරීම සිදු කරන ලද අතර එම සංඛ්‍යා ලේඛන විශ්ලේෂණය මඟින් මාසික, කාර්තුමය හා වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීමේ කටයුතු වල නිරත විය. තවද මහවැලි ,කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ සියලු බාහිර ආයතන සම්බන්ධීකරණය කරමින්, 2019 වර්ෂයට අදාලව එම ආයතන විසින් ඉල්ලුම් කරනු ලැබූ සියලු වාර්තා සකස් කර අදාළ ආයතන වලට කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන ලදී.

### ව්‍යාපෘති හා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම

සැලසුම් අංශයේ මූලිකත්වයෙන්, වගා හානි සඳහා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය තුළ හඳුනා ගත් ගැටළු හා අක්‍රමිකතා අවම කර ගනිමින්, හානි තක්සේරුව හා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය නිවැරදිව හා කාර්යක්ෂමව සිදු කිරීමේ අරමුණින් කෘෂි රක්ෂණය හා සම්බන්ධ නව තාක්ෂණයන් ශ්‍රී ලංකාව සඳහා යොදා ගත හැකි ආකාරයන් සම්බන්ධව ක්‍රියාත්මක කරනු ලබන පහත ව්‍යාපෘතීන්, 2019 වර්ෂය තුලදී සාර්ථකව ක්‍රියාත්මක විය.

- **දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ, ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහය ඇතිව ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය, 2019 වර්ෂය තුලදී හම්බන්තොට, කුරුණෑගල, අනුරාධපුර, අම්පාර, ගම්පහ, කිලිනොච්චි, වවුනියා හා මුලතිව් දිස්ත්‍රික්කයන් මූලික කර ගනිමින් ක්‍රියාත්මක විය.

ඒ අනුව 2018/19 මහ හා 2019 යල වගා කන්නයන් සඳහා වවුනියා, දිස්ත්‍රික්කය මූලික කරගනිමින් මෙම නව ක්‍රමවේදය පර්යේෂණ මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී. එම ක්‍රමවේදය යටතේ 2018/2019 මහ කන්නය සඳහා ගොවීන් 302කගේ අක්කර 994.42ක වූ වගා බිම් ප්‍රමාණයක් වෙනුවෙන් රු.7,294,271ක වන්දි මුදලක්ද , 2019 යල කන්නය සඳහා ගොවීන් 72කගේ අක්කර 90ක වගා බිම් ප්‍රමාණයක් වෙනුවෙන් රු.1,299,360ක වන්දි මුදලක් ද ගෙවීමට කටයුතු කරන ලදී.

තවද, හම්බන්තොට, කුරුණෑගල, අනුරාධපුර, අම්පාර, ගම්පහ, කිලිනොච්චි හා මුලතිව් යන දිස්ත්‍රික්ක සඳහා ද මෙම නව රක්ෂණ ක්‍රමවේදය යටතේ වන්දි ගණනය කිරීම් සිදු කරන ලද අතර, එම ප්‍රතිඵල, පවතින ක්‍රමවේදය යටතේ වන්දි ගෙවීම් දත්ත හා සංසන්දනය කරන ලද අතර එම රක්ෂණ නිෂ්පාදනයන් තවදුරටත් සුමට කිරීමේ කටයුතු සිදු කරන ලදී. තවද 2019/20 මහ කන්නය වෙනුවෙන් රක්ෂණ යෝජනා ක්‍රම සකස් කිරීම සඳහා මූලික දත්ත රැස් කිරීමේ කටයුතු, 2019 වර්ෂය අවසානයේ සිට ආරම්භ කරන ලදී.

- **කෘෂිකාර්මික දත්ත ඇතුළත් කළමනාකරණ දත්ත පද්ධතියක් (AIMS) සහිත cloud based වෙබ්/ජංගම යෙදවුමක් (Web/Mobile Application) ගොඩනැගීමේ වැඩසටහන**

උක්ත ව්‍යාපෘතිය හා ඒකාබද්ධව, කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් කෘෂිකාර්මික දත්ත ඇතුළත් කළමනාකරණ දත්ත පද්ධතියක් (MIS) සහිත cloud based වෙබ්/ජංගම යෙදවුමක් (Web/Mobile Application) ගොඩනැගීමේ වැඩසටහන, 2019 වර්ෂය තුළදී ද සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

එහිදී මෙම පරිගණක යෙදවුමෙහි ගොවීන්ගේ හා ගොවිබිම් වල දත්ත ඇතුලත් ප්‍රධාන දත්ත පද්ධතියක් සඳහා දත්ත ඇතුළත් කිරීම හා ක්ෂේත්‍ර හා යාය මට්ටමින් ගොවිබිම් සිතියම් ගත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය ගම්පහ සහ බදුල්ල දිස්ත්‍රික්කයන් මූලික කර ගනිමින් 2019 ජූනි මාසයේ සිට ආරම්භ කරන ලදී.

මෙහිදී එම දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තවද සිතියම් ගත කිරීමේ කටයුතු හා සම්බන්ධ වූ දත්ත ඇතුළත් කිරීමේ නිලධාරීන් උදෙසා මෘදුකාංගය සංවර්ධනය කිරීමේ ආයතනය වන GeoEdge ආයතනයේ සහභාගිත්වයෙන් පුහුණු වැඩමුළු පවත්වනු ලැබිය.

එසේ පුහුණු කරවන ලද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගේ සහය ඇතිව, දත්ත ඇතුළත් කිරීමේ නිලධාරීන් යොදා ගනිමින් ගොවිබිම් සිතියම් ගත කිරීමේ හා ගොවීන්ගේ හා ගොවිබිම් වල දත්ත ඇතුළත් කිරීම් කටයුතු 2019 වර්ෂය අවසානය තෙක්ම ක්‍රියාත්මක විය. 2020 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය හම්බන්තොට දිස්ත්‍රික්කය මූලික කර ගනිමින් ද ආරම්භ කිරීමට තීරණය වූ අතර, 2019 වර්ෂයේ අගභාගයේදී එහි මූලික අදියරෙහි සාකච්ඡා ආරම්භ කරන ලදී.

තවද මෙම ව්‍යාපෘතියට අදාල වෙබ් /ජංගම යෙදවුම සංවර්ධනය කිරීම් කටයුතු ද 2019 වර්ෂය පුරා ක්‍රියාත්මක විය. එහිදී GeoEdge ආයතන නිලධාරීන් සමඟ නිරන්තර රැස්වීම් පවත්වමින් මණ්ඩලයේ අවශ්‍යතාව හා ක්‍රියාවලියට ගැලපෙන පරිදි උක්ත යෙදවුමේ සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

- **කෘෂි රක්ෂණය සඳහා චන්ද්‍රිකා ඡායාරූප හා ඩ්‍රෝන තාක්ෂණයේ යෙදීම් පිළිබඳ පරීක්ෂා කිරීම**

2018 දෙසැම්බර් මස උතුරු පළාත තුළ ඇති වූ ගංවතුර හේතුවෙන් කිලිනොච්චි, මුලතිවු, යාපනය, වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි සිදුවූ වගා හානි වෙනුවෙන් කඩිනමින් වන්දි ගෙවීමට රජය විසින් ලබා දුන් උපදෙස් අනුව, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2019.01.05 වන දින සිට එම එක් එක් දිස්ත්‍රික්කයන්හි වගා හානි තක්සේරු කිරීම් කටයුතු ආරම්භ කරන ලදී.

මෙහිදී සැලසුම් අංශයේ මූලිකත්වයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අනෙකුත් දිස්ත්‍රික්කයන්හි නිලධාරීන් හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සම්බන්ධීකරණය කර ගනිමින් ක්ෂේත්‍ර මට්ටමින් නිරීක්ෂණය හා වගා හානි තක්සේරු කිරීමේ කටයුතු කඩිනමින් සිදු කරන ලදී.

# මූදලී අංශය

## මූල්‍ය සම්පිණ්ඩනය

2019 වර්ෂය තුල මණ්ඩලයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය රුපියල් මිලියන 652 ක ශුද්ධ ලාභයක් උපයාගත් අතර, මෙම වර්ෂය තුලදී උපයාගත් මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 878 කි.

2018 අය වැය යෝජනා අනුව අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමය එම භෝග වර්ග හය සඳහා මෙම වර්ෂයේදී ද ක්‍රියාත්මක කල අතර, ඒ තුලින් වී, බඩඉරිඟු, ලොකු ළූණු, අර්තාපල්, සෝයා, මිරිස් යන භෝග සඳහා අක්කරයකට රු. 40,000/- ක උපරිමයකට යටත්ව ආවරණය සැළසීමට කටයුතු කර ඇත.

කන්න කිහිපයක පටන් පැවති අධික නියං තත්වය හා කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ගෙන් සිදුවූ බලපෑම සළකා බලා වර්ෂය තුල ගොවීන්ගෙන් අයකරනු ලබන වාර මුදල ඔවුන්ගෙන් අය නොකර රජය විසින් ලබාදීමට තීරණය කල අතර, එම මුදල රුපියල් මිලියන 1739.88 කි.

මීට අමතරව වර්ෂය තුලදී අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රමවල සීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගත් අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව 53% ක වර්ධනයකි.

2019 වර්ෂය තුල මණ්ඩලයේ අනිවාර්ය වගා රක්ෂණ වන්දි වගකීම රුපියල් මිලියන 2155 ක් පමණ වී ඇත.

2019 වර්ෂය තුලදී, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මගින් ගොවීන් 159,425 ක් සඳහා රුපියල් මිලියන 3217 ක ශුද්ධ මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවීම් කල අතර, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුල ධීවරයින් 4,755 කට රුපියල් මිලියන 63.3 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී.

# පෙර විසර ජනක මූල්‍ය තොරතුරු

## ලාභදායීත්වය

- **කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**




| | 1<br>2015 | 2<br>2016 | 3<br>2017 | 4<br>2018 | **5**<br>**2019** |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ලාභය (රු.මි.) | 39.90 | 377.70 | 80.90 | 1,144.70 | **878.00** |
| ශුද්ධ ලාභය (රු.මි.) | 8.70 | 355.80 | 42.30 | 921.00 | **652.30** |

2019 වර්ෂය තුල කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය රුපියල් මිලියන 652.3 ක ශුද්ධ ලාභයක් උපයාගත් අතර, එය 2018 වර්ෂයට සාපේක්ෂව 29.18% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම තත්වයට ප්‍රධානතම හේතු සාධකය වූයේ 2019 වර්ෂය තුලදී හඳුන්වාදුන් අනිවාර්ය වගා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ භෝග වර්ග 06 ක් සඳහා වාරික මුදල් රජය විසින් ලබාදීමේදී පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වාරමුදලක් ලබා දීමයි. ඒ අනුව රාජ්‍ය ප්‍රතිපාදන වශයෙන් මණ්ඩලයට රුපියල් මිලියන 1,739.88 ක මුදලක් මේ සඳහා වෙන් කල අතර, මෙම තත්වය හේතුකොට ගෙන 2019 වර්ෂය තුල මණ්ඩලයේ මුළු රක්ෂණ ආදායම රුපියල් මිලියන 2038 ක් වූ අතර, එය 2018 වර්ෂයට සාපේක්ෂව 17.9% ක අඩුවීමකි. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ අනිවාර්ය භෝග වගා රක්ෂණය සඳහා අනුමත වාර මුදල් ප්‍රමාණය අඩුවීමයි.

මීට අමතරව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළු අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රමයන් පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කල අතර,

එම රක්ෂණ යෝජනා ක්‍රමයන්ගෙන් 2019 වර්ෂය තුලදී මණ්ඩලය ඉපයූ ආදායම රුපියල් මිලියන 237.4 ක් වූ අතර, එය 2018 වර්ෂයට සාපේක්ෂව 53% ක වර්ධනයකි. මේ අනුව 2019 වර්ෂය තුල මණ්ඩලයට සියළුම රක්ෂණ යෝජනා ක්‍රමයන්ගේ අපේක්ෂා කල ප්‍රගතිය ළඟාකර ගැනීමට හැකිවී ඇත.

- **ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය**




| | 1<br>2015 | 2<br>2016 | 3<br>2017 | 4<br>2018 | **5**<br>**2019** |
|---|---|---|---|---|---|
| ආදායම (රු.මි.) | 166.00 | 221.60 | 208.40 | 211.90 | **233.40** |
| මෙහෙයුම් වියදම (රු.මි.) | 2,432.00 | 2653.00 | 2,679.00 | 3,114.00 | **3,271.00** |

2014 වර්ෂයේ හඳුන්වා දුන් නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනුව 2019 වර්ෂය තුලදී ගොවීන් 159,425 කට රුපියල් මිලියන 3,217 ක් වූ ශුද්ධ විශ්‍රාම වැටුප් ගෙවීමක් සිදු කර ඇත. මෙම වර්ෂය තුල ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මුළු මෙහෙයුම් වියදම රුපියල් මිලියන 3,271 ක් වූ අතර, පෙර වර්ෂයේ මෙන්ම මෙම වර්ෂය තුලදී ද මහා භාණ්ඩාගාරය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 3,065 ක් ලබාදීමට කටයුතු කරන ලදී.

➢ **ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය**




| | 1<br>2015 | 2<br>2016 | 3<br>2017 | 4<br>2018 | **5**<br>**2019** |
|---|---|---|---|---|---|
| ආදායම (රු.මි.) | 35.60 | 60.50 | 56.10 | 69.70 | **53.00** |
| මෙහෙයුම් වියදම (රු.මි.) | 50.70 | 58.00 | 63.70 | 66.10 | **67.20** |

2019 වර්ෂය තුලදී රුපියල් මිලියන 63.3 ක විශ්‍රාම වැටුපක් ධීවරයින් වෙත ගෙවා ඇති අතර, ඒ සඳහා මණ්ඩලය සතු අරමුදල් යොදා ගන්නා ලදී. කෙසේ වුවද පවතින යෝජනා ක්‍රමය දිගින් දිගටම ක්‍රියාත්මක වුවහොත් වර්ෂ 2021 වන විට ධීවර විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය කරා ළඟාවනු ඇතැයි ගණන් බලා ඇත.

# සම්සථ යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන

2019

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනය**

**2019 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

(රු.)

| | යෝජනා ක්‍රමය 31.12.2019 දිනට | | | සමූහය | |
|---|---|---|---|---|---|
| | කෘ.ර.යෝ | ගො.වි.වැ.යෝ. | ධී.වි.වැ.යෝ | 19 දෙසැ: 31 | 18 දෙසැ: 31 |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ , පිරියත හා උපකරණ | 73,003,497 | 3,458,329 | 126,346 | 76,588,172 | 26,751,230 |
| **කල් පිරීම් දක්වා රඳවාගත් ආයෝජන** | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 1,055,048,183 | - | 1,055,048,183 | 1,053,000,000 |
| | **73,003,497** | **1,058,506,511** | **126,346** | **1,131,636,355** | **1,079,751,230** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 5,911,638 | 2,421,388 | 105,757 | 8,438,783 | 9,173,775 |
| ලැබිය යුතු දෑ | 2,014,704,148 | 19,331,022 | 564,385,973 | 1,167,872,706 | 258,315,948 |
| ලැබිය යුතු වාරික | 2,114,102,798 | 2,312,963 | - | 2,116,415,761 | 1,766,107,843 |
| තැන්පතු හා පූර්ව ගෙවීම් | 5,599,152 | - | - | 5,599,152 | 432,864,800 |
| අත්තිකාරම් | 682,399 | - | - | 682,399 | 671,432 |
| කල් පිරීම් දක්වා රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර | 1,878,869,760 | 167,887,669 | 133,916,455 | 2,180,673,884 | 1,266,281,729 |
| බැංකුවේ ඇති මුදල් | 51,451,163 | 2,225,694 | 1,007,607 | 54,684,464 | 42,598,615 |
| | **6,071,321,058** | **194,178,737** | **699,415,791** | **5,534,367,149** | **3,776,014,141** |
| **මුළු වත්කම්** | **6,144,324,556** | **1,252,685,248** | **699,542,137** | **6,666,003,503** | **4,855,765,371** |
| **ස්කන්ධ හා බැරකම්** | | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | | |
| කෘ.ගො.ර.ම සංචිත අරමුදල (හිඟ)/ අතිරික්ත | 1,940,626,652 | - | - | 1,940,626,652 | 1,288,286,716 |
| රජයේ ප්‍රධානය - ප්‍රාග්ධන | 5,291,886 | - | - | 5,291,886 | 9,956,994 |
| භාණ්ඩාගාරය දායක කළ මූලික ප්‍රාග්ධන | 50,000,000 | - | - | 50,000,000 | 50,000,000 |
| විශ්‍රාම වැටුප් අරමුදල | | (75,433,313,130) | (3,288,940,708) | (78,722,253,838) | (74,564,611,031) |
| මරණ පාරිතෝෂික අරමුදල | 1,028,673,843 | - | 28,062,615 | 1,056,736,458 | 983,522,560 |
| සමූහ රක්ෂණ දායකය | - | 1,000,000 | - | 1,000,000 | 1,000,000 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල | 7,049,619 | - | - | 7,049,619 | 5,752,936 |
| **අනෙකුත් අරමුදල්** | | | | | |
| කෘ.ගො.ර.ම සංචිත අරමුදල | 144,300,959 | 2,850,000 | - | 147,150,959 | 100,397,962 |
| කෙතට අරුණ අනිවාර්ය රක්ෂණය | 706,503,600 | - | - | 706,503,600 | 706,503,600 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 58,129,167 | - | - | 58,129,167 | |
| | **3,940,575,726** | **(75,429,463,130)** | **(3,260,878,093)** | **(74,749,765,497)** | **(71,419,190,263)** |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| විශ්‍රාම වැටුප් බැරකම | - | 70,252,869,112 | 3,915,569,738 | 74,168,438,850 | 70,099,092,600 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත රජයේ ප්‍රදාන | - | 1,081,488,000 | - | 1,081,488,000 | 1,081,488,000 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 38,564,523 | 54,643,566 | 2,103,156 | 95,311,245 | 82,135,787 |
| | **38,564,523** | **71,389,000,678** | **3,917,672,894** | **75,345,238,095** | **71,262,716,386** |
| **ජංගම බැරකම්** | | | | | |
| මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදන | 971,151 | 976,864 | 570,093 | 2,518,107 | 2,427,830 |
| පූර්ව වාරික ලැබීම් | 25,893,007 | - | - | 25,893,007 | 30,274,270 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 77,240,876 | 5,287,689,090 | 40,604,621 | 3,974,986,149 | 3,828,749,264 |
| උපචිත වියදම් | 27,735,648 | 4,481,746 | 1,572,623 | 33,790,017 | 10,312,161 |
| හානිපූරණය සඳහා ප්‍රතිපාදන | 2,033,343,626 | - | - | 2,033,343,626 | 1,140,475,723 |
| | **2,165,184,308** | **5,293,147,700** | **42,747,336** | **6,070,530,906** | **5,012,239,248** |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | **6,144,324,556** | **1,252,685,248** | **699,542,137** | **6,666,003,504** | **4,855,765,371** |

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

## විස්තීරණ ආදායම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනය

## 2019 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

(රු.)

| | යෝජනා ක්‍රමය 31.12.2019 දිනට | | | සමූහය | |
|---|---|---|---|---|---|
| | කෘ.ර.යෝ | ගො.වි.වැ.යෝ. | ධී.වි.වැ.යෝ | 19 දෙසැ : 31 | 18 දෙසැ : 31 |
| **ආදායම** | | | | | |
| රක්ෂණ වාරික | 298,553,291 | | | 298,553,291 | 282,791,000 |
| රක්ෂණ වාරික-භාණ්ඩාගාර දායක මුදල | 1,739,880,000 | | | 1,739,880,000 | 2,200,000,000 |
| වන්දි සඳහා ප්‍රදානය- ජා.ර.හා.අ. හෝග බද්ධ | 1,201,617,885 | | | 1,201,617,885 | 1,790,322,777 |
| වන්දි සඳහා ප්‍රදානය - භාණ්ඩාගාරය | - | | | - | - |
| විශ්‍රාම වැටුප් සඳහා ගොවි දායකත්වය | | 114,435,331 | 340,189 | 114,775,520 | 114,686,788 |
| පොළී ආදායම | 125,022,573 | 119,044,409 | 56,195,565 | 249,149,386 | 226,515,705 |
| | **3,365,073,749** | **233,479,740** | **56,535,754** | **3,603,976,082** | **4,614,316,270** |
| | | | | | |
| **අඩු කළා - මෙහෙයුම් වියදම** | | | | | |
| | | | | | |
| වන්දි - කෘ.ගො.ර.ම. | (2,173,895,081) | | | (2,173,895,081) | (2,969,626,308) |
| ප්‍රතිරක්ෂකගෙන් ආපසු අයකරගත හැකි හිමිකම් පෑම | 312,000,000 | | | 312,000,000 | |
| මෙහෙයුම් වියදම් | (48,756,894) | (1,206,876) | | (49,963,770) | (37,606,684) |
| විශ්‍රාම වැටුප් ගෙවීම් සහ කොමිස් | | (3,230,528,740) | (64,173,364) | (3,294,702,104) | (3,135,462,437) |
| සමූහ රක්ෂණ වාරිකය | | (19,016,134) | (1,769,100) | (20,785,234) | (21,629,620) |
| ප්‍රතිරක්ෂණ වාරිකය | (576,361,848) | | | (576,361,848) | (247,779,000) |
| දායක මුදල් ආපසු ගෙවීම සහ ශුද්ධ පොළිය | | (20,461,456) | (1,293,842) | (21,755,298) | (22,397,672) |
| | **(2,487,013,823)** | **(3,271,213,206)** | **(67,236,306)** | **(5,825,463,335)** | **(6,434,501,721)** |
| | | | | | |
| **මෙහෙයුම් අතිරික්තය / හිඟය** | **878,059,926** | **(3,037,733,466)** | **(10,700,551)** | **(2,221,487,253)** | **(1,820,185,451)** |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| ***එකතු කළා:*** | | | | | |
| විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රජයේ ප්‍රදානය | | 3,065,000,000 | | 3,065,000,000 | 2,725,000,000 |
| පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය | - | 138,000,000 | | 138,000,000 | 110,000,000 |
| පරිපාලන වියදම් සඳහා ගොවි දායකත්වය | | 1,387,845 | | 1,387,845 | 1,523,535 |
| පරිපාලන වියදම් සඳහා ප්‍රදානය - ධී.ව.වැ.යෝ. | | | 1,500,000 | 1,500,000 | 1,500,000 |
| අනෙකුත් ආදායම | 9,143,188 | 485,258 | - | 9,628,446 | 4,534,252 |
| | **9,143,188** | **3,204,873,103** | **1,500,000** | **3,215,516,291** | **2,842,557,787** |
| | | | | | |
| | **887,203,114** | **167,139,636** | **(9,200,551)** | **994,029,038** | **1,022,372,336** |
| **අඩු කළා : වියදම්** | | | | | |
| පරිපාලන වියදම් | (184,265,834) | (136,894,635) | (6,999,018) | (328,159,487) | (307,046,727) |
| මූල්‍ය හා අනෙකුත් | (750,367) | (89,229,107) | (7,500) | (38,873,813) | (46,092,620) |
| | **(185,016,201)** | **(226,123,741)** | **(7,006,518)** | **(367,033,300)** | **(353,139,347)** |
| | | | | | |
| **ශුද්ධ අතිරික්තය / (හිඟය)** | **702,186,913** | **(58,984,105)** | **(16,207,069)** | **626,995,738** | **669,232,989** |
| අඩු කළා : කෘ.ගො.ර.ම. සංචිත අරමුදල සඳහා ප්‍රතිපාදනය | (43,902,996) | | | (43,902,996) | (57,236,596) |
| **ප්‍රතිපාදනයෙන් පසු ශුද්ධ අතිරික්තය (හිඟය)** | **658,283,916** | **(58,984,105)** | **(16,207,069)** | **583,092,742** | **611,996,393** |
| | | | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | | | |
| පාරිතෝෂික ලාභ/ (අලාභ) | (5,943,980) | (12,983,523) | (121,859) | (19,049,362) | (233,325) |
| විශ්‍රාම වැටුප් බැරකමේ වැඩිවීම | | (3,744,663,516) | (324,682,735) | (4,069,346,251) | (3,580,835,413) |
| | **(5,943,980)** | **(3,757,647,039)** | **(324,804,594)** | **(4,088,395,613)** | **(3,581,068,738)** |
| | | | | | |
| **විස්තීරණ ආදායමේ ශුද්ධ අතිරික්තය / (හිඟය)** | **652,339,936** | **(3,816,631,143)** | **(341,011,663)** | **(3,505,302,871)** | **(2,969,072,345)** |

# 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන

# කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් | 2019.12.31<br>රු. ශත. | 2018.12.31<br>රු. ශත. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ,පිරියත හා උපකරණ | 1 | 73,003,497.29 | 25,413,661.28 |
| | | 73,003,497.29 | 25,413,661.28 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 2.1 | 5,911,638.92 | 5,096,698.44 |
| ලැබිය යුතු දෑ | 2.2 | 2,014,704,148.35 | 1,051,179,367.54 |
| ලැබිය යුතු වාරික | 2.3 | 2,114,102,797.50 | 1,763,743,052.09 |
| තැන්පතු හා පූර්ව ගෙවීම් | 2.4 | 5,599,152.20 | 432,864,799.56 |
| අත්තිකාරම් | 2.5 | 682,398.69 | 671,432.49 |
| කල් පිරීම දක්වා රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර | 2.6 | 1,878,869,760.35 | 1,091,921,920.45 |
| බැංකුවේ ඇති මුදල් | 2.7 | 51,451,163.43 | 38,970,089.05 |
| **මුළු ජංගම වත්කම්** | | 6,071,321,059.44 | 4,384,447,359.62 |
| - | | | |
| **මුළු වත්කම්** | | **6,144,324,556.73** | **4,409,861,020.91** |
| **ස්කන්ධ හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| භාණ්ඩාගාරය දායක කළ ආරම්භක ප්‍රාග්ධනය | | 50,000,000.00 | 50,000,000.00 |
| කෘ.ගො.ර.ම. සමුච්චිත අරමුදල | 3 | 1,940,626,652.11 | 1,288,286,716.11 |
| රජයේ ප්‍රදානය - ප්‍රාග්ධනය | 4 | 5,291,885.94 | 9,956,993.57 |
| කෘ.ගො.ර.ම. සංචිත අරමුදල | 5 | 144,300,958.65 | 100,397,962.35 |
| ගොවි මරණ පාරිතෝෂික අරමුදල | 6 | 1,028,673,843.49 | 956,861,044.93 |
| කාර්යය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල | | 7,049,618.74 | 5,752,936.35 |
| කෙතට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල | | 706,503,600.00 | 706,503,600.00 |
| ප්‍රාක්‍යාගණන සංචිතය | | 58,129,166.66 | - |
| | | 3,940,575,725.59 | 3,117,759,253.31 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 38,564,522.82 | 32,966,268.90 |
| | | 38,564,522.82 | 32,966,268.90 |
| **ජංගම බැරකම්** | | | |
| මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදන | | 971,151.30 | 916,058.80 |
| පූර්ව වාරික ලැබීම් | 7.1 | 25,893,006.64 | 30,274,270.03 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 7.2 | 77,240,875.60 | 72,831,230.60 |
| උපචිත වියදම් | 7.3 | 27,735,648.78 | 14,638,216.27 |
| හානිපූරණය සඳහා ප්‍රතිපාදන | 7.4 | 2,033,343,626.00 | 1,140,475,723.00 |
| **මුළු ජංගම බැරකම්** | | 2,165,184,308.32 | 1,259,135,498.70 |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | **6,144,324,556.73** | **4,409,861,020.91** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතා හා අනුකූල වේ

.....

මූල්‍ය අංශ ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ:

| | |
|---|---|
| ..... | ..... |
| අධ්‍යක්ෂ මණ්ඩල සමාජික | අධ්‍යක්ෂ මණ්ඩල සමාජික |
| කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**

**විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

**2019 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

| | | | 2019.12.31 | | 2018.12.31 |
|---|---|---|---|---|---|
| **ආදායම** | **සටහන්** | | **රු. ශත.** | | **රු. ශත.** |
| | | | | | |
| | | | | | |
| වාරික - රක්ෂණ | 8.1 | | 298,553,291.45 | | 282,790,999.84 |
| රක්ෂණ වාරික - භාණ්ඩාගාර දායකත්වය | | | 1,739,880,000.00 | | 2,200,000,000.00 |
| වන්දි සඳහා ප්‍රදානය - ජා.ර.හා.ර. -හෝග බද්ද | | | 1,201,617,885.00 | | 1,790,322,777.09 |
| පොළී | 8.2 | | 125,022,572.80 | | 125,396,022.36 |
| | | | | | |
| **මුළු ආදායම** | | | **3,365,073,749.25** | | **4,398,509,799.29** |
| | | | | | |
| **මෙහෙයුම් වියදම** | | | | | |
| | | | | | |
| වන්දි | 9.1 | | (2,173,895,081.29) | | (2,969,626,308.14) |
| ප්‍රතිරක්ෂණ වාරිකය | | | (576,361,848.14) | | (247,779,000.00) |
| ප්‍රතිරක්ෂකගෙන් ආපසු අයකරගත හැකි හිමිකම් පෑම | | | 312,000,000.00 | | |
| මෙහෙයුම් වියදම් | 9.2 | | (48,756,893.82) | | (36,372,562.80) |
| | | | | | |
| | | | **(2,487,013,823.25)** | | **(3,253,777,870.94)** |
| | | | | | |
| | | | | | |
| **මෙහෙයුම් අතිරික්තය / (හිඟය)** | | | **878,059,926.00** | | **1,144,731,928.35** |
| | | | | | |
| අනෙකුත් ආදායම් | 10 | | 9,143,187.78 | | 3,996,919.16 |
| | | | | | |
| | | | **9,143,187.78** | | **3,996,919.16** |
| | | | | | |
| | | | **887,203,113.78** | | **1,148,728,847.51** |
| **වියදම්** | | | | | |
| පරිපාලන වියදම් | 11 | | (184,265,833.87) | | (169,042,620.74) |
| | | | | | |
| මූල්‍ය සහ අනෙකුත් වියදම් | 12 | | (750,367.41) | | (690,340.26) |
| | | | | | |
| | | | | | |
| **මුළු වියදම්** | | | **(185,016,201.28)** | | **(169,732,961.00)** |
| | | | | | |
| **ශුද්ධ අතිරික්තය / (හිඟය)** | | | **702,186,912.50** | | **978,995,886.51** |
| | | | | | |
| කෘ.ගො.ර.ම. සංචිත අරමුදල සඳහා ප්‍රතිපාදනය | | | (43,902,996.30) | | (57,236,596.42) |
| **ප්‍රතිපාදනයෙන් පසු ශුද්ධ අතිරික්තය / (හිඟය)** | | | **658,283,916.20** | | **921,759,290.09** |
| | | | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | | | |
| පාරිතෝෂික ලාභ/ (අලාභ) | | | (5,943,980.20) | | (679,937.26) |
| | | | (5,943,980.20) | | (679,937.26) |
| **විස්තීරණ ආදායමේ ශුද්ධ අතිරික්තය / (හිඟය)** | | | **652,339,936.00** | | **921,079,352.83** |
| | | | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**
**2019 දෙසැම්බර් 31 දිනට ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය**

රු.

| | ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය | සමුච්චිත අතිරික්තය / හිඟය | කෘ.ගො.ර.ම සංචිත අරමුදල | ගොවි මරණ පාරිතෝෂිකය | කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය |
|---|---|---|---|---|---|---|
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **11,798,919** | **367,207,363** | **43,161,366** | **878,651,397** | **6,010,043** | **-** |
| වසර තුළ එකතු කිරීම් | 2,000,000 | - | 57,236,596 | 78,209,648 | (257,107) | - |
| රජයේ ප්‍රදානය | (3,841,926) | - | - | - | - | - |
| ශුද්ධ අතිරික්තය /(හිඟය) | | 921,079,353 | - | - | - | - |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **9,956,994** | **1,288,286,716** | **100,397,962** | **956,861,045** | **5,752,936** | **-** |
| වසර තුළ එකතු කිරීම් | - | - | 43,902,996 | 71,812,799 | 1,296,682 | - |
| ගොවි විශ්‍රාම වැටුප රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | (4,665,108) | - | - | - | - | - |
| ශුද්ධ අතිරික්තය /(හිඟය) | - | 652,339,936 | - | - | - | - |
| මෝටර් රථවලින් පැවරූ පිරිවැය | - | - | - | - | - | (58,832,592) |
| මෝටර් රථ සමුච්චිත ක්ෂය | - | - | - | - | - | 49,341,759 |
| මෝටර් රථවාහන වෙත පවරනු ලැබූ ප්‍රත්‍යාගණන වටිනාකම | - | - | - | - | - | 67,620,000 |
| | - | - | - | - | - | |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,291,886** | **1,940,626,652** | **144,300,959** | **1,028,673,843** | **7,049,619** | **58,129,167** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|
| | රු. ශත. | රු. ශත. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ශුද්ධ අතිරික්තය / (හිඟය) | 652,339,936.00 | 921,079,352.83 |
| **පහත දැ සඳහා ගැලපුම්** | | |
| ක්ෂයවීම් | 17,768,835.96 | 8,744,992.83 |
| කෘ.ගො.ර.අ. සංචිත අරමුදල සඳහා ප්‍රතිපාදනය | 43,902,996.30 | 57,236,596.42 |
| පාරිතෝෂික ලාභය/අලාභය | 5,943,980.20 | 679,937.26 |
| | **67,615,812.46** | **66,661,526.51** |
| දේපල, පිරියත, උපකරණ බැහැර කිරීම මත ලාභය/ අලාභය | - | (28,653.96) |
| විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 4,540,217.82 | 4,982,837.14 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | **724,495,966.28** | **992,695,062.52** |
| වට්ටෝරු භාණ්ඩවල (වැඩිවීම)/අඩුවීම | (814,940.48) | (681,994.95) |
| ලැබිය යුතු දැ (වැඩිවීම)/අඩුවීම | (963,524,780.81) | (67,807,577.36) |
| ලැබිය යුතු වාරික (වැඩිවීම)/අඩුවීම | (350,359,745.41) | (1,745,103,141.03) |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | 427,265,647.36 | (428,227,127.56) |
| අත්තිකාරම්හි (වැඩිවීම)/අඩුවීම | (10,966.20) | (1,098.80) |
| හානි පූරණය සඳහා ප්‍රතිපාදන වැඩිවීම/(අඩුවීම) | 892,867,903.00 | 719,475,723.00 |
| මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදන වැඩිවීම /(අඩුවීම) | 55,092.50 | 8,187.50 |
| පූර්ව වාරික අත්තිකාරම් වැඩිවීම/(අඩුවීම) | (4,381,263.39) | 24,733,486.97 |
| අනෙකුත් ගෙවිය යුතු දැ වැඩිවීම/(අඩුවීම) | 4,409,645.00 | (16,254,052.01) |
| උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම) | 13,097,432.51 | 6,123,532.40 |
| | **18,604,024.08** | **(1,507,734,061.84)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල්** | **743,099,990.36** | **(515,038,999.32)** |
| විශ්‍රාමික පාරිතෝෂිකය - ගෙවන ලද | (4,885,944.09) | (6,061,573.29) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **738,214,046.27** | **(521,100,572.61)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| වෛද්‍ය රක්ෂණ අරමුදල | 1,296,682.39 | (257,107.00) |
| ගොවි මරණ පාරිතෝෂික අරමුදල | 71,812,798.56 | 78,209,648.11 |
| වර්ෂය තුළදී ආයෝජන | (786,947,839.90) | 453,648,217.92 |
| දේපල, පිරියත සහ උපකරණ මිලයට ගැනීම | (7,229,505.30) | (3,591,379.15) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් උත්පාදන | - | 30,985.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින්ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(721,067,864.25)** | **528,040,364.88** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින්ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | - | 2,000,000.00 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | (4,665,107.63) | (3,841,925.64) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(4,665,107.63)** | **(1,841,925.64)** |
| **මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | **12,481,074.39** | **5,097,866.63** |
| **වසර ආරම්භයේදී මුදල් සහ මුදලට සමාන දෑ** | **38,970,089.05** | **33,872,222.42** |
| **වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ** | **51,451,163.44** | **38,970,089.05** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

## 1. පොදු ප්‍රතිපත්ති

### 1.1 වාර්තාකරණ අස්තිත්වය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (මෙහි මින් මතු "මණ්ඩලය" ලෙස සඳහන් කරනු ලබන) 1999 අංක 20 දරන පනතෙන් සංස්ථාගත කරන ලද අතර නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාරාම පාරේ අංක 117 දරන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

කෘෂිකාර්මික සහ උද්‍යාන භෝග සහ ඖෂධීය ශාක, පශු සම්පත්, ධීවර සහ වන විද්‍යාව, කෘෂිකාර්මික උපකරණ සහ මෙවලම් සහ කෘෂිකාර්මික උද්‍යාන විද්‍යාත්මක නිපැයුම් සහ ඖෂධීය ශාක, ධීවර සහ වනාන්තර නිෂ්පාදන ගබඩා කිරීම සහ සංරක්ෂණය ඇතුළුව කෘෂිකාර්මික රක්ෂණයේ මණ්ඩලය මූලිකවම නියැලී සිටියි. එසේම, කෘෂිකාර්මිකයන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ සැපයීම, සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ පොහොර රක්ෂණ කටයුතුවල සහ කෘෂිකාර්මිකයන්ට හිමි රථ වාහන සඳහා තෙවන පාර්ශවිය රක්ෂණ ආවරණ සැපයීමේ මණ්ඩලය නිරතව සිටියි. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි වෙනසක් සිදු නොවුණි.

### 1.3 පිළියෙල කිරීමේ පදනම

**(අ) අනුකූලතා ප්‍රකාශය**

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් සහ සංචිතවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම ගිණුම් ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) ප්‍රකාරව පිළියෙල කර ඇත.

**(ආ) මැණිම සඳහා පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණ කරනු ලබන අවස්ථාවන් හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

**(ඇ) සන්සන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම පිණිස සහ අන්තර් කාලසීමා සන්සන්දනීයභාවය වැඩිදියුණු කිරීම පිණිස, මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති විටිදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්ථන වසර සමග අනුකූල වනසේ සංසන්දනාත්මක මුදල් ප්‍රමාණ ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

**(ඈ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය**

මෙම මුදල් ප්‍රකාශන මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත්කර ඇත.

**(ඉ) තක්සේරු සහ තීරණ භාවිතය**

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර /.ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තීන්දු, තක්සේරු සහ උපකල්පන සිදුකිරීමට කළමණාකාරීත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවට වඩා වෙනස්විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරන ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම අදාළ කාලසීමාවට පමණක් බලපාන්නේ නම්, ඒවා පිළිගනු ලබන්නේ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇති කාලසීමාව තුළ වනඅතර ප්‍රවර්ථන හා යම් අනාගත කාලසීමාවන්ට එම ප්‍රතිශෝධනය බලපාන්නේ නම් ප්‍රතිශෝධන කාලසීමා හා අනාගත කාලසීමාවන් සඳහාද පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑම් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑම් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු අවිනිශ්චිතතා සහ තීරණාත්මක තීන්දු පිළිබඳ සැලකියයුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල අඩංගු කර ඇත.

**ඊ) ප්‍රවර්තන ව්‍යාපාරය (අඛණ්ඩ පැවැත්ම)**

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවැතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරීත්වය තක්සේරුවක් කර තිබේ. එබැවින්, ප්‍රවර්තන ව්‍යාපාරයක පදනමින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

## 2. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

### 2.1 දේපළ, පිරියත හා උපකරණ

**(අ) පිළිගැනීම සහ මැනීම**

දේපල, පිරියත හා උපකරණ අයිතම ප්‍රකාශ කර ඇත්තේ පිරිවැයට හෝ එකතු වූ ක්ෂය කිරීම් හා හානි අලාභ අඩුකොට සාධාරණ වටිනාකමටය.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ වටිනාකමේ සමුච්චිත හානිවීම් අඩුකර පිරිවැයටය. වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපළක, පිරියතක හෝ උපකරණයක සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනය කරනු ලැබීමට අවශ්‍ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස පිළිගැනීමෙන් ඉවත් කර නව කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම සහිතව අස්තිත්වය මගින් පිළිගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

රු. 26,313,350.60ක මුළු ඓතිහාසික පිරිවැයක් සහිත පූර්ණව ක්ෂයකරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුළත් කොට තිබේ.

**(ආ) පිරිවැය**

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහා වූ කිසියම් සෘජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරික්ෂාකිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

**(ඇ) ප්‍රත්‍යාගණනය**

වත්කමක් ලෙස පිළිගැනීමෙන් පසුව, සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැණිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි, කිසියම් තදනන්තර සමුච්චිත ක්ෂය සහ තදනන්තර සමුච්චිත හානි අලාභ අඩු කොට ප්‍රත්‍යාගණනය සිදුකළ දිනයට ප්‍රත්‍යාගණන වටිනාකමට දක්වා තිබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ වටිනාකම වාර්තාකරණ දිනයේදී එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම පිණිස තක්සේරු කිරීම් සිදුකරනු ලැබේ.

මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබූ එම වත්කමේම කිසියම් පූර්ව අඩුවීමක් හිලව් කරන්නේ නම් හැර ප්‍රත්‍යාගණන වටිනාකමේ කිසියම් වැඩිවීමක් ස්කන්ධයේ ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලැබේ. වටිනාකමේ අඩුවීමක්, ප්‍රත්‍යාගණන සංචිතයේ කළින් හඳුනාගනු ලැබූ වැඩිවීමක් ඉක්මවා යන විටදී ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. බැහැර කිරීමේදී, යම් ආශ්‍රි ප්‍රත්‍යාගණන සංචිතයක් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලබන අතර බැහැර කිරීම මත ලාබ හෝ අලාබ තීරණය කිරීමේදී ගිණුම්වලට ගනු නොලැබේ.

**(ඇ) ක්ෂයවීම්**

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 4% |
| රථ වාහන | 20% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| ප්‍රචාරක උපකරණ | 10% |
| හානි වැළැක්වීමේ උපකරණ | 10% |
| අස්වනු කැපීමේ උපකරණ | 10% |
| පා පැදි | 20% |
| මිනින්දෝරු උපකරණ | 10% |
| කිරුම් උපකරණ | 10% |
| සුඛසාධන උපකරණ | 10% |
| දුරකථන | 20% |
| පරිගණක | 20% |
| යතුරු පැදි | 20% |

## 2.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම අපේක්ෂා කරන්නේ නම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. -38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

පරිගණක මෘදුකාංග සරල රේඛීය ක්‍රමය මත වසර 5 ක කාලා සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.3 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය. මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම ද ඇතුළත්ය.

## 2.4 මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකම ධන ලෙසත්, ලාභ හෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ආරම්භයේදී ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිත කළ වත්කම් ඇතුළුව) ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය වත්කම හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩලය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත් කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක් මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ යම් බැඳියාවක්, වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇති විටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර වත්කම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

**(අ) ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්**

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා රඳවාගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් ලාභ සහ හෝ පාඩු හරහා සාධාරන වටිනාකමට මුල් පිළිගැනීම මත නම්කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කරගෙන ඇත්නම් ඒවා වෙළඳාම සඳහා රඳවාගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

(ආ) **ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබියයුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී ක්‍රමවේදයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතුකොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබියයුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබියයුතු දෑ, සේවක ණය, තැන්පතු අත්තිකාරම්, අනෙකුත් ලැබියයුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

**(ඇ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන**

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම්, මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇතිවිටදී, කල්පිරීම දක්වා රඳවා ගැනීම ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික මැනීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මනිනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ

අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ.

රජයේ සුරැකුම්පත්වල සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත.

**(ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික පිළිගැනීමට පසුව, ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර, අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ. විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ. ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට, අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

**2.5 මූල්‍ය වත්කම් හානිවීම**

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

**3. බැරකම් සහ ප්‍රතිපාදන**

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ.

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ.

### 3.1 හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදන

ගෙවීමට ඇති ඉල්ලුම් කර ඇති මුදල් සඳහා බැරකම භෝගයේ අවදානම් සාධක සහ රක්ෂිතයාගේ විෂය කරුණු මත පදනම්ව හඳුනාගනු ලැබේ. 2018 මූල්‍ය වසර සඳහා වන්දි ප්‍රතිපාදනය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

| **රක්ෂිත විෂයය** | **හානිපූරණ සඳහා ප්‍රතිපාදන (රු.)** |
|---|---:|
| කෙතට අරුණ | 2000,284,021.00 |
| පශු සම්පත් | 7,000,000.00 |
| සුවසෙත සහ කෘෂි උපකරණ | 500,000.00 |
| අතිරේක භෝග | 2,000,000.00 |
| චංචල දේපළ | 23,559,605.00 |
| | **2,033,343,626.00** |

**තෙවන පාර්ශවීය රක්ෂණ වන්දි සඳහා ප්‍රතිපාදන**

තෙවන පාර්ශවීය ප්‍රතිපාදනය හඳුනාගනු ලබන්නේ අනුගාමී වසර තුනක ආදායමින් 15% ක හරිත සාමාන්‍ය අනුපාතයටය. එම 15% අනුපාතයෙන් පිළිවෙලින් 7% ක්, 5%ක් සහ 3%ක් වත්මන් වසරේ ආදායම, පෙර වසරේ ආදායම සහ පෙර වසරට පෙර වසරේ ආදායම සඳහා සමානුපාතිකව වෙන් කරනු ලැබේ.

### 3.2 බොල් ණය සඳහා ප්‍රතිපාදන

අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ලෙස මුළු කාර්යය මණ්ඩල ණයෙන් 5% ක ප්‍රතිපාදනයක් සලසා ඇත.

### 3.3 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 19 ‘විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය’ අනුකූල වන පරිදි සියලු ස්ථීර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

### 3.4 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම්වනුයේ, ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ.

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

## 4. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

### 4.1 ආදායම

1. මණ්ඩලයේ ආදායම රක්ෂණ වාරික, භාණ්ඩාගාර බිල්පත්වලින් සහ සේවක ණය සඳහා පොළී ආදායම සහ අනෙකුත් විවිධ ආදායම් නියෝජනය කරයි .
2. සියලුම ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබ ඇත.
3. ගොවීන් වෙනුවෙන් සහනාධාරයක් ලෙස රක්ෂණ වාරික රජයෙන් ලැබී ඇත.
4. ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන ක්‍රමික පදනමක් මත ආදායම ලෙස පිළිගෙන ඇත.

### 4.2 ආදායම් පිළිගැනීම

1. රක්ෂණ වාරික ආදායම රක්ෂිතයේ කාලය මත පදනම්ව පිළිගනු ලැබේ .
2. ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර ආශ්‍රිත වියදම් සමග ගලපනු ලැබේ.
3. උපචිත ආදායම කාල පදනමකින් උපචිත වේ .

### 4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

මණ්ඩලය දරන ලද වියදම් වෙනුවෙන් ඊට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් හඳුනාගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ. වත්කමක පිරිවැය වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

### 4.4 වියදම

දරන ලද පිරිවැය සහ නිශ්චිත වියදම් අයිතම ඉපැයුම අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලැබේ. මණ්ඩලය පවත්වාගෙන යාම සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලු වියදම්, වසර සඳහා අතිරික්තය සකස් කිරීමේදී ආදායමට බැර කර ඇත.

අංක 401/4 2008.10.15 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම්

| **වියදම** | **අනුපාත** |
|---|---|
| වැටුප්, සේ.අ.අ, සේ.භා.අ | 50% |
| වෛද්‍ය වියදම් | 50% |
| උපදේශන ගාස්තු | 60% |
| සුබසාධනය | 50% |
| නිල ඇඳුම් | 50% |
| සංග්‍රහ | 60% |
| මුද්‍රණ | 60% |
| නෛතික ගාස්තු | 40% |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 60% |
| කුලී | 55% |
| දුරකථන | 55% |
| තැපැල් ගාස්තු | 40% |
| විදුලි | 55% |
| ගමන්, අතිකාල | 50% |
| ජල බිල්පත් | 55% |
| දෛනික වේතන | 50% |
| ආරක්ෂක කටයුතු | 75% |
| ප්‍රධාන කාර්යාලීය උපකරණ | 75% |
| වාහන නඩත්තුව | 57% |
| පරිගණක වියදම් | 75% |
| ඉන්ධන වියදම් | 68% |
| ලිපි ද්‍රව්‍ය | 50% |
| ගොඩනැගිලි නඩත්තුව | 55% |
| ප්‍රචාරය සහ පුහුණුව | 80% |

### 4.5 අතිරික්තය

සියලු බැරකම්, බොල් සහ අඩමාන ණය සහ දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමෙන් පසුව අතිරික්තය ගණනය කරනු ලැබේ .

### 4.6 සංචිත අරමුදල

හදිසි අවස්ථා සංචිත අරමුදලක් 2002 වසරේදී පිහිටවූ අතර ප්‍රතිපත්තිය වනුයේ මෙහෙයුම් අතිරික්තයෙන් 5% ක් සැපයීමයි.

### 4.7 පූර්ව -වාරික

නියමිත කාලයට පෙර ලැබුනේ නම් පශු සම්පත් සහ අනිවාර්ය රක්ෂණය සඳහා රක්ෂණ වාරික ලදුපත් පූර්ව වාරික සේ සලකනු ලැබේ.

### 5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ "වක්‍ර ක්‍රමය " යොදා ගනිමිනි.

### 6. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම් වනුයේ, වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරනු ලැබූ දිනය අතර සිදුවන වාසිදායක හෝ අවාසිදායක සිදුවීම් වේ. වාර්තාකරණ දිනයෙන් පසු සියලු ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලනු ලැබ ඇති අතර යෝග්‍ය තැන්හිදී, මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල ගැලපීම් හෝ අනාවරණ සිදුකර ඇත.

රක්ෂණ වාරික ලෙස මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 600 ක් ද, ජාතික රක්ෂණ භාරකාර අරමුදලින් රු. මිලියන 646 ක් ද මණ්ඩලයට ලැබුණි. එම ගනුදෙනු සටහන 2.3 සහ 2.4 හි ලැබිය යුතු ආදායම නියෝජනය කරයි.

### 7. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමයේ සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලැබේ. සම්බන්ධිත පාර්ශව සමග සිදුකළ මෙම ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළි කරනු ලැබේ. කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට රු. 295,230,441.79 ක් වූ ණයක් ප්‍රදානය කොට ඇත.

### 8. පෙර වසරේ ගැලපුම්

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ පෙර වසර සඳහා ගැලපුම් නොමැත.

### 9. ප්‍රතිරක්ෂණ ගෙවීම්

එච්ලැප් සමාගමෙන් (සටහන් වී තිබෙන තැරැව්කරු ලෙස) සහ ජාතික රක්ෂණ අරමුදලින් වී, බඩඉරිහු, අර්තාපල්, ලොකු ලූණු, සෝයා සහ මිරිස් සඳහා 2018 මාර්තු 31 සිට 2019 මාර්තු 31 දක්වා කාලය සඳහා ප්‍රතිරක්ෂණ ආවරණය ලබාගෙන ඇත. රු. 675,760,000 වන මුළු ප්‍රතිරක්ෂණ වාරිකය අනුපිළිවෙළින් 70% ක් සහ 30% ක් ලෙස එච්ලැප් සමාගම සහ ජාතික රක්ෂණ අරමුදල අතර ගෙවා ඇත. ඉහත දක්වා ඇති කන්න දෙක හැරුණු විට 2019 යල කන්නය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලින් ප්‍රතිරක්ෂණ ආවරණය ලබා ගෙන ඇත.

### 10. අනිශ්චිත අවස්ථා

නඩු අටක් විමර්ශනය කර ඇති අතර එම නඩුවල වත්මන් තත්වය පහත වගුවේ හෙළි කර ඇත.

**කෘ .ගො.ර.මණ්ඩලයේ නඩුවල වත්මන් තත්වය**

| | අධිකරණය | නඩු අංකය | පැමිණිලිකරු/ විත්තිකරු | නඩු ක්‍රියාමර්ග හේතුව | වත්මන් තත්වය |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ දිසා අධිකරණය | 21843 MR<br>21844MR<br>21845MR | ලංකා බැංකුව එදිරිව කෘ.ගො.ර.ම. | ආයෝජන සහ ආයෝජන පොළිය | නැවත විමර්ශනය සඳහා නියෝග කරන ලදී. |
| 2 | අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය | B/2171/2002 | පොලීසිය එදිරිව කේ.ඒ.හීන්බණ්ඩාර මයා | ගොවීන්ගේ විශ්‍රාම වැටුප් වාරිකය වංචා කිරීම | නඩු විභාගය පසු අවස්ථාවට තබන ලදී. |
| 3 | අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය | B/520/2013 | පොලීසිය එදිරිව කේ.ජී. සුදත් බණ්ඩාර මයා | ගොවීන්ගේ විශ්‍රාම වැටුප් වාරිකය වංචා කිරීම | නීතිපතිවරයා වෙත යොමු කරන ලදී. |
| 4 | අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය | 61467 | පොලීසිය එදිරිව ටී.ඒ.රත්නසිරි මයා සහ කමල් උඩුවන මයා | නීති විරෝධී පිරමීඩ ක්‍රමවල නිරතවීම | නඩුව විභාග වෙමින් පවතී. 2016 ජනවාරි 20වැනි දින ඇප පිට නිදහස් කරන ලදී. |
| 5 | කොළඹ මහාධිකරණය | 3/8/2 M. C./2006 | පොලීසිය එදිරිව කෘ.ගො.ර.ම. | මාවිල්ආරු භෝග හානි පූරණය | නීතිපතිවරයා වෙත යොමු කරන ලදී. |
| 6 | ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 91838 | පොලීසිය එදිරිව පී.එම්.ඩී. ධම්මික චන්ද්‍රනාත් මයා | දකුණු අධිවේගී මාර්ගයේ අනතුර | නඩුව විභාග වෙමින් පවතී. |
| 7 | කොළඹ අභියාචනාධිකරණය | CA (රිට්) 269/2019 | සෙලින්කෝ සමාගමට එදිරිව කෘ.ගො.ර.ම. | කෘෂිකාර්මික නොවන පාර්ශව සඳහා තෙවන පාර්ශවීය රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් | නඩුව විභාග වෙමින් පවතී. |
| 8 | මාවනැල්ල දිසා අධිකරණය | 2436 | ටී.එම්.ඩබ්ලිව්. කුමුදුනි එදිරිව කෘ.ගො.ර.ම. | තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වන්දි | නඩුව විභාග වෙමින් පවතී |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂිකර්ම රක්ෂණ යෝජනා ක්‍රමය**
**ගිණුම් සඳහා සටහන්**
2019 දෙසැම්බර් 31 දිනට

## සටහන 1 - ජංගම නොවන වත්කම්

රු.

| වත්කම් | 2018.12.31 දිනට පිරිවැය | 2019.01.01 දිනට වත්කම් ප්‍රත්‍යාගණනය | ප්‍රත්‍යාගණන සංචිතයට පවරනු ලැබූ සමුච්චිත හානි | පිරිවැයට එකතුකිරීම් | 2019.12.31 දිනට පිරිවැය | 2018.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් | ප්‍රත්‍යාගණන සංචිතයට පවරනු ලැබූ සමුච්චිත හානි | වර්ෂය සඳහා ක්ෂයවීම් | 2019.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් | 2019.12.31 දිනට ලියා හළ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | 11,335,703.80 | - | | 2,021,729.06 | 13,357,432.86 | 8,696,414.40 | - | 574,693.78 | 9,271,108.18 | 4,086,324.68 |
| කාර්යාල උපකරණ | 12,334,526.38 | - | | 50,135.52 | 12,384,661.90 | 9,547,248.66 | - | 452,322.92 | 9,999,571.58 | 2,385,090.32 |
| රථ වාහන | 58,832,592.28 | 58,129,166.66 | (49,341,758.94) | 399,310.00 | 68,019,310.00 | 49,341,758.94 | (49,341,758.94) | 13,570,586.17 | 13,570,586.17 | 54,448,723.83 |
| සුබසාධන උපකරණ | 705,981.00 | - | | 11,500.00 | 717,481.00 | 466,578.04 | - | 40,752.17 | 507,330.21 | 210,150.79 |
| පරිගණක උපකරණ | 16,025,614.58 | - | | 4,727,905.72 | 20,753,520.30 | 9,618,715.33 | - | 2,784,097.03 | 12,402,812.36 | 8,350,707.94 |
| දුරකථන | 1,510,807.50 | - | | - | 1,510,807.50 | 1,502,776.08 | - | 8,031.42 | 1,510,807.50 | - |
| යතුරු පැදි | 146,300.00 | - | | - | 146,300.00 | 146,300.00 | - | - | 146,300.00 | - |
| ගොඩනැගිලි | 8,079,299.28 | - | | - | 8,079,299.28 | 4,469,503.72 | - | 250,711.31 | 4,720,215.03 | 3,359,084.25 |
| ප්‍රචාරක උපකරණ | 2,012,819.29 | - | | - | 2,012,819.29 | 1,794,712.65 | - | 80,456.16 | 1,875,168.81 | 137,650.48 |
| පාපැදි | 137,839.20 | - | | 18,925.00 | 156,764.20 | 123,814.20 | - | 7,185.00 | 130,999.20 | 25,765.00 |
| අස්වනු කැපීමේ උපකරණ | 60,371.00 | - | | - | 60,371.00 | 60,371.00 | - | - | 60,371.00 | - |
| හානි වැලක්වීමේ උපකරණ | 41,280.00 | - | | - | 41,280.00 | 41,280.00 | - | - | 41,280.00 | - |
| මිනින්දෝරු උපකරණ | 4,399.00 | - | | - | 4,399.00 | 4,399.00 | - | - | 4,399.00 | - |
| කිරුම් උපකරණ | 1,036.35 | - | | - | 1,036.35 | 1,036.35 | - | - | 1,036.35 | - |
| නොරාඩ් උපකරණ | 344,423.50 | - | | - | 344,423.50 | 344,423.50 | - | - | 344,423.50 | - |
| | **111,572,993.15** | **58,129,166.66** | **(49,341,758.94)** | **7,229,505.30** | **127,589,906.18** | **86,159,331.87** | **(49,341,758.94)** | **17,768,835.96** | **54,586,408.89** | **73,003,497.29** |

**සටහන**
දේපළ, පිරියත හා උපකරණවලට 2019 දෙසැම්බර් 31 දිනට තවමත් භාවිතයේ පවතින රු.26,313,350.59ක දළ වටිනාකමක් සහිත පූර්ණව ක්ෂය කරන ලද වත්කම් ඇතුළත් වේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂිකර්ම රක්ෂණ යෝජනා ක්‍රමය**
**ගිණුම් සඳහා සටහන්**
2019 දෙසැම්බර් 31 දිනට

| | | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| | | | |
| **සටහන 2- ජංගම වත්කම්** | | | |
| | | | |
| **සටහන 2.1 - තොග** | | | |
| | | | |
| මුද්‍රණ ද්‍රව්‍ය | | 4,967,197.32 | 3,649,599.17 |
| ලිපි ද්‍රව්‍ය | | 944,441.60 | 1,447,099.27 |
| | | **5,911,638.92** | **5,096,698.44** |
| | | | |
| | | | |
| **සටහන 2.2 ලැබිය යුතු දෑ** | | | |
| | | | |
| කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් | | 40,707,858.26 | 43,476,587.79 |
| යතුරු පැදි ණය | | 1,904,604.84 | 1,572,637.53 |
| ලැබිය යුතු වැටුප් | | 342,023.38 | 342,023.38 |
| කාර්ය මණ්ඩල විශේෂ ණය- 2004 | | 4,800.00 | 4,800.00 |
| ලැබිය යුතු ජීවිත රක්ෂණ වාරික | | 229,485,744.00 | 212,449,360.00 |
| විවිධ ණයගැතියෝ | | 51,542.75 | 51,542.75 |
| ස.තො.ස ආයතනයෙන් ලැබිය යුතු මුදල් | | 256,520.00 | 256,520.00 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය -කෘෂි පාලන මධ්‍යස්ථානය | | 1,947,160.40 | - |
| ජා.ර.හා.අ.-ජා.ර.හා.අ. භෝග බද්ද | | 793,310,000.00 | 200,000,000.00 |
| ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් | | 312,000,000.00 | - |
| මෝටර් බයිසිකල් වියදම් (කාර්ය මණ්ඩල) | | 2,566.70 | 2,566.70 |
| ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පරිපාලන) | | 115,174,191.83 | 116,771,772.45 |
| සීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | | 40,070,084.52 | 34,353,102.71 |
| ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (ප්‍රාග්ධන) | | 1,178,329.84 | 1,191,587.68 |
| ගොවි විශ්‍රාම වැටුප් අත්තිකාරම | | 480,304,114.75 | 442,880,695.94 |
| බොල් ණයගැතියෝ සඳහා ප්‍රතිපාදන | | (2,035,392.92) | (2,173,829.39) |
| | | **2,014,704,148.35** | **1,051,179,367.54** |
| | | | |
| | | | |
| **සටහන 2.3 ලැබිය යුතු වාරික** | | | |
| | | | |
| අතුරු භෝග | | - | 529,484.39 |
| පශු සම්පත් | | 392,480.50 | 1,033,245.20 |
| සුවසෙත හා පුද්ගලික | | 91,165.00 | 60,322.50 |
| රක්ෂණ වාරිකය- භාණ්ඩාගාර දායකත්වය | | 2,113,619,152.00 | 1,762,120,000.00 |
| | | **2,114,102,797.50** | **1,763,743,052.09** |
| | | | |
| | | | |
| **සටහන 2.4 - තැන්පතු හා පූර්ව ගෙවීම්** | | | |
| | | | |
| තැන්පතු - (ඉන්ධන) | | 150,000.00 | 150,000.00 |
| තැන්පතු - (ප්‍රවාහන) | | 5,000.00 | 5,000.00 |
| රක්ෂණය | | 688,949.63 | 50,877.56 |
| ප්‍රති රක්ෂණය | | - | 427,981,000.00 |
| කුලිය | | 4,755,202.57 | 4,677,922.00 |
| | | **5,599,152.20** | **432,864,799.56** |
| | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**
**ගිණුම් සඳහා සටහන්**
2019 දෙසැම්බර් 31 දිනට

| | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|
| | රු. ශත. | රු. ශත. |
| | | |
| **සටහන 2.5 - අත්තිකාරම්** | | |
| | | |
| ගමන් අත්තිකාරම් | 8,000.00 | 12,000.00 |
| ඉන්ධන අත්තිකාරම් | 39,570.65 | 41,626.95 |
| වැටුප් අත්තිකාරම් | 50,261.41 | 50,261.41 |
| විවිධ අත්තිකාරම් | 18,561.00 | 1,035.00 |
| ප්‍රාග්ධන අත්තිකාරම් | 565,800.00 | 565,800.00 |
| දිස්ත්‍රික් පරිපාලන ගිණුම | 205.63 | 709.13 |
| | **682,398.69** | **671,432.49** |
| | | |
| | | |
| **සටහන 2.6 - කල්පිරීම් දක්වා රඳවා ගත් මූල්‍ය සාධන පත්‍ර** | | |
| | | |
| භාණ්ඩාගාර බිල්පත් | 1,130,984,036.50 | 173,841,742.35 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 167,885,723.85 | 168,080,178.10 |
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | 580,000,000.00 | 750,000,000.00 |
| | **1,878,869,760.35** | **1,091,921,920.45** |
| | | |
| | | |
| **සටහන 2.7 - බැංකුවේ ඇති මුදල්** | | |
| | | |
| ලංකා බැංකු ගිණුම - 164811 | 487,521.99 | 1,530,799.21 |
| ලංකා බැංකු ගිණුම - 164667 | 1,131,573.94 | 1,422,336.06 |
| ලංකා බැංකු ගිණුම -164693 | 808,618.31 | 1,013,699.89 |
| ලංකා බැංකු ගිණුම -1622 | 33,390.11 | 440,465.90 |
| ලංකා බැංකු ගිණුම -1616 | 370,166.52 | 92,223.06 |
| ලංකා බැංකු ගිණුම -8600879 | 426,266.27 | 125,134.91 |
| ලංකා බැංකු ගිණුම -8600818 | 258,814.16 | 258,814.16 |
| මහජන බැංකු ගිණුම -112352 | 313,564.91 | 247,267.80 |
| මහජන බැංකු ගිණුම -112343 | 86,166.80 | 90,119.30 |
| මහජන බැංකු ගිණුම - 100440112349 | 74,505.69 | 74,505.69 |
| මහජන බැංකු ගිණුම - 100260112349 | 53,040.00 | 53,040.00 |
| මහජන බැංකු ගිණුම - 100350112349 | 27,871.88 | 156,799.62 |
| මහජන බැංකු ගිණුම - 100170112349 | 833,594.62 | 392,948.34 |
| මහජන බැංකු ගිණුම - 335100190008791 | 760,599.03 | 381,247.40 |
| මහජන බැංකු ගිණුම - 335100280008791 | 459,062.81 | 858,021.08 |
| මහජන බැංකු ගිණුම - 100530112349 | 3,702,675.67 | 1,250,865.21 |
| ප්‍රා.ස.බැංකු ගිණුම - 134010103277 | 41,623,730.72 | 30,581,801.42 |
| | **51,451,163.43** | **38,970,089.05** |
| | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**
**ගිණුම් සඳහා සටහන්**
2019 දෙසැම්බර් 31 දිනට

| | | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| **සටහන 3 - කෘ.ගො.ර.ම. සමුච්චිත අතිරික්තය** | | | |
| ඉදිරියට ගෙනා ශේෂය | | 1,288,286,716.11 | 367,207,363.28 |
| **එකතු කළා:** | | | |
| වසර සඳහා අතිරික්තය (හිඟය) | | 652,339,936.00 | 921,079,352.83 |
| 2019.12.31 දිනට ශේෂය | | **1,940,626,652.11** | **1,288,286,716.11** |
| **සටහන 4 - ප්‍රාග්ධනය** | | | |
| **ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය** | | | |
| 2019.01.01 දිනට ශේෂය | | 9,956,993.57 | 11,798,919.21 |
| **එකතු කළා:** | | | |
| වසර සඳහා ප්‍රදානය | | - | 2,000,000.00 |
| රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | | (4,665,107.63) | (3,841,925.64) |
| රජයේ ප්‍රදානය - ප්‍රාග්ධනය | | **5,291,885.94** | **9,956,993.57** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**
**ගිණුම් සඳහා සටහන්**
2019 දෙසැම්බර් 31 දිනට

| | | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| | | | |
| **සටහන 5 - කෘ.ර.ම. සංචිත අරමුදල** | | | |
| | | | |
| 2019.01.01 දිනට ශේෂය | | 100,397,962.35 | 43,161,365.93 |
| **එකතු කළා :** | | | |
| වර්ෂය සඳහා ප්‍රතිපාදනය | | 43,902,996.30 | 57,236,596.42 |
| | | | |
| 2019.12.31 දිනට ශේෂය | | **144,300,958.65** | **100,397,962.35** |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| **සටහන 6 - ගො වි මරණ පාරිතෝ ෂික අරමුදල** | | | |
| | | | |
| 2019.01.01 දිනට ශේෂය | | 956,861,044.93 | 878,651,396.82 |
| **එකතු කළා :** | | | |
| මරණ පාරිතෝ ෂික වාරිකය | | 19,016,134.00 | 19,853,880.00 |
| පොළී ආදායම | | 54,776,414.56 | 60,379,413.11 |
| | | 73,792,548.56 | 80,233,293.11 |
| **අඩුකළා :** | | | |
| මරණ පාරිතෝ ෂික ගෙවීම | | 1,878,750.00 | 2,023,645.00 |
| ආබාධිත පාරිතෝ ෂික ගෙවීම | | 101,000.00 | - |
| | | 1,979,750.00 | 2,023,645.00 |
| 2019.12.31 දිනට ශේෂය | | **1,028,673,843.49** | **956,861,044.93** |
| | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**
**ගිණුම් සඳහා සටහන්**
2019 දෙසැම්බර් 31 දිනට

| | | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| | | | |
| **සටහන 7 - ජංගම බැරකම්** | | | |
| | | | |
| **සටහන 7.1 - පූර්ව වාරික ලැබීම්** | | | |
| | | | |
| පූර්ව වාරික - පශු සම්පත් | | 2,854,241.59 | 2,960,947.18 |
| පූර්ව වාරික - කෙතට අරුණ | | 23,038,765.05 | 27,313,322.85 |
| | | **25,893,006.64** | **30,274,270.03** |
| | | | |
| | | | |
| **සටහන 7.2 - අනෙකුත් ගෙවිය යුතු මුදල්** | | | |
| | | | |
| සේවක දීමනා සඳහා ප්‍රතිපාදනය | | 4,500,000.00 | 1,560,000.00 |
| අගය එකතු කළ බද්ද | | 1,513,805.00 | - |
| ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු | | 426,870.60 | 471,030.60 |
| හිමිකම් නොපෑ වන්දි | | 70,800,200.00 | 70,800,200.00 |
| | | **77,240,875.60** | **72,831,230.60** |
| | | | |
| | | | |
| **සටහන 7.3 -උපචිත වියදම්** | | | |
| | | | |
| පරිපාලන වියදම් | 7.3.1 | 12,380,713.31 | 5,184,154.29 |
| දිරි දීමනා - භෝග රක්ෂණය | | 671,833.13 | 7,949,964.97 |
| දිරි දීමනා - වංචල දේපළ-තෙවන පාර්ශවය | | 2,718,751.26 | - |
| වංචල දේපළ - කාර්ය මණ්ඩල දිරි දීමනා සහ උසස්වීම් | | 11,755,982.24 | - |
| පුද්ගල අනතුරු හා සුවසෙත | | 76,530.85 | 1,504,097.01 |
| මෙහෙයුම් වියදම්- පශු සම්පත් | | 131,837.99 | - |
| | | **27,735,648.78** | **14,638,216.27** |
| | | | |
| | | | |
| **සටහන 7.4 - හානි පූරණය සඳහා ප්‍රතිපාදනය** | | | |
| | | | |
| පශු සම්පත් | | 7,000,000.00 | 8,000,000.00 |
| සුවසෙත | | 500,000.00 | 500,000.00 |
| වංචල දේපල - තෙවන පාර්ශවය | | 23,559,605.00 | 11,975,723.00 |
| අතුරු භෝග | | 2,000,000.00 | 15,000,000.00 |
| කෙතට අරුණ (අනිවාර්ය භෝග රක්ෂණය) | | 2,000,284,021.00 | 1,105,000,000.00 |
| | | **2,033,343,626.00** | **1,140,475,723.00** |
| | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**
**ගිණුම් සඳහා සටහන්**
2019 දෙසැම්බර් 31 දිනට

| | | 2019.12.31 | | 2018.12.31 |
|---|---|---|---|---|
| | | රු. ශත. | | රු. ශත. |
| | | | | |
| **සටහන 7.3.1 - උපචිත වියදම්** | | | | |
| | | | | |
| විදුලිය | | 214,898.10 | | 3,663.15 |
| ආරක්ෂක සේවා ගාස්තු | | 7,500.00 | | 7,500.00 |
| කුලිය | | 1,055,516.00 | | 1,039,516.00 |
| රථවාහන නඩත්තුව | | 537,145.00 | | 149,940.00 |
| ගමන් හා යැපීම් දීමනා | | 1,004,959.00 | | 283,721.00 |
| වැටුප් | | 1,421,622.02 | | 1,106,137.07 |
| සේ.අ.අ. | | 74,935.09 | | 92,851.69 |
| සේ.භා.අ. | | 18,733.77 | | 23,212.92 |
| ප්‍රචාරණය | | 94,500.00 | | 24,972.00 |
| ලිපි ද්‍රව්‍ය | | 218,892.50 | | 419,017.66 |
| දුරකථන | | 307,377.49 | | 62,642.42 |
| ජල බිල්පත් | | 150.00 | | 10,801.86 |
| විගණන ගාස්තු | | 5,213,846.00 | | 1,540,444.00 |
| ඉන්ධන | | 304,340.00 | | 160,208.10 |
| නිල ඇඳුම් | | 7,200.00 | | - |
| සුබ සාධනය | | 4,780.00 | | - |
| ශ්‍රම ගාස්තු | | 5,750.00 | | - |
| ප්‍රවාහන වියදම් | | 1,600.00 | | - |
| භාෂා පරිවර්තන ගාස්තු | | 1,085.00 | | - |
| බැංකු ගාස්තු | | 2,310.00 | | 3,310.39 |
| ගෙවිය යුතු ගොඩනැගිලි නඩත්තු | | - | | 16,590.00 |
| ගෙවිය යුතු මුද්‍රණ කටයුතු | | 308,594.68 | | 1,500.00 |
| ගෙවිය යුතු තැපැල් ගාස්තු | | 36,050.00 | | 3,511.00 |
| විවිධ ණය හිමියෝ | | 162,880.03 | | 162,880.03 |
| ගෙවිය යුතු කාර්යාල උපකරණ | | 2,500.00 | | 17,735.00 |
| ගෙවිය යුතු සංග්‍රහ දීමනා | | 5,255.00 | | - |
| ගෙවිය යුතු පුවත්පත් වියදම | | 28,170.00 | | - |
| ගෙවිය යුතු නීති ගාස්තු | | - | | 54,000.00 |
| කෘෂි පාලන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | | 1,340,123.63 | | - |
| | | **12,380,713.31** | | **5,184,154.29** |
| | | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**
**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**

| | | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| | | | |
| **සටහන 8 - ආදායම** | | | |
| | | | |
| **සටහන 8.1 - වාරික - (රක්ෂණ)** | | | |
| | | | |
| පශු සම්පත් | | 7,866,194.77 | 10,591,321.75 |
| සුවසෙත රක්ෂණය/ පුද්ගල අනතුරු | | 9,419,321.45 | 6,343,970.00 |
| අතුරු භෝග | | 3,046,588.59 | 8,037,615.80 |
| වංචල දේපල | | 220,153,223.24 | 137,852,780.34 |
| කෙතට අරුණ (අනිවාර්ය භෝග රක්ෂණය) | | 58,067,963.40 | 119,965,311.95 |
| | | **298,553,291.45** | **282,790,999.84** |
| | | **298,553,291.45** | **282,790,999.84** |
| | | | |
| **සටහන 8.2- පොළී ආදායම** | | | |
| | | | |
| පොළිය - භාණ්ඩාගාර බිල්පත් (භෝග හා වෙනත්) | | 123,164,439.13 | 123,548,217.07 |
| - සේවකයන් සඳහා ණය | | 1,858,133.67 | 1,847,805.29 |
| | | **125,022,572.80** | **125,396,022.36** |
| | | | |
| **සටහන 9 - මෙහෙයුම් වියදම්** | | | |
| | | | |
| **සටහන 9.1 - හානි පූරණය - රක්ෂණය** | | | |
| | | | |
| පශු සම්පත් | | 5,136,019.50 | 4,993,850.25 |
| සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය | | 44,690.00 | 466,762.89 |
| වංචල දේපළ | | 11,583,882.00 | 7,175,723.00 |
| අතුරු භෝග | | 2,099,657.00 | 26,354,304.80 |
| කෙතට අරුණ (අනිවාර්ය භෝග රක්ෂණය) | | 2,155,030,832.79 | 2,930,635,667.20 |
| | | **2,173,895,081.29** | **2,969,626,308.14** |
| | | | |
| **සටහන 9.2 - වෙනත් මෙහෙයුම් වියදම්** | | | |
| | | | |
| රක්ෂණ දිරිදීමනා | | 509,605.41 | 14,769,388.73 |
| වංචල දේපළ -තෙවන පාර්ශවය රක්ෂණ දිරි දීමනා | | 30,729,803.66 | 17,588,783.00 |
| වංචල දේපළ - කාර්ය මණ්ඩල දිරි දීමනා සහ උසස්වීම් | | 11,755,982.24 | - |
| සුවසෙත දිරිදීමනා | | 153,272.49 | 254,820.09 |
| පරිපාලන දීමනා | | 14,040.00 | 18,720.00 |
| භෝග තක්සේරුව | | 4,355,573.43 | 2,224,594.60 |
| පශු සම්පත් | | 1,238,616.59 | 1,516,256.38 |
| | | **48,756,893.82** | **36,372,562.80** |
| | | | |
| **සටහන 10 - අනෙකුත් ආදායම** | | | |
| | | | |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම | | - | 28,653.96 |
| රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | | 4,198,249.79 | 3,324,992.83 |
| විවිධ ආදායම් | | 65,201.52 | 283,672.37 |
| බොල් ණය අධි ප්‍රතිපාදන | | 138,436.47 | - |
| බැංකුවේ සේවා ගාස්තු | | 4,741,300.00 | 359,600.00 |
| | | **9,143,187.78** | **3,996,919.16** |
| | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය**
**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**
**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**

| | | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| | | | |
| **සටහන 11 - පරිපාලන වියදම්** | | | |
| | | | |
| වැටුප් හා වේතන | | 80,683,797.20 | 77,970,730.52 |
| සේ.අ.අ. දායක මුදල් | | 8,791,903.79 | 8,323,757.47 |
| සේ.හා.අ. දායක මුදල් | | 2,197,974.70 | 2,080,963.91 |
| ගමන් හා යැපීම් දීමනා | | 3,535,580.63 | 3,275,166.51 |
| අතිකාල | | 2,543,693.73 | 2,064,278.80 |
| දෛනික වැටුප් | | 405,277.40 | 212,681.52 |
| වෛද්‍ය වියදම් | | 592,911.00 | 627,795.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | | 331,500.00 | 189,660.00 |
| පාරිතෝෂිකය | | 4,540,217.82 | 4,982,837.14 |
| සුබසාධනය | | 997,640.24 | 1,138,534.21 |
| සේවකයන් සඳහා දීමනා | | 7,276,000.00 | 6,651,440.44 |
| ඉන්ධන | | 5,697,201.70 | 5,835,268.05 |
| ලිපිද්‍රව්‍ය | | 3,188,018.48 | 3,899,518.76 |
| සංග්‍රහ දීමනාව | | 210,498.08 | 206,867.45 |
| නෛතික ගාස්තු | | 397,349.86 | 287,892.00 |
| ප්‍රවාහන | | 373,923.33 | 284,358.82 |
| මුද්‍රණ | | 7,433,058.53 | 7,915,544.97 |
| ප්‍රචාරණ හා පුහුණු | | 5,963,611.81 | 10,229,546.54 |
| නිල ඇඳුම් | | 153,324.05 | 155,010.75 |
| කුලිය | | 7,800,248.70 | 7,989,010.02 |
| දුරකථන | | 3,101,601.34 | 3,997,671.52 |
| තැපැල් ගාස්තු | | 1,070,240.82 | 961,407.44 |
| ජලය | | 253,709.07 | 269,478.72 |
| පුවත්පත් හා දැන්වීම් | | 235,690.00 | 515,734.00 |
| ආරක්ෂක සේවා | | 702,525.00 | 719,962.50 |
| විදුලිය | | 1,780,961.29 | 1,922,237.28 |
| නඩත්තුව - රථ වාහන | | 7,315,419.65 | 5,767,793.53 |
| නඩත්තු - ගොඩනැගිලි | | 808,840.54 | 300,364.90 |
| නඩත්තුව - කාර්යාල උපකරණ | | 315,416.82 | 312,564.09 |
| කම්කරු ගාස්තු | | 419,916.05 | 300,746.95 |
| භාෂා පරිවර්තන ගාස්තු | | 203,930.00 | 114,860.00 |
| පරිගණක වියදම් | | 131,906.25 | 75,149.24 |
| විවිධ වියදම් | | - | 25,120.00 |
| ක්ෂයවීම් | | 17,768,835.96 | 8,744,992.83 |
| බොල් ණය | | - | 60,174.86 |
| විගණන ගාස්තු | | 3,673,402.00 | 600,000.00 |
| විදේශ ගමන් | | 3,369,708.03 | 33,500.00 |
| උපදේශන ගාස්තු | | - | - |
| | | **184,265,833.87** | **169,042,620.74** |
| | | | |
| **සටහන 12 - මූල්‍ය ගාස්තු** | | | |
| | | | |
| බැංකු ගාස්තු | | 750,367.41 | 690,340.26 |
| | | **750,367.41** | **690,340.26** |
| | | | |

# 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන

## ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|---|
| **වත්කම්** | **සටහන්** | **රු. ශත.** | **රු. ශත.** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ,පිරියත හා උපකරණ | 1 | 3,458,328.80 | 1,191,586.64 |
| | | **3,458,328.80** | **1,191,586.64** |
| **කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජන** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | | 1,055,048,182.56 | 1,053,000,000.00 |
| | | **1,055,048,182.56** | **1,053,000,000.00** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 2 | 2,421,388.03 | 3,916,331.12 |
| ලැබිය යුතු දෑ | 3 | 19,331,022.20 | 14,733,099.20 |
| කල් පිරීම දක්වා රඳවාගත් ආයෝජන | 4 | 167,887,669.04 | 78,661,138.76 |
| ලැබිය යුතු ආදායම | 5 | 2,312,963.48 | 2,364,790.50 |
| බැංකුවේ ඇති මුදල් | 6 | 2,225,694.22 | 2,401,246.99 |
| | | **194,178,736.97** | **102,076,606.57** |
| | | . | . |
| **මුළු වත්කම්** | | **1,252,685,248.33** | **1,156,268,193.21** |
| **ස්කන්ධ හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ගොවි විශ්‍රාම වැටුප් අරමුදල | 7 | (75,433,313,129.80) | (71,616,681,986.31) |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 2,850,000.00 | - |
| සමූහ රක්ෂණ දායකත්වය | | 1,000,000.00 | 1,000,000.00 |
| | | **(75,429,463,129.80)** | **(71,615,681,986.31)** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම වැටුප් බැරකම | | 70,252,869,112.00 | 66,508,205,596.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත රජයේ ප්‍රදානය | | 1,081,488,000.00 | 1,081,488,000.00 |
| කාර්යමණ්ඩල පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය | | 54,643,566.14 | 47,395,858.33 |
| | | **71,389,000,678.14** | **67,637,089,454.33** |
| **ජංගම බැරකම්** | | | |
| ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය | 8 | 1,178,329.84 | 1,191,587.68 |
| මුළු ගෙවිය යුතු දෑ | 9 | 5,286,510,760.49 | 5,128,869,061.35 |
| උපචිත වියදම් | 10 | 5,458,609.66 | 4,800,076.16 |
| | | **5,293,147,699.99** | **5,134,860,725.19** |
| | | . | . |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | **1,252,685,248.33** | **1,156,268,193.21** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතා හා අනුකූල වේ

.....

මුදල් අංශ ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ:

| | |
|---|---|
| ..... | ..... |
| අධ්‍යක්ෂ මණ්ඩල සමාජික | අධ්‍යක්ෂ මණ්ඩල සමාජික |
| කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**විස්තීරණ ආදායම් ප්‍රකාශනය**
**2019 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| **ආදායම** | **සටහන්** | | |
| පොළී ආදායම | | 119,044,408.64 | 97,556,670.29 |
| ගොවි දායකත්වය | | 17,332,237.96 | 19,982,355.64 |
| විශ්‍රාමිකයන්ගේ දායකත්වය | | 94,327,403.00 | 91,373,300.00 |
| ජීවිත රක්ෂණ වාරික සඳහා ගොවි දායකත්වය | | 2,775,690.00 | 3,047,070.00 |
| | | **233,479,739.60** | **211,959,395.93** |
| | | | |
| **වියදම** | | | |
| දායක මුදල් ආපසු ගෙවීම් | | (11,917,037.98) | (12,905,393.00) |
| ශුද්ධ පොළී ආපසු ගෙවීම | | (8,544,418.02) | (8,503,036.00) |
| ආබාධිත පාරිතෝෂික ගෙවීම | | (1,206,876.00) | (1,228,863.00) |
| සමූහ රක්ෂණ වාරිකය | | (19,016,134.00) | (19,853,880.00) |
| විශ්‍රාම වැටුප් ගෙවීම් සහ කොමිස් මුදල් | | | |
| - විශ්‍රාම වැටුප් ගෙවීම් | | (3,217,332,522.00) | (3,059,370,767.00) |
| - කොමිස් මුදල් ගෙවීම | | (13,196,218.00) | (12,792,199.00) |
| **මුළු වියදම** | | **(3,271,213,206.00)** | **(3,114,654,138.00)** |
| | | | |
| **මෙහෙයුම් අතිරික්තය / (හිඟය)** | | **(3,037,733,466.40)** | **(2,902,694,742.07)** |
| රජයේ ප්‍රදානය - පුනරාවර්තන | | 3,065,000,000.00 | 2,725,000,000.00 |
| | | **27,266,533.60** | **(177,694,742.07)** |
| | | | |
| රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | | 466,857.84 | 516,932.81 |
| | | **27,733,391.44** | **(177,177,809.26)** |
| **ආදායම- පරිපාලනය සඳහා** | | | |
| | | | |
| පරිපාලන වියදම් සඳහා ගොවීන්ගේ දායක මුදල් | | 1,387,845.00 | 1,523,535.00 |
| පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 138,000,000.00 | 110,000,000.00 |
| වෙනත් ආදායම් | 11 | 18,400.00 | 20,400.00 |
| | | **139,406,245.00** | **111,543,935.00** |
| **වියදම** | | | |
| පරිපාලන සහ ආයතනික වියදම් | 12 | (136,894,634.69) | (131,656,887.84) |
| මූල්‍ය වියදම් | 13 | (88,581,354.56) | (114,007,953.57) |
| එකතු කිරීමේ නියෝජිතයන් සඳහා කොමිස් | | (647,752.00) | (711,732.00) |
| | | | |
| **මුළු පරිපාලන වියදම්** | | **(226,123,741.25)** | **(246,376,573.41)** |
| | | | |
| | | **(86,717,496.25)** | **(134,832,638.41)** |
| **වසර සඳහා අතිරික්තය / (හිඟය)** | | **(58,984,104.81)** | **(312,010,447.67)** |
| | | | |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම** | | | |
| පාරිතෝෂික ලාභ/(අලාභ) | | (12,983,522.68) | 687,767.03 |
| විශ්‍රාම බැරකමේ වැඩිවීම | | (3,744,663,516.00) | (3,287,507,607.00) |
| | | **(3,757,647,038.68)** | **(3,286,819,839.97)** |
| | | | |
| **විස්තීර්ණ ආදායමේ ශුද්ධ අතිරික්තය /හිඟය** | | **(3,816,631,143.49)** | **(3,598,830,287.64)** |
| **(ගොවි විශ්‍රාම අරමුදලට පවරන ලදී)** | | | |
| | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනට ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය**

| | ගොවි විශ්‍රාම වැටුප් අරමුදල | ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | සමූහ රක්ෂණ ආයකත්වය | ප්‍රත්‍යාගණන සංචිතය | ආ.කෘ.ස. ප්‍රදානය |
|---|---|---|---|---|---|
| | | | | | |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | (67,774,374,701) | 1,687,840 | 1,000,000 | - | 547,885 |
| පූර්ව ගැලපුම් | (244,024,883) | - | - | - | - |
| | | | | | |
| **2018 දෙසැම්බර් 31 දිනට ගැලපූ ශේෂය** | **(68,018,399,584)** | **1,687,840** | **1,000,000** | **-** | **547,885** |
| එකතු කිරීම් | - | 20,680 | - | - | - |
| රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | - | (516,933) | - | - | - |
| වසර සඳහා ලාභය/අලාභය | (3,598,830,288) | - | - | - | - |
| | | | | | |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(71,617,229,871)** | **1,191,588** | **1,000,000** | **-** | **547,885** |
| ගොවි විශ්‍රාම වැටුපට පවරනු ලැබූ ආ.කෘ.ස. ප්‍රදානය | 547,885 | | | | (547,885) |
| | | - | | | |
| **2018 දෙසැම්බර් 31 දිනට ගැලපූ ශේෂය** | **(71,616,681,986)** | **1,191,588** | **1,000,000** | **-** | **-** |
| | - | | | | |
| වත්කම් එකතු කිරීම් | - | 453,600 | - | - | |
| රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | - | (466,858) | - | - | |
| ගෙවිය යුතු සම්බන්ධිත පාර්ශව වෙත පවරනු ලැබූ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | - | (1,178,330) | - | - | - |
| මෝටර් රථවාහනවලින් පැවැරුම් පිරිවැය | - | - | - | (2,102,061) | - |
| මෝටර් රථවාහනවල සමුච්චිත ක්ෂය | - | - | - | 2,102,061 | - |
| මෝටර් රථවාහන වෙත පවරනු ලැබූ ප්‍රත්‍යාගණන වටිනාකම | - | - | - | 2,850,000 | - |
| වර්ෂය සඳහා ලාබය/අලාභය | (3,816,631,143) | - | - | | - |
| | | - | - | | - |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(75,433,313,130)** | **0.00** | **1,000,000** | **2,850,000** | **-** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|
| | රු. ශත. | රු. ශත. |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ශුද්ධ අතිරික්තය / (හිඟය) | (3,816,631,143) | (3,598,830,288) |
| **ගැලපුම්** | | |
| - ක්ෂයවීම් | 1,036,858 | 516,933 |
| - දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත (ලාභය)/අලාභය | - | (3,150) |
| - පෙර වසරට අදාළ ගැලපුම් | - | (244,024,883) |
| - පාරිතෝෂිකය මත ලාභය/ අලාභය | 12,983,523 | (687,767) |
| | **14,020,381** | **(244,198,867)** |
| | | |
| විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 5,661,833 | 6,698,438 |
| විශ්‍රාම වැටුප් බැරකම | 3,744,663,516 | 3,287,507,607 |
| | **3,750,325,349** | **3,294,206,045** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | **(52,285,414)** | **(548,823,110)** |
| | | |
| වට්ටෝරු භාණ්ඩවල (වැඩිවීම)/අඩුවීම | 1,494,943 | (1,236,819) |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (4,597,923) | 59,682,267 |
| ලැබිය යුතු ආදායමේ (වැඩිවීම)/අඩුවීම | 51,827 | 803,374 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | 157,641,699 | 503,584,871 |
| උපචිත වියදම් (වැඩිවීම)/අඩුවීම | 658,534 | (4,750,907) |
| | **155,249,080** | **558,082,786** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදිත මුදල්** | **102,963,665** | **9,259,676** |
| විශ්‍රාමික පාරිතෝෂිකය - ගෙවන ලද | (11,397,648) | (3,503,432) |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **91,566,018** | **5,756,244** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| | | |
| වසර තුළ ආයෝජන | (89,226,530) | (24,607,757) |
| දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ලත් මුදල් | - | 3,150 |
| දේපල, පිරියත සහ උපකරණ මිලයට ගැනීම | (453,600) | (20,680) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින්ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(89,680,130)** | **(24,625,287)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින්ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | 453,600 | 20,680 |
| රජයේ ප්‍රදානය සඳහා ක්‍රමක්ෂය | (466,858) | (516,933) |
| රජයේ බැඳුම්කර | (2,048,183) | 19,068,692 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(2,061,440)** | **18,572,440** |
| | | |
| **මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | **(175,553)** | **(296,604)** |
| වසර ආරම්භයේදී මුදල් සහ බැංකු ශේෂය | 2,401,247 | 2,697,851 |
| **වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | **2,225,694** | **2,401,247** |
| | | |
| **වසර අවසානයේදී මුදල් සහ බැංකු ශේෂය** | | |
| **බැංකුවේ ඇති මුදල් - වසර අවසානයේදී** | **2,225,694** | **2,401,247** |
| | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

## 1 පොදු ප්‍රතිපත්ති

### 1.1 වාර්තාකරණ අස්තිත්වය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (මෙහි මින්මතු 'මණ්ඩලය' ලෙස සඳහන් කරනු ලබන) 1999 අංක 20 දරන පනතෙන් සංස්ථාගත කරන ලද අතර නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාරාම පාරේ අංක 117 දරන ස්ථානයේ පිහිටා ඇත. ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කරනු ලැබුයේ 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ විධිවිධාන ප්‍රකාරවය.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ ගොවීන් සඳහා ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමය.

### 1.3 පිළියෙල කිරීමේ පදනම

**(අ) අනුකූලතා ප්‍රකාශනය**

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, අරමුදල් සහ සංචිතවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වලින් සමන්විත වේ.මෙම ගිණුම් ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) ප්‍රකාරව පිළියෙල කර ඇත.

**(ආ) මැණීම් පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණ කරනු ලබන විටදී හැරුණු විට මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

**(ඇ) සන්සන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්ථන කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශ අවබෝධ කරගැනීම ඉහළ නැංවීම පිණිස සහ අන්තර් කාලසීමා සන්සන්දනීයභාවය වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ අවබෝධ කර ගැනීම ඉහළ නැංවීම පිණිස සහ අන්තර් කාලසීමා සන්සන්දනීයභාවය වැඩිදියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්ථන වසර සමග අනුකූලවන සේ සන්සන්දනාත්මක මුදල් ප්‍රමාණද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

**(ඇ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය**

මෙම මුදල් ප්‍රකාශ මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

**(ඉ) තක්සේරු සහ තීරණ භාවිතය**

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර /.ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාකරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තීන්දු, තක්සේරු සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරීත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම අදාළ කාලසීමාවට පමණක් බලපාන්නේ නම්, ඒවා පිළිගනු ලබන්නේ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරඇති කාලසීමාව තුළ වන අතර ප්‍රවර්තන හා යම් අනාගත කාල සීමාවන්ට එම ප්‍රතිශෝධනය බලපාන්නේ නම් ප්‍රතිශෝධන කාලසීමාව හා අනාගත කාලසීමාවන් සඳහා ද පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැළකිය යුතු බලපෑම් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු, අවිනිශ්චිතතා සහ තීරණාත්මක තීන්දු පිළිබඳ සැලකිය යුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල අඩංගු කර ඇත.

**ඊ) ප්‍රවර්තන ව්‍යාපාරය (අඛණ්ඩ පැවැත්ම)**

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවැතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරීත්වය තක්සේරුවක් කර තිබේ. එබැවින්, ප්‍රවර්තන ව්‍යාපාරයක පදනමින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

## 2. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම්

### 2.1 දේපළ, පිරියත හා උපකරණ

**(අ) පිළිගැනීම සහ ගණනය කිරීම**

දේපල, පිරියත හා උපකරණ අයිතම ප්‍රකාශ කර ඇත්තේ එකතු වූ  ක්ෂය කිරීම් හා හානි අලාභ අඩුකොට පිරිවැයට හෝ තක්සේරුවටය.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ වටිනාකමේ සමුච්චිත හානිවීම් අඩුකර පිරිවැයටය. වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපළක, පිරියතක හෝ උපකරණයක සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනය කරනු ලැබීමට අවශ්ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස පිළිගැනීමෙන් ඉවත්කර නව කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම සහිතව අස්තිත්වය මගින් පිළිගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

රු. 27,150.285.46 මුළු ඓතිහාසික පිරිවැයක් සහිත සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුලත් කර තිබේ.

**(ආ) පිරිවැය**

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහා වූ සෘජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂා කිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

**(ඇ) ප්‍රත්‍යාගණනය**

වත්කමක් ලෙස පිළිගැනීමෙන් පසුව, සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැණිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි, කිසියම් තදනන්තර සමුච්චිත ක්ෂය සහ තදනන්තර සමුච්චිත හානි අලාභ අඩු කොට ප්‍රත්‍යාගණනය සිදුකළ දිනයට ප්‍රත්‍යාගණන වටිනාකමට දක්වා තිබේ. ප්‍රත්‍යාගණනය කරන ලද

වත්කමක සාධාරණ වටිනාකම වාර්තාකරණ දිනයේදී එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම පිණිස තක්සේරු කිරීම් සිදුකරනු ලැබේ.

මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබූ එම වත්කමෙම කිසියම් පූර්ව අඩුවීමක් හිලව් කරන්නේ නම් හැර ප්‍රත්‍යාගණන වටිනාකමේ කිසියම් වැඩිවීමක් ස්කන්ධයේ ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලැබේ. වටිනාකමේ අඩුවීමක්, ප්‍රත්‍යාගණන සංචිතයේ කළින් හඳුනාගනු ලැබූ වැඩිවීමක් ඉක්මවා යන විටදී ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. බැහැර කිරීමේදී, යම් ආශ්‍රි ප්‍රත්‍යාගණන සංචිතයක් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලබන අතර බැහැර කිරීම මත ලාබ හෝ අලාබ තීරණය කිරීමේදී ගිණුම්වලට ගනු නොලැබේ.

**(ඇ) ක්ෂයවීම්**

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත් කිරීම පිණිස, ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වැය බරක් සේ දක්වනු ලබයි.

| | |
|---|---|
| ලීබඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| සුබසාධන උපකරණ | 10% |
| ප්‍රචාරණ උපකරණ | 10% |
| පරිගණක | 20% |
| පරිගණක මෘදුකාංග | 20% |
| රථ වාහන | 20% |
| වායු සමන යන්ත්‍ර | 20% |

## 2.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයක් තිබෙනම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. -38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ.

පරිගණක මෘදුකාංග සරල රේඛීය ක්‍රමය මත වසර 5ක කාලා සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.3 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම ද ඇතුළත්ය.

## 2.4 මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකම ධන ලෙසත් ලාභ හෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ආරම්භයේදී ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිත කළ වත්කම් ඇතුළුව) ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය වත්කම හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩලය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත් කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක් මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ යම් බැඳියාවක්, වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර, මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇති විටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර වත්කම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

**(අ) ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්**

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා රඳවාගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ සහ හෝ පාඩු හරහා සාධාරන වටිනාකමට මුල් පිළිගැනීම මත නම්කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇත්නම් ඒවා වෙළඳාම සඳහා රඳාවගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

**(ආ) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබියයුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී ක්‍රමවේදයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතුකොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තිරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු අත්තිකාරම්, අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

**(ඇ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන**

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම්, මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇතිවිටදී, කල්පිරීම දක්වා රඳවා ගැනීම ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික මැනීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මනිනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන, කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබේ.

### (ඇ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .මූලික පිළිගැනීමට පසුව ,ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළි ආදායම සඵල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ .ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට ,අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

### 2.5 මූල්‍ය වත්කම් හානිවීම

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ .

### 3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ .

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත .අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ .

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ‘විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය’ අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත . කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

### 3.2 ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ .

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

### 3.4 ගොවි විශ්‍රාම අරමුදලේ බැරකම්

ගොවි විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනය කිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත.

## 4. විස්තීරණ අදායම් ප්‍රකාශනය

### 4.1 ආදායම

අ) මණ්ඩලයේ ආදායම රක්ෂණ වාරික, භාණ්ඩාගාර බිල්පත්වලින් සහ සේවක ණය සඳහා පොළී ආදායම සහ අනෙකුතු විවිධ ආදායම් නියෝජනය කරයි.

ආ) වාරික එකතුකිරීමෙන් ලත් සියලුව ආදායම් මුදල් පදනමකින් පිළිගනු ලැබේ.

### 4.2 ආදායම පිළිගැනීම

අ) විශ්‍රාම වැටුප් වාරික ආදායම රක්ෂිත කාලය සඳහා පිළිගනු ලැබේ .

ආ) ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර අදාළ වියදම් සමග ගලපනු ලැබේ.

ඇ) පොළී ආදායම කාල පදනමකින් උපචිත වේ .

### 4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් පිළිගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායමේ පිළිගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

### 4.4 වියදම

දරන ලද පිරිවැය සහ නිශ්චිත වියදම් අයිතම ඉපැයුම අතර සෘජු සම්බන්ධතාවයේ පදනමින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් පිළිගනු ලැබේ. මණ්ඩලය පවත්වාගෙන යාම සහ ප්‍රාග්ධන වත්කම්

කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලු වියදම්, වසර සඳහා අතිරික්තය සකස් කිරීමේදී ආදායමට බැර කර ඇත.

අංක 401/4 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම් පහත දැක්වෙන පරිදි වේ.

| **වියදම** | **අනුපාත** |
|---|---|
| වැටුප් .සේ.අ.අ,සේ.භා.අ , | 50% |
| වෛද්‍ය වියදම් | 50% |
| උපදේශන ගාස්තු | 40% |
| සුබසාධනය | 50% |
| නිල ඇඳුම් | 48% |
| සංග්‍රහ | 40% |
| මුද්‍රණ | 40% |
| නෛතික ගාස්තු | 60% |
| දැනුවත්කිරීම් හා පුහුණු | 20% |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 40% |
| කුලී, දුරකථන | 40% |
| තැපැල් ගාස්තු | 55% |
| විදුලි | 40% |
| ගමන්අතිකාල , | 50% |
| ජල බිල්පත් | 40% |
| දෛනික වේතන | 50% |
| ආරක්ෂක කටයුතු | 20% |
| කාර්යාලීය උපකරණ නඩත්තුව | 20% |
| වාහන නඩත්තුව | 57% |
| පරිගණක නඩත්තුව | 25% |
| ඉන්ධන වියදම් | 30% |
| ගොඩනැගිලි නඩත්තුව | 40% |
| ලිපි ද්‍රව්‍ය | 48% |

### 5. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ‘‘වක්‍ර ක්‍රමය ’’යොදා ගනිමිනි.

### 6. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල ප්‍රමාණවත් බව සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත.

## 7. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ආශ්‍රිත පාර්ශව ලෙස සලකනු ලැබේ. මෙම ආශ්‍රිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළිදරව් කරනු ලැබේ. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමයෙන් සහ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් පිළිවෙලින් රු. 295,230,441.79 ක් සහ රු. 518,000.00 වූ ණය ලබා ගෙන ඇත.

## 8. අනිශ්චිත අවස්ථා

මාවිල්ආරු අමුණ වසා දැමීමෙන් පීඩාවට පත් ගොවීන්ට වන්දි ගෙවීමේදී රුපියල් මිලියන 7කට ආසන්න මුදලක් සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් මණ්ඩලයේ නිලධාරීන් 3 දෙනෙකුට එරෙහිව නඩුවක් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ විභාග වෙමින් පවතින අතර සාවද්‍ය මුදල් පරිහරණය සම්බන්ධයෙන් ඔවුනට එරෙහිව මහාධිකරණයේදී අධිචෝදනා ගොනු කිරීමට නියමිතය.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**සටහන -01**

**2019 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ**

| විස්තරය | රථ වාහන | කාර්යාල උපකරණ | සුඛසාධන උපකරණ | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | වායු සමන යන්ත්‍ර | පරිගණක | ප්‍රචාරක උපකරණ | පරිගණක මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 ජනවාරි 1 දිනට පිරිවැය | 2,102,060.70 | 1,269,376.79 | 27,510.75 | 1,488,334.53 | 836,217.74 | 23,237,106.48 | 422,837.14 | 1,475,000.00 | 30,858,444.13 |
| එකතු කිරීම් | - | - | - | - | - | 453,600.00 | - | - | 453,600.00 |
| 2020 ජනවාරි 31 දිනට ප්‍රත්‍යාගණනය | 2,850,000.00 | - | - | - | - | - | - | - | 2,850,000.00 |
| ප්‍රත්‍යාගණන සංචිතය සඳහා මාරුකරන ලද සමුච්චිත ක්ෂය | (2,102,060.70) | - | - | - | - | - | - | - | (2,102,060.70) |
| **එකතුව** | **2,850,000.00** | **1,269,376.79** | **27,510.75** | **1,488,334.53** | **836,217.74** | **23,690,706.48** | **422,837.14** | **1,475,000.00** | **32,059,983.43** |
| ක්ෂය අනුපාතය % | 20% | 10% | 10% | 10% | 20% | 20% | 10% | 20% | |
| 2020 ජනවාරි 31 දිනට සමුච්චිත ක්ෂය | 2,102,060.70 | 1,257,436.79 | 22,373.92 | 963,441.32 | 580,565.12 | 22,843,142.50 | 422,837.14 | 1,475,000.00 | 29,666,857.49 |
| ප්‍රත්‍යාගණන සංචිතය සඳහා මාරුකරන ලද සමුච්චිත ක්ෂය | (2,102,060.70) | - | - | - | - | - | - | - | (2,102,060.70) |
| වසර සඳහා ක්ෂය | 570,000.00 | 1,440.00 | 518.00 | 71,959.60 | 95,216.22 | 297,724.02 | - | - | 1,036,857.84 |
| **මුළු ක්ෂයවීම** | -<br>**570,000.00** | -<br>**1,258,876.79** | -<br>**22,891.92** | -<br>**1,035,400.92** | -<br>**675,781.34** | **23,140,866.52** | **422,837.14** | **1,475,000.00** | **28,601,654.63** |
| **ශුද්ධ පොත් වටිනාකම** | **2,280,000.00** | **10,500.00** | **4,618.83** | **452,933.61** | **160,436.40** | **549,839.96** | - | - | **3,458,328.80** |

දේපළ, පිරියත හා උපකරණවලට 2019 දෙසැම්බර් 31 දිනට තවමත් භාවිතයේ පවතින රු.27,150,285.46ක දළ වටිනාකමක් සහිත පූර්ණව ක්ෂය කරන ලද වත්කම් ඇතුළත් වේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|
| | රු. ශත. | රු. ශත. |
| **සටහන 02- තොග** | | |
| මුද්‍රණ ද්‍රව්‍ය | 2,327,210.48 | 3,845,130.57 |
| ලිපිද්‍රව්‍ය තොග | 94,177.55 | 71,200.55 |
| | **2,421,388.03** | **3,916,331.12** |
| **සටහන 03 - ලැබිය යුතු දැ** | | |
| එකතුකිරීමේ නියෝජිතයන්ගෙන් ලැබිය යුතු දැ | 686,979.20 | 686,979.20 |
| තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු දැ | 18,644,043.00 | 14,046,120.00 |
| | **19,331,022.20** | **14,733,099.20** |
| **සටහන 04-කල්පිරීම දක්වා රඳවා ගත් ආයෝජන** | | |
| භාණ්ඩාගාර බිල්පත් -මහජන බැංකුව | 167,887,669.04 | 78,661,138.76 |
| | **167,887,669.04** | **78,661,138.76** |
| **සටහන 05- ලැබිය යුතු ආදායම** | | |
| ගොවීන්ගේ දායක මුදල | 1,855,808.48 | 1,926,490.50 |
| ජීවිත රක්ෂණ වාරික සඳහා ගොවීන්ගේ දායක මුදල | 304,770.00 | 292,200.00 |
| පරිපාලන වියදම් සඳහා ගොවීන්ගේ දායක මුදල | 152,385.00 | 146,100.00 |
| | **2,312,963.48** | **2,364,790.50** |
| **සටහන 06 - බැංකුවේ ඇති මුදල්** | | |
| ගි/අංක.100150112345 - මහජන බැංකුව යුනියන් පෙදෙස | 1,505,035.50 | 1,369,798.28 |
| ගි/අංක. 100180112344 - මහජන බැංකුව යුනියන්පෙදෙස | 316,097.82 | 451,897.56 |
| ගි/අංක. 100130112351 - මහජන බැංකුව යුනියන්පෙදෙස | 251,823.47 | 345,362.27 |
| ගි/අංක. 100110112347 - මහජන බැංකුවයුනියන්පෙදෙස | 120,693.93 | 205,103.38 |
| ගි/අංක. 8403704 - ලංකා බැංකුව යුනියන් පෙදෙස | 32,043.50 | 28,163.50 |
| එකතු කිරීමේ ගිණුම් | - | 922.00 |
| | **2,225,694.22** | **2,401,246.99** |
| **සටහන 07 - ගොවි විශ්‍රාම වැටුප සමුච්චිත අරමුදල** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | (71,616,681,986.31) | (67,774,374,700.81) |
| පෙර වසරේ ගැලපුම | - | (244,024,883.00) |
| | **(71,616,681,986.31)** | **(68,018,399,583.81)** |
| එකතුකළා / (අඩුකළා) | | |
| වියදමට වැඩි මුළු ආදායම | (3,816,631,143.49) | (3,598,830,287.64) |
| ආ.කෘ.සංවිධානයේ ප්‍රදානයෙන් පැවැරුම | - | 547,885.14 |
| | **(75,433,313,129.80)** | **(71,616,681,986.31)** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|
| | රු. ශත. | රු. ශත. |
| **සටහන 8 –ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 1,191,587.68 | 1,687,840.49 |
| එකතු කළා/(අඩුකළා) | | |
| රජයේ ප්‍රදානය සඳහා ක්‍රමක්ෂය | (466,857.84) | (516,932.81) |
| **වසර තුළ එකතු කිරීම්** | **453,600.00** | **20,680.00** |
| ඉදිරියට රැගෙන ආ ශේෂය | **1,178,329.84** | **1,191,587.68** |
| **සටහන 9- ගෙවිය යුතු දෑ** | | 13,257.84 |
| නියෝජිත ආයතන කොමිස් | 71,113.00 | 68,180.00 |
| කාර්ය මණ්ඩල ආරක්ෂක තැන්පතුව | 147,300.00 | 149,800.00 |
| කෘ.ගො.ර.ම.ජංගම ගිණුම | 115,174,191.84 | 116,771,772.45 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 3,882,863,789.00 | 3,729,229,532.00 |
| විශ්‍රාම වැටුප් කොමිස් මුදල | 14,128,535.00 | 14,096,909.00 |
| සමූහ රක්ෂණ වාරිකය | 229,485,744.00 | 212,449,360.00 |
| විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ණය | | |
| - ධීවර විශ්‍රාමවැටුප් යෝජනා ක්‍රමය | 564,335,972.90 | 613,222,811.96 |
| - කෘ.ගො.ර.ම | 480,304,114.75 | 442,880,695.94 |
| | **5,286,510,760.49** | **5,128,869,061.35** |
| **සටහන 10- උපචිත වියදම්** | | |
| මුද්‍රණ ගාස්තු සඳහා ප්‍රතිපාදන | 976,863.66 | 921,771.16 |
| උපචිත වියදම් | 395,145.00 | 834,675.00 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 4,086,601.00 | 3,043,630.00 |
| | **5,458,609.66** | **4,800,076.16** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

| | | 2019.12.31 | | 2018.12.31 |
|---|---|---|---|---|
| | | රු. ශත. | | රු. ශත. |
| | | | | |
| **සටහන 11 - අනෙකුත් ආදායම** | | | | |
| | | | | |
| විවිධ ආදායම | | 18,400.00 | | 17,250.00 |
| බැහැර කිරීම් ආදායම | | - | | 3,150.00 |
| | | **18,400.00** | | **20,400.00** |
| | | | | |
| **සටහන 12 - පරිපාලන වියදම්** | | | | |
| | | | | |
| වැටුප් සහ වේතන | | 80,683,797.20 | | 77,970,730.53 |
| සේ.අ.අ | | 8,791,903.78 | | 8,323,757.48 |
| සේ.හා.අ. | | 2,197,974.70 | | 2,080,963.92 |
| ගමන් සහ යැපුම් | | 3,535,580.63 | | 3,275,166.51 |
| අතිකාල | | 2,754,614.73 | | 2,426,441.80 |
| දෛනික වැටුප් | | 405,277.40 | | 248,984.53 |
| වෛද්‍ය වියදම් | | 592,911.00 | | 627,795.00 |
| පාරිතෝෂිකය | | 5,661,832.63 | | 6,698,438.19 |
| කාර්යමණ්ඩල සුබසාධනය | | 997,640.25 | | 1,138,534.22 |
| නෛතික ගාස්තු | | 596,024.80 | | 431,838.00 |
| කාර්යමණ්ඩල නිල ඇඳුම් | | 147,191.09 | | 148,810.32 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ස දහා දීමනා | | 221,000.00 | | 126,440.00 |
| උපදේශන ගාස්තු | | 1,200.00 | | - |
| කුලී | | 5,672,908.14 | | 5,810,189.10 |
| දුරකථන | | 2,255,710.06 | | 2,907,397.47 |
| තැපැල්ගාස්තු | | 3,371,461.12 | | 3,158,985.23 |
| ආරක්ෂක | | 187,340.00 | | 191,990.00 |
| විදුලිය | | 1,295,244.58 | | 1,397,990.75 |
| ජලබිල්පත් | | 184,515.69 | | 195,984.52 |
| විගණනගාස්තු | | 1,042,971.00 | | 300,000.00 |
| ඉන්ධන | | 2,513,471.34 | | 2,574,382.97 |
| දැනුවත්කිරීම සහ පුහුණුව | | 1,387,902.95 | | 2,557,386.63 |
| මුද්‍රණ | | 1,667,920.09 | | 32,673.07 |
| ලිපිද්‍රව්‍ය සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | | 3,484,535.24 | | 3,973,501.33 |
| සංග්‍රහ | | 140,332.05 | | 137,911.64 |
| රථවාහන නඩත්තුව | | 5,133,627.83 | | 4,047,574.40 |
| ගොඩනැගිලි නඩත්තුව | | 588,247.66 | | 218,447.20 |
| කාර්යාල උපකරණ නඩත්තුව | | 84,111.15 | | 83,350.42 |
| පරිගණක නඩත්තුව | | 260,529.74 | | 54,289.80 |
| ක්ෂයවීම | | 1,036,857.84 | | 516,932.81 |
| | | **136,894,634.69** | | **131,656,887.84** |
| | | | | |
| **සටහන 13 - මූල්‍ය සහ වෙනත්** | | | | |
| ණය පොළී | | 88,536,579.75 | | 113,924,094.32 |
| බැංකු ගාස්තු | | 44,774.81 | | 83,859.25 |
| | | **88,581,354.56** | | **114,007,953.57** |
| | | | | |

# 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන

## ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් | 2019.12.31<br>රු. ශත. | 2018.12.31<br>රු. ශත. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ,පිරියත හා උපකරණ | 1 | 126,346.12 | 145,982.12 |
| | | **126,346.12** | **145,982.12** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 2 | 105,756.95 | 160,745.22 |
| ලැබිය යුතු දෑ | 3 | 564,385,972.90 | 613,272,811.96 |
| කල් පිරීම දක්වා රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර | 4 | 133,916,454.67 | 95,698,669.85 |
| බැංකුවේ ඇති මුදල් | 5 | 1,007,606.50 | 1,227,278.89 |
| | | **699,415,791.02** | **710,359,505.92** |
| **මුළු වත්කම්** | | **699,542,137.14** | **710,505,488.04** |
| **ස්කන්ධ හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ධීවර විශ්‍රාම වැටුප් අරමුදල | 6 | (3,288,940,707.97) | (2,947,929,044.87) |
| මරණ පාරිතෝෂික අරමුදල | 7 | 28,062,614.70 | 26,661,514.70 |
| | | **(3,260,878,093.27)** | **(2,921,267,530.17)** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම වැටුප් බැරකම | | 3,915,569,738.11 | 3,590,887,003.60 |
| කාර්ය මණ්ඩල පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | | 2,103,156.27 | 1,773,659.44 |
| | | **3,917,672,894.38** | **3,592,660,663.04** |
| **ජංගම බැරකම්** | | | |
| මුළු ගෙවිය යුතු දෑ | 8 | 40,727,541.53 | 37,272,653.17 |
| උපචිත වියදම් | 9 | 2,019,794.50 | 1,839,702.00 |
| | | **42,747,336.03** | **39,112,355.17** |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | **699,542,137.14** | **710,505,488.04** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතා හා අනුකූල වේ

.....

මූල්‍ය අංශ ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ:

..... .....

අධ්‍යක්ෂ මණ්ඩල සමාජික
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල සමාජික
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනට විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

| | | 2019.12.31 | | 2018.12.31 |
|---|---|---|---|---|
| | | රු. ශත. | | රු. ශත. |
| | සටහන් | | | |
| | | | | |
| පොළී ආදායම | | 56,195,565.37 | | 72,880,417.59 |
| ධීවරයන්ගේ දායක මුදල | | 340,189.00 | | 284,062.50 |
| | | 56,535,754.37 | | 73,164,480.09 |
| අඩුකළා : | | | | |
| පරිපාලන වියදම් සඳහාපවරන ලද පොළී ආදායම | | (3,500,000.00) | | (3,500,000.00) |
| | | | | |
| අරමුදල සඳහා මූළු ආදායම | | **53,035,754.37** | | **69,664,480.09** |
| | | | | |
| **අඩුකළා : වියදම්** | | | | |
| ශුද්ධ දායකමුදල් ආපසු ගෙවීම් | | (811,818.00) | | (657,067.00) |
| ශුද්ධ පොළී ආපසු ගෙවීම | | (482,023.54) | | (332,176.00) |
| දිරි දීමනා ගෙවීම | | - | | (5,258.00) |
| සමූහ රක්ෂණ වාරිකය | | (1,769,100.00) | | (1,775,740.00) |
| විශ්‍රාම වැටුප්ගෙ වීම් සහ කොමිස් මුදල් | | | | |
| - විශ්‍රාම වැටුප් ගෙවීම් | | (63,346,699.00) | | (62,525,861.00) |
| - විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා කොමිස් මුදල් | | (826,665.00) | | (773,610.00) |
| **මූළු වියදම** | | **(67,236,305.54)** | | **(66,069,712.00)** |
| | | | | |
| **මෙ හෙ යුම්අ තිරික්තය /හිඟය** | | **(14,200,551.17)** | | **3,594,768.09** |
| | | | | |
| **ආදායම - පරිපා ලනය සඳහා** | | | | |
| | | | | |
| පරිපාලන වියදම්සඳහා පොළීආදායම | | 3,500,000.00 | | 3,500,000.00 |
| පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 1,500,000.00 | | 1,500,000.00 |
| | | **5,000,000.00** | | **5,000,000.00** |
| | | | | |
| | | **(9,200,551.17)** | | **8,594,768.09** |
| **අඩුකළා : වියදම්** | | | | |
| | | | | |
| පරිපාලන සහ ආයතනික වියදම් | 10 | (6,999,018.25) | | (6,347,217.98) |
| මූල්‍ය ගාස්තු | 11 | (7,500.00) | | - |
| මූළු පරිපාලන වියදම් | | **(7,006,518.25)** | | **(6,347,217.98)** |
| | | | | |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | | **(16,207,069.42)** | | **2,247,550.11** |
| | | | | |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම** | | | | |
| පාරිතෝෂික ලාභ/(අලාභ) | | (121,859.17) | | (241,154.46) |
| විශ්‍රාම බැරකම වැඩිවීම | | (324,682,734.51) | | (293,327,806.02) |
| | | **(324,804,593.68)** | | **(293,568,960.48)** |
| | | | | |
| **වසර සඳහා මූළුවිස් තීර්ණ ආදායම** | | **(341,011,663.10)** | | **(291,321,410.37)** |
| | | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය**

| | ධීවර විශ්‍රාම වැටුප් අරමුදල | මරණ පාරිතෝෂික | එකතුව |
|---|---|---|---|
| | | | |
| 2017දෙසැම්බර් 31 දිනට ශේෂය | (2,656,607,634.50) | 24,012,849.70 | (2,632,594,784.80) |
| ශුද්ධ අතිරික්තය | | | - |
| වියදම ඉක්මවූ ආදායම-ජීවිත රක්ෂණය | | 1,302,925.00 | 1,302,925.00 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(2,656,607,634.50)** | **25,315,774.70** | **(2,631,291,859.80)** |
| **වසර තුළ එකතුකිරීම් - 2018** | | | |
| ශුද්ධ අතිරික්තය | (291,321,410.37) | | (291,321,410.37) |
| වියදම ඉක්මවූ ආදායම-ජීවිත රක්ෂණය | . | 1,345,740.00 | 1,345,740.00 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(2,947,929,044.87)** | **26,661,514.70** | **(2,921,267,530.17)** |
| | | - | - |
| **වසර තුළ එකතුකිරීම් - 2019** | | | |
| ශුද්ධ අතිරික්තය | (341,011,663.10) | | (341,011,663.10) |
| වියදම ඉක්මවූ ආදායම-ජීවිත රක්ෂණය | | 1,401,100.00 | 1,401,100.00 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(3,288,940,707.97)** | **28,062,614.70** | **(3,260,878,093.27)** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|
| | රු. ශත. | රු. ශත. |
| **මෙහෙයුම් ක්‍රියා කාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ශුද්ධ අතිරික්තය | (341,011,663.10) | (291,321,410.37) |
| **පහත දැ සඳහා ගැලපුම්** | | |
| ක්ෂයවීම් | 19,636.00 | 19,636.00 |
| පාරිතෝෂික මත හිඟය/ලාභය | 121,859.17 | 241,154.46 |
| විශ්‍රාම බැරකමවැඩිවීම | 324,682,734.51 | 293,327,806.02 |
| විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 207,637.66 | 149,926.31 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | **(15,979,795.76)** | **2,417,112.42** |
| වට්ටෝරු භාණ්ඩවල (වැඩිවීම)/අඩුවීම | 54,988.27 | 15,376.45 |
| ලැබිය යුතුදෑ (වැඩිවීම)/අඩුවීම | 48,886,839.06 | 50,682,594.48 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | 3,454,888.36 | 6,885,815.72 |
| උපචිත වියදම් (වැඩිවීම)/අඩුවීම | 180,092.50 | (109,995.00) |
| | **52,576,808.19** | **57,473,791.65** |
| **මෙහෙයුම් ක්‍රියා කාරකම් වලින් උත්පාදිත මුදල්** | **36,597,012.43** | **59,890,904.07** |
| **මෙහෙයුම් ක්‍රියා කාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **36,597,012.43** | **59,890,904.07** |
| **ආයෝජන ක්‍රියා කාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| මූල්‍ය සාධනපත්‍ර | (38,217,784.82) | (60,671,746.77) |
| සමූහ ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා දායක මුදල | 1,769,100.00 | 1,775,740.00 |
| වසර තුළ ප්‍රතිලාභ | (368,000.00) | (430,000.00) |
| **ආයෝජන ක්‍රියා කාරකම් වලින්ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(36,816,684.82)** | **(59,326,006.77)** |
| **මූල්‍ය ක්‍රියා කාරකම් වලින්ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| | - | - |
| **මූල්‍ය ක්‍රියා කාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | - | - |
| **මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | **(219,672.39)** | **564,897.30** |
| **වසර ආරම්භයේදී මුදල් සහ මුදලට සමාන දෑ** | 1,227,278.89 | 662,381.59 |
| **වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ** | **1,007,606.50** | **1,227,278.89** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2019 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

## 1. පොදු ප්‍රතිපත්ති

### 1.1 වාර්තාකරණ අස්තිත්වය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ලය (මෙහි මින්මතු 'මණ්ඩලය' ලෙස සඳහන් කරනු ලබන) 1990 අංක 20 දරන පනතෙන් සංස්ථාගත කරන ලද අතර නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාරාම පාරේ අංක 20 දරන ස්ථානයේ පිහිටා ඇත. ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ස්ථාපිත කරනු ලැබුයේ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ විධිවිධාන ප්‍රකාරවය.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

ධීවරයන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

### 1.3 පිළියෙල කිරීමේ පදනම

**(අ) අනුකූලතා ප්‍රකාශනය**

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, අරමුදල් සහ සංචිතවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම ගිණුම් ප්‍රකාශන ශ්‍රීලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) ප්‍රකාරව පිළියෙල කර ඇත.

**(ආ) මැණීම් පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණ කරනු ලබන විටදී හැරුණු විට මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

**(ඇ) සන්සන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීම ඉහළ නැංවීම පිණිස සහ අන්තර් කාලසීමා සන්සන්දනීයභාවය වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තාකොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාලසීමාවට අදාළ ප්‍රමාණාත්මක, වෘත්තාන්තමය සහ විස්තරාත්මක ඇතුළු සන්සන්දානාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත්කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති විටදී වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්ථන වසර සමග අනුකූලවන සේ සන්සන්දනාත්මක මුදල් ප්‍රමාණ ප්‍රතිවර්ගීකරණය කර ඇත.

**(ඇ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය**

මෙම මුදල් ප්‍රකාශ මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත

**(ඉ) තක්සේරු හා කිරණ භාවිතය**

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර /.ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාකරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තින්දු, තක්සේරු සහ සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරිත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ.ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම අදාළ කාලසීමාවට පමණක් බලපාන්නේ නම්,ඒවා පිළිගනු ලබන්නේ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇති කාලසීමාව තුළ වන අතර ප්‍රවර්තන හා යම් අනාගත කාල සීමාවන්ට එම ප්‍රතිශෝධනය බලපාන්නේ නම් ප්‍රතිශෝධන කාලසීමාව හා අනාගත කාලසීමාවන් සඳහා ද පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑම් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු, අවිනිශ්චිතතා සහ තීරණාත්මක තින්දු පිළිබඳ සැලකිය යුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල අඩංගු කර ඇත.

**ඊ) ප්‍රවර්තන ව්‍යාපාරය (අඛණ්ඩ පැවැත්ම)**

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවැතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය තක්සේරුවක් කර තිබේ. එබැවින් ප්‍රවර්තන ව්‍යාපාරයක පදනමින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

**2. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම**

**2.1 දේපළ, පිරියත හා උපකරණ**

**(අ) පිළිගැනීම සහ ගණනය කිරීම**

දේපල, පිරියත හා උපකරණ අයිතම ප්‍රකාශ කර ඇත්තේ එකතු වූ  ක්ෂය කිරීම් හා හානි අලාභ අඩුකොට පිරිවැයට හෝ තක්සේරුවටය.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ වටිනාකමේ සමුච්චිත හානිවීම් අඩුකර පිරිවැයටය.  වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපළක, පිරියතක හෝ උපකරණයක සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනක කරනු ලැබීමට අවශ්‍ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස පිළිගැනීමෙන් ඉවත් කර නව

කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම සහිතව අස්තිත්තවය මගින් පිළිගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

රු. 686,080.42 ක මුළු ඓතිහාසික පිරිවැයක් සහිත සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුලත් කර තිබේ.

**(අ) පිරිවැය**

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙනඒම සඳහාවූ කිසියම් සෘජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂාකිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපල, පිරියත හෝ උපකරණ අයිතමයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

**(ඇ) ප්‍රත්‍යාගණනය**

වත්කමක් ලෙස පිළිගැනීමෙන් පසුව, සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැණිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි, කිසියම් තදනන්තර සමුච්චිත ක්ෂය සහ තදනන්තර සමුච්චිත හානි අලාභ අඩු කොට ප්‍රත්‍යාගණනය සිදුකළ දිනයට ප්‍රත්‍යාගණන වටිනාකමට දක්වා තිබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ වටිනාකම වාර්තාකරණ දිනයේදී එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම පිණිස තක්සේරු කිරීම් සිදුකරනු ලැබේ.

මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබූ එම වත්කමෙම කිසියම් පූර්ව අඩුවීමක් හිලව් කරන්නේ නම් හැර ප්‍රත්‍යාගණන වටිනාකමේ කිසියම් වැඩිවීමක් ස්කන්ධයේ ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලැබේ. වටිනාකමේ අඩුවීමක්, ප්‍රත්‍යාගණන සංචිතයේ කළින් හඳුනාගනු ලැබූ වැඩිවීමක් ඉක්මවා යන විටදී ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු  ලැබේ. බැහැර කිරීමේදී, යම් ආශ්‍රි ප්‍රත්‍යාගණන සංචිතයක් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලබන අතර බැහැර කිරීම මත ලාබ හෝ අලාබ තීරණය කිරීමේදී ගිණුම්වලට ගනු නොලැබේ

.

**(ඇ) ක්ෂයවීම්**

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තිරණ ආදායම් ප්‍රකාශයේ වැයබරක් සේ දක්වනු ලබයි.

| | |
|---|---|
| කාර්යාල උපකරණ | 10% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| සුඛසාධන උපකරණ | 10% |
| පරිගණක | 20% |

**2.2 අස්පෘශ්‍ය වත්කම්**

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්වයක් තිබෙනම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. -38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිළිගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි අලාබ අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ.

පරිගණක මෘදුකාංග සරලරේඛීය ක්‍රමය මත වසර 5 ක කාලා සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

**2.3 වට්ටෝරු භාණ්ඩ**

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධිකළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය. මෙම පිරිවැයට තොග හා භාණ්ඩ අත්කරගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට ගෙන ඒමට දරන ලද වියදමද ඇතුලත්ය.

**2.4 මූල්‍ය වත්කම්**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධියක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකම ධන ලෙසත් ලාභ හෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ආරම්භයේදී ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිත කළ වත්කම් ඇතුළුව) ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසාන වීමේදී හෝ මූල්‍ය වත්කමක හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැළකියයුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත්කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවාගනු ලැබූ යම් බැදියාවක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇතිවිටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර බැරකම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ .

**(අ) ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්**

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳහා සඳහා රඳවා ගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම් කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇත්නම්, ඒවා වෙළඳාම සඳහා රඳවාගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වනු ලැබේ.

**(ආ) ණය සහ ලැබිය යුතු මුදල්**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතාකරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කරගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී අනුපාතයේ අනුකලක කොටසක්වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි.සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ

අන්තර්ගත කරනු ලැබේ . හානිවීම් හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, අනෙකුත් ලැබුය යුතු දෑ සම මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

**(ඇ) කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන**

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම් මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇතිවිටදී ඒවා කල්පිරීම දක්වා රඳවා ගැනීම සේ වර්ගීකරණය කරනු ලැබේ. මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල අයෝජන, කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබේ.

**(ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .මූලික පිළිගැනීමට පසුව ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළි ආදායම සඵල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ .ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

### 2.5.1 මූල්‍ය වත්කම් හානි

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ .

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ .

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත .අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ .

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූර්ණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත . කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

### 3.2 ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ .

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

### 3.3 ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම්

ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනය කිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත.

## 4. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

### 4.1 ආදායම

අ) මණ්ඩලයේ ආදායම රක්ෂණ වාරික, භාණ්ඩාගාර බිල්පත්වලින් සහ සේවක ණය සඳහා පොළී ආදායම සහ අනෙකුත් විවිධ ආදායම් නියෝජනය කරයි.

ආ) වාරික එකතු කිරීමෙන් ලත් සියලු ආදායම් මුදල් පදනමකින් පිළිගනු ලැබේ.

### 4.2 ආදායම පිළිගැනීම

අ) විශ්‍රාම වැටුප් වාරික ආදායම බදවා ගන්නා අවස්ථාවේදී පිළිගනු ලැබේ .

ආ) ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර අදාළ වියදම් සමග ගලපනු ලැබේ.

ඇ) පොළී ආදායම කාල පදනමකින් උපචිත වේ .

### 4.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් පිළිගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායමේ පිළිගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

### 4.4 වියදම

ධීවර විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙන යාමේදී දරන ලද සියලු වියදම් වර්ෂය සහා අතිරික්තය හෝ හිඟය තීරණය කිරීමේදී උපචිත පදනමකින් ආදායමට වැය බරක් සේ දක්වා ඇත.

අංක 401/4 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම් පහත දැක්වෙන පරිදි වේ.

| **වියදම** | **අනුපාත** |
|---|---|
| කුලීදුරකථන , | 5% |
| තැපැල් ගාස්තු, ජල ගාස්තු | 5% |
| විදුලිය | 5% |
| ප්‍රධාන කාර්යාල උපකරණ | 5% |
| ගොඩනැගිලි නඩත්තුව | 5% |
| වාහන නඩත්තුව | 3% |
| ඉන්ධන | 2% |
| ලිපි ද්‍රව්‍ය | 2% |
| නිල ඇඳුම් | 2% |
| ආරක්ෂක | 5% |
| පරිගණක වියදම් | 5% |

## 5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ “වක්‍ර ක්‍රමය ” යොදා ගනිමිනි.

### 6. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල ප්‍රමාණවත් බව සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත.

### 5. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලැබේ. මෙම සම්බන්ධිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළිදරව් කරනු ලැබේ. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට රු. 518,000,000 ක ණයක් ලබා දී ඇත.

### 6. අනිශ්චිත අවස්ථා

**ලැබිය යුතු පොළී**

1996 දී භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනය මත පොළී අහිමිවීම සම්බන්ධයෙන් මණ්ඩලය ලංකා බැංකුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත.

විස්තර පහත පරිදිය.

| නඩු අංකය | මුදල රු)) |
|---|---|
| MR 21843 | 1,454,670.84 |
| MR 21844 | 1,172,602.46 |
| MR 21845 | 2,784,657.55 |

අභියාචනය ගාස්තුවට යටත් කොට ප්‍රතික්ෂේප කරන ලදී.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
2019 දෙසැම්බර් 31 දිනට
**ගිණුම් සඳහා සටහන්**

**සටහන -01**
දේපළ, පිරියත සහ උපකරණ

| විස්තරය | කාර්යාල උපකරණ | සුබසාධන උපකරණ | ලීබඩු සහ සවිකිරීම් | පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට පිරිවැය | 528,648.50 | 1,325.00 | 78,876.92 | 264,945.00 | 873,795.42 |
| එකතු කළා | - | - | - | - | - |
| **2018 දෙසැ.31 දිනටමුළු පිරිවැය** | **528,648.50** | **1,325.00** | **78,876.92** | **264,945.00** | **873,795.42** |
| ක්ෂයවීම් අනුපාතය | 10% | 10% | 10% | 20% | |
| සමුච්චිත ක්ෂය වීම 2019 ජනවාරි 1 දිනට | 403,552.96 | 1,325.00 | 61,064.42 | 261,870.92 | 727,813.30 |
| වර්ෂය සඳහා ක්ෂයවීම | 14,792.00 | - | 2,850.00 | 1,994.00 | 19,636.00 |
| **මුළු ක්ෂයවීම** | **418,344.96** | **1,325.00** | **63,914.42** | **263,864.92** | **747,449.30** |
| **ශුද්ධ පොත් වටිනාකම** | **110,303.54** | **-** | **14,962.50** | **1,080.08** | **126,346.12** |

දේපළ, පිරියත හා උපකරණවලට 2019 දෙසැම්බර් 31 දිනට රු 686,080.42 ක ඓතිහාසික පිරිවැයක් සහිත තවමත් භාවිතයේ පවතින පූර්ණව ක්ෂයකරන ලද වත්කම් ඇතුලත් වේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**

| | 2019.12.31 | 2018.12.31 |
|---|---|---|
| | රු. ශත. | රු. ශත. |
| **සටහන 02 - කොමිසම** | | |
| මුද්‍රණ ද්‍රව්‍ය | 105,756.95 | 160,745.22 |
| | 105,756.95 | 160,745.22 |
| **සටහන 03 - ලැබිය යුතු දෑ** | | |
| ගොවි විශ්‍රාම වැටුප් ණය | 564,335,972.90 | 613,222,811.96 |
| මරණ පාරිතෝෂික අත්තිකාරම් | 50,000.00 | 50,000.00 |
| | 564,385,972.90 | 613,272,811.96 |
| **සටහන 04 - කල්පිරීම් තෙක් රඳවා ගත් මූල්‍ය සාධන පත්‍ර** | | |
| භාණ්ඩාගාර බිල්පත් -ලංකා බැංකුව | 133,916,454.67 | 95,698,669.85 |
| | 133,916,454.67 | 95,698,669.85 |
| **සටහන 05- බැංකුවේ ඇති මුදල්** | | |
| ගි.අංක.164790 ලංකා බැංකුව යූනියන් පෙදෙස | 324,626.90 | 399,609.07 |
| ගි.අංක.164795 ලංකා බැංකුව යූනියන් පෙදෙස | 507,735.60 | 735,036.82 |
| එකතු කිරීම් ගිණුම | 175,244.00 | 92,633.00 |
| | 1,007,606.50 | 1,227,278.89 |
| **සටහන 06 - ධීවර විශ්‍රාම වැටුප් සමුච්චිත අරමුදල** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | (2,947,929,044.87) | (2,656,607,634.50) |
| වර්ෂය තුළදී එකතුකිරීම් | | |
| වසර සඳහා මුළුඅතිරික්තය /(හිඟය) | (341,011,663.10) | (291,321,410.37) |
| | (3,288,940,707.97) | (2,947,929,044.87) |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**

| | 2019.12.31 | | 2018.12.31 |
|---|---|---|---|
| | රු. ශත. | | රු. ශත. |
| | | | |
| **සටහන 7 - මරණ පාරිතෝෂික අරමුදල** | | | |
| | | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 26,661,514.70 | | 25,315,774.70 |
| එකතුකළා: | | | |
| වසර සඳහා දායක මුදල් | 1,769,100.00 | | 1,775,740.00 |
| අඩුකළා: | | | |
| මරණ පාරිතෝෂික ගෙවීම් | (368,000.00) | | (430,000.00) |
| | (368,000.00) | | (430,000.00) |
| | 1,401,100.00 | | 1,345,740.00 |
| | | | |
| | 28,062,614.70 | | 26,661,514.70 |
| | | | |
| **සටහන 08 - ගෙවිය යුතු දෑ** | | | |
| | | | |
| ගෙවියයුතු -විශ්‍රාමවැටුප්ගෙවීම | 254,423.00 | | 2,793,811.00 |
| ගෙවියයුතු-කෘෂිකාර්මිකරක්ෂණ යෝජනා ක්‍රමය | 40,070,084.53 | | 34,353,102.71 |
| ගෙවියයුතු - ආපසු ගෙවිය යුතු දායක මුදල් | 90,746.00 | | 32,195.00 |
| ගෙවියයුතු - මරණ පාරිතෝෂිකය | 98,000.00 | | 58,000.00 |
| ගෙවියයුතු -දිරිදීමනා | 325.00 | | 325.00 |
| ගෙවියයුතු - දායක මුදල් මත ආපසු ගෙවන පොළිය | 122,596.00 | | 35,219.46 |
| ගෙවිය යුතු ගො.වි.වැ.යෝජනා ක්‍රමය | 91,367.00 | | |
| | 40,727,541.53 | | 37,272,653.17 |
| | | | |
| | | | |
| | | | |
| **සටහන 9 - උපචිත වියදම්** | | | |
| | | | |
| මුද්‍රණ ගාස්තු | 570,092.50 | | 590,000.00 |
| නෛතික ගාස්තු | 17,000.00 | | 17,000.00 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,432,702.00 | | 1,232,702.00 |
| | | | |
| | 2,019,794.50 | | 1,839,702.00 |
| | | | |
| | | | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**

| | | 2019.12.31 | | 2018.12.31 |
|---|---|---|---|---|
| | | රු. ශත. | | රු. ශත. |
| **සටහන 10 - පරිපාලන වියදම්** | | | | |
| වැටුප් සහ වේතන | | 2,661,894.51 | | 2,454,758.47 |
| සේ.අ.අ දායක මුදල් | | 316,414.29 | | 278,793.14 |
| සේ.හා.අ. දායක මුදල් | | 79,106.06 | | 69,649.20 |
| විශේෂ දීමනා | | 418,404.00 | | 449,034.00 |
| පාරිතෝෂික | | 207,637.66 | | 149,926.31 |
| ඉන්ධන | | 167,564.76 | | 171,625.53 |
| ලිපි ද්‍රව්‍ය | | 161,870.74 | | 155,980.75 |
| මුද්‍රණ | | 223,420.27 | | 137,023.95 |
| නෛතික ගාස්තු | | 409,000.00 | | 401,500.00 |
| කාර්ය මණ්ඩල නිලඇඳුම් | | 6,132.96 | | 6,200.43 |
| කුලී | | 709,113.52 | | 726,273.64 |
| දූරකථන | | 281,963.76 | | 363,424.68 |
| තැපැල් ගාස්තු | | 133,780.10 | | 120,175.93 |
| ජල බිල්පත් | | 23,064.46 | | 24,498.07 |
| ආරක්ෂක | | 46,835.00 | | 47,997.50 |
| විදුලිය | | 161,905.57 | | 174,748.84 |
| රථ වාහන නඩත්තුව | | 385,022.09 | | 303,568.08 |
| ගොඩනැගිලි නඩත්තුව | | 73,530.96 | | 27,305.90 |
| කාර්යාල උපකරණ නඩත්තුව | | 21,027.79 | | 20,837.61 |
| පරිගණක වියදම් | | 291,693.75 | | 94,259.95 |
| ක්ෂය වීම | | 19,636.00 | | 19,636.00 |
| විගණන ගාස්තු | | 200,000.00 | | 150,000.00 |
| | | **6,999,018.25** | | **6,347,217.98** |
| | | | | |
| **සටහන 11 - මූල්‍ය ගාස්තු** | | | | |
| | | | | |
| බැංකු ගාස්තු | | 7,500.00 | | - |
| | | **7,500.00** | | **-** |
| | | | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඑල්/ඊ/ ඒඒඅයිබී /01/ 19/15 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 අගෝස්තු 28 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යාථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්- 01. ලේකම් - කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරි මාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධනඅමාත්‍යාංශය

02. ලේකම් - මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශය

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 agj@auditorgeneral.gov.lk www.naoal.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ] ජ්ජිඑල්/ඊ/ ජ්ජ්අයිබී /01/ 19/15 ඔබේ අංකය / உமது இல. / Your No. ] දිනය / திகதி / Date ] 2020 අගෝස්තු 18 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 agi@auditorgeneral.gov.lk www.naod.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රීය දායකයන් හඳුනා ගැනීම සහ ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද එසේ කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල සඳහා රු.19,016,134 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි පවත්වාගෙන යන නිල නිවාසයන්හි යෝජනා ක්‍රමයට අයත් පර්චස් 76.6 ක ඉඩම් වටිනාකම තක්සේරුකර ගිණුම් වලට ගෙන නොතිබුණි. එසේම 1986 ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් සින්නක්කරව පවරන ලද ඇඹිලිපිටිය නිල නිවසේ ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය යෝජනා ක්‍රමය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මෙහෙයුම් කාර්යක්ෂම හා ඵලදායී මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය අදහස්, විශ්වාස හා මැදිහත් වීම් බලපෑ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මුල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය මිදූ නිරීක්ෂණ රය ගැබ්වීමේ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මුල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මෙහෙරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් මිදුවන බලපෑමට වඩා වංචාවකින් මිදී වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුෂ්සන්ධානය, වාර්ථ ලේඛන සැකසීම, වෙනහැරවීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම සිමිත ඒකීය යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවශෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- මිද්ධියන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන

සාක්ෂි මත පදනම්ව නිගමනයකරණය සඳහා ආයතනයේ අභ්‍යන්තර පැවැත්ම පිළිබඳ සඳහන් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූලා ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අභ්‍යන්තර පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූලා ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, වර්ගය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූලා ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූලා වාර්තා යෝජනා ක්‍රමය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ මූලා ප්‍රකාශන ඉතුරුම් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) සහ (ආ) නිරීක්ෂණ හැර ඉතුරුම් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිරීක්ෂණයන් ඉදිරිපත් කරන ලද මූලා ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්තා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට මිතා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරුණු කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ පාලන මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට යෝජනා ක්‍රමය සම්බන්ධව යම් නිවැසුමක් සම්බන්ධයෙන් කළුවූ හෝ අහඹකාරයකින් සංගතය වාගාරීන තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ නීතියකට යෝජනා ක්‍රමයේ පාලන මණ්ඩලය විසින් නීතියක් කරන ලද වෙනත් හොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ බලපත්‍ර , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ සම්පත් ඝනකුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස භාවිතයවන් ඉඳ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රශමිපාදනය කර නොමැති බව

3. **අනෙකුත් විගණන නිරීක්ෂණය**

(අ) ඇඩිලිසිටියේ සිමිට් නිල නිවාසය අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමකින් තොරව වර්ෂ 21 කට අධික කාලයක සිට අභාවිතව පවතී.

(ආ) මහනුවර, අම්පාර, මහාමිඩිය හා මඩව යන ප්‍රදේශයන්හි කෘෂිකාර්මික හා පොළිජන රක්ෂණ මණ්ඩලයට දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉඩම් පවරාගෙන තිබුණද, එම ඉඩම්වල තොටහැකිලි ඉදිකිරීමට කටයුතු නොකර එදින සිට වසර 2-12 දක්වා කාලයක සිට රාජ්‍ය හා පෞද්ගලික කුලී තොටහැකිලිවල කාර්යාල පවත්වාගෙන යමින් තිබුණි.

(ඇ) 2008 ජුනි 04 දින ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට මණ්ඩලය විසින් කාර්යාල තොටහැකිල්ලක් ඉදිකිරීම ඇරැයුම්කරුට ගෙවා තිබූ රු.565,800 ක මුදල් භාවිත ප්‍රතිපූර්ණය කළ නොහැකි බව එම අංශකය දන්වා තිබුණ ද වගකීම අත්හැරීම නිසා හෝ මුදල් අහෝසි වූවත් එය ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස ජංගම වත්කම් යටතේ තබාගෙන තිබුණි.

(ඇ) වසර 5 – 25 අතර කාලයක සිට පැවත එන එකතුව රු.692,302 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් සේවක පාරිතෝෂිතයෙන් හෝ ඇප කරුවන්ගෙන් කාලීනව අයකර ගැනීමකින් තොරව ගිණුම් වල ඉදිරියට එමින් පවතී.

(ඉ) වසර 5-15 අතර කාලයක සිට ඉදිරියට එමින් පැවතුණු එකතුව රු.708,347ක ප්‍රතිපූර්ණය කරගත යුතු වැටුප් , වැටුප් අත්තිකාරම් හා මිශ්‍ර ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීමකින් තොරව ගිණුම් වල ඉදිරියට එමින් පවතී.

(ඊ) කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකාව සඳහා ඩීජිටල් ආර්ථික උපාය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා මධ්‍යගත කෘෂිකාර්මික තොරතුරු පද්ධතිය ගොඩනැංවීමට සැලසුම් කර තිබුණි. ගම්පහ හා බදුල්ල දිස්ත්‍රික්කයන් මූලික කර ගනිමින් ගොවීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ගොඩනැංවීම, ශ්‍රී ලංකාව සඳහා ගොවිබිම් හඳුනා ගැනීම හා ඒවා පරිගණක ගත කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ගම්පහ දිස්ත්‍රික්කය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති දත්ත පාදම යොදාගැනීමට අපේක්ෂා කළද මණ්ඩලය මගින් ව්‍යාපෘතිය කරගෙන යාමේදී එම දත්ත පද්ධතිය සෘජුවම අදාළ කරගත නොහැකිවීම පිළිබඳ හඳුනාගත් දුර්වලතා, කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගෙන් ඇතිවූ විරෝධතා හා ඇතිවූ මූල්‍යමය දුෂ්කරතා හේතුවෙන් ගම්පහ හා බදුල්ල දිස්ත්‍රික්කයන්ගේ පිළිවෙලින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 26ක ඉඩම් කැබලි 80,006ක් හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 10ක ඉඩම් කැබලි 27,139කින් සිතියම්ගත කර අවසන් කිරීමට හැකිව තිබුනේ කැබලි 10,825 ක් හා 9,955 ක් පමණි. මාස 07ක කාලයක් පමණක් ක්‍රියාත්මක වී අතරමග නතර කර ඇති මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක නොකරන්නේ නම් මේ සඳහා මෙතෙක් දරු රු.9,610,720 ක වියදම නිෂ්කාර්ය වියදමක් විය හැකි බව නිරීක්ෂණය කෙරේ.

(උ) නොමිලේ රක්ෂණය යටතේ රක්ෂණය හිමි ගොවීන්ට වගා හානි වන්දි ගෙවීමට මහා භාණ්ඩාගාරය විසින් අග්‍රිම මුදල් ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් 2017/2018 මහ හා 2018 යල කන්නයේ වගා හානි වන්දි ගෙවීම වර්ෂයක කාලයක් ප්‍රමාද වී 2019 යල කන්නයේදී සිදුකර තිබුණි. එමෙන්ම 2018/2019 මහ කන්නය වෙනුවෙන් වගා හානි වූ ගොවීන් 20,100 කට අදාළ රු.598,972,934ක වන්දි මුදල් ගෙවා තිබුනේ 2020 පෙබරවාරි එනම් 2019/2020 මහ කන්නයේදීය. මේ අනුව නොමිලේ රක්ෂණ වැඩ සටහනෙහි යම් අකාර්යක්ෂම බවක් නිරීක්ෂණය විය. නිසි කලට වන්දි මුදල් නොලැබීම නිසා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය කෙරෙහි ගොවීන්ගේ

විශ්වාසය බිඳවැටී ඇතිබව පොළොන්නරුව, අනුරාධපුරය හා කුරුණෑගල දිස්ත්‍රික්ක ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී වැඩිදුරටත් අනාවරණය විය.

(ඌ) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය ආයතනය සමග එක්ව 2016 මැයි 05 සිට 2019 මැයි අතර කාලය තුළ දිස්ත්‍රික්ක 6 ක දර්ශක මත පදනම්වූ රක්ෂණ ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාවට නැංවීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණද 2018/2019 මහ කන්නයේදී වවුනියාව, අනුරාධපුරය, කිලිනොච්චිය හා මුලතිව් යන දිස්ත්‍රික්කවල පර්යේෂණ මට්ටමින් එය ක්‍රියාත්මක කර තිබුණි. හානි තක්සේරුව සඳහා නවීන ක්‍රම හඳුන්වා දීමට දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂා කර තිබුණද වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් මෙම ක්‍රමය යටතේ වන්දි ගණනය කර තිබුණි.

(එ) 2018 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා අනිවාර්ය බෝග වර්ග 6 වෙනුවෙන් නොමිලේ රක්ෂණය සඳහා පසුගිය වසර කිහිපයක හානි වාර්තා අනුව ගෙවූ උපරිම රක්ෂණ වගකීම් වටිනාකම රු.5,000,000,000 ක් පමණ විය හැකි රක්ෂණ වගකීමට ප්‍රතිරක්ෂණ වටිනාකම රු.3,500,000,000 ක් වුවත්, මහ බැංකු වාර්තාවේ දත්ත නිවැරදිව යොදා නොගැනීම නිසා රක්ෂණ වගකීම් වටිනාකම රු.7,500,000,000 ක් ලෙස තීරණය කර රු.5,315,000,000 ක ප්‍රතිරක්ෂණ වගකීමට ආයතනය එළඹීම හේතුවෙන් රු.1,815,000,000 ක් වැඩියෙන් තක්සේරු කර තිබුණි.
ඉහත සඳහන් ප්‍රතිරක්ෂණයට අදාළ ගිවිසුම අනුව රු.2,185,000,000 ක් දක්වා වන්දි වටිනාකම මණ්ඩලය විසින් දැරීමටද රු.1,500,000,000 ක වන්දි මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලින් දැරීමෙන් පසු ප්‍රතිරක්ෂණයට යාමට හිමිකම් පවතී. ප්‍රතිරක්ෂණ වාරික වටිනාකම වූ රු.675,760,000 ක් මණ්ඩලය විසින් ගෙවීම මත රු.4,360,760,000 ක් දේශීයව වන්දි වෙනුවෙන් දරනු ලබයි. 2018 යල හා 2018/19 මහ කන්න වෙනුවෙන් ගෙවන ලද මුලු වන්දි වටිනාකම රු.1,016,824,823ක් වීමෙන් විදේශීය ප්‍රතිරක්ෂණ වාරික ලෙස ගෙවූ රු.473,032,000 ක මුදල නිශ්කාර්ය වියදමක් විය.

(ඒ) 2019 යල කන්නයට වාර්තාගත විය හැකි මුළු වන්දි වටිනාකම වූ රු.මිලියන 1,284 හි මුල් රු.10,000 ගෙවීම සඳහා රු.මිලියන 613ක් රක්ෂණ භාර අරමුදලින් ලැබී තිබුණි. 2019 යල කන්නය සඳහා රක්ෂණ භාර අරමුදල සමඟ ඇතිකරගත් ප්‍රතිරක්ෂණ ගිවිසුම අනුව මෙම මණ්ඩලයේ වගකීම වූ රු.මිලියන 359 ඉවත්කළ පසු රක්ෂණ භාර අරමුදල වෙතින් තව දුරටත් ලබා ගෙයුතු රු.මිලියන 312ක හිඟ මුදල මෙතෙක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්යමණ්ඩල තනතුරු 421 තුළ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 19 ක්, මාණ්ඩලික නොවන තනතුරු 98 ක් හා කණිෂ්ඨ ශ්‍රේණියේ තනතුරු 22 ක් වශයෙන් ප්‍රරක්ෂාඩු 139 ක සංඛ්‍යාවක් පැවතිණි. මෙම හිඟතාව ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලයන්හි කාර්යාල හා ක්ෂේත්‍ර රාජකාරි කටයුතු කාර්යක්ෂමව හා ප්‍රමාදයකින් තොරව ඉටුකිරීමට බාධාවක්වී පැවතිණි. මේ හේතුවෙන් මණ්ඩලය විසින් බොහෝමාත් නිලධාරීන් 13ක් හා දෛනික දීමනා ලබන සුළුතර නිලධාරීන් 48 ක් යොදා ගනිමින් ස්ථිර කාර්ය මණ්ඩලයේ කාර්යභාරය ඉටු කරවා ගෙන තිබුණි.

ඩබ්ලිව්.බී.ඒ. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඑල්/ඊ/ෆාමර්ස්/1/19/02 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි 17 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත්:- 1. ලේකම් - ලේකම් - කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය


අංක 306/72, කොළඹුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, Kolkata Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 agjfunditorgmaral.gov.lk www.naral.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } එජවල/3/ පෙ/සිවස්/01/19/02 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි 27 දින

සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ගොවි විශ්වාස වැටුප් හා යමාන්ත ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සමිතිඝෝධන වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාවබෝධය කළ මිනය**

ගොවි විශ්වාස වැටුප් හා යමාන්ත ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මිශ්‍රිතම වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් මිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාවබෝධය කළ මිනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා මිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මිනය වේ.




No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මිනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් බැහැරවීම

ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රීය දායකයන් හා ගොඩ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණනය තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2019 දෙසැම්බර් 31 දිනට වූ විශ්‍රාම වැටුප් වගකීම එවැනි ආයු ගණනය තක්සේරුවක් සිදු කිරීමකින් තොරව රු.70,252,869,112ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයේ ඉදිරි වත්කම් සමාලෝචිත වර්ෂය අවසානයට රු.74,347,975,129 ක් ණය යෝජයක් ගෙන තිබූ අතර ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් රු.5,098,968,963ක් වී තිබුණි. තවද 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන ගොඩ විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ නියෝග පරිදි 2014 ජනවාරි 01 දින සිට විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කළද දායක මුදල් අයකර ගැනීම 1987 මැයි 07 දිනැති අංක 452/12 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබූ ක්‍රමය පරිදි සිදුකර නිබුණි. ඒ අනුව 2018 හා 2019 වර්ෂ වලදී ගොඩ දායකත්වය මිළිවෙලින් රු.24,552,961ක් හා රු.21,495,773ක් වූ අතර විශ්‍රාම වැටුප් ගෙවීම් මිළිවෙලින් රු.3,059,370,767 ක් හා රු.3,217,332,522 ක් වී තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම් ඉහළ යාම නිසා 2018 හා 2019 වර්ෂ වලදී මිළිවෙලින් රු.2,725,000,000 ක් හා රු.3,065,000,000ක් භාණ්ඩාගාරය මගින් ලැබී තිබූ අතර භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මිනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සංවේදී ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිරූපණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේඅඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීනව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම මිනිස බෙර්ජනා මූලිකයේ අභ්‍යන්තර පාලනය ඇගයීම්වලින් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හවිතා කරන ලද මිණුම්කරන ප්‍රතිපත්තිවල සහ මිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල පෝෂකභාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් සේතුවෙන් මෙර්ජනා මූලිකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නෘත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳ යන්න සම්බන්ධයෙන් උසාවත් විගණන තක්සේරු මත පදනම්ව නිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය නිර්ණය කරන ලදී. ප්‍රශ්නෘත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් ඵල හෙළිදරව්කිරීම් වලට මගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මගේ මතය වෙනස්කම කළ යුතුය. මගේ නිගමන, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, වනුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පදනම් වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන මතයතැබීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අගනුවත් කරුණු පිළිබඳව පාලනය භාරව සිටින පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතිකමය හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් වගකීම් ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මගේ විවේචනාත්මක තක්සේරුකිරීමෙහිදී මා විසින් සඳහා සලකන ලද කරුණු මගේ විගණන වාර්තාවේ ඇතුළත් කරුණු වලින් වන බලපෑම් සැබෑ, විගණනය සඳහා අවශ්‍ය මානව සම්පත් සහ සැපයීම් කිරීම මා විසින් ලබාගන්නා ලද අතර, මගේ අවශ්‍යතාවයන් මෙහි යන අතරවාරයේ නිති මූල්‍ය වාර්තා මණ්ඩලය වගවීමකින තොර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන ඉතුරුම් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) සහ 1.2 (ආ) නිරීක්ෂණ හැර ඉතුරුම් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට යෝජනා ක්‍රමය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාඝාරයෙන් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති,විධිවිධානවලට යොමුව | විස්තරය |
|---|---|
| 1987 අංක 12 දරන රෙජි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත. | |
| (අ) 4 වගන්තිය | නියමිත ශුද්ධසුකම් දරන්නාවූ ද වයස අවු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 59 නොඩැඩි ගොවිතැන් කටයුතුවල යෙදෙන ගොවීන් හට තම වැන්දිය කටයුතු කරගෙන යාමට නොහැකි ස්ථිර අර්ධ දුබලතාවයක් හෝ පූර්ණ දුබලතාවයක් වූ විට ආර්ථික වශයෙන් යම් පිටුවහලක් වීමට දීමනාවක් ගෙවීම, මරණයකදී මරණ පාරිතෝෂිකයක් ගෙවීම හා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට කාලපරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක් |

| | |
|---|---|
| | ගෙවීම් අරමුණු වුවද 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා යෝජනා ක්‍රමයට නිසිදු සාමාජිකයෙකු බඳවා ගෙන නොතිබුණි. |
| (අ) 15 (2),(3) වගන්ති | යම් දායකයෙකු වෙත නිතුන් කර ඇති සහනික යටතේ ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දැන්වීමක් මඟින් එම දායකයා වෙත නිතුන් කරනු ලැබිය යුතුය. එසේ නොදැන්වීම හේතුවෙන් වාර්ෂික නොගෙවීම් මත අවලංගු වූ සහනිකයක් නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අවස්ථාව මහතැරි නිසියමින් සමාලෝචිත වර්ෂය තුළදී වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම ඇති බව අදහස් කරමින් විශ්‍රාම වැටුප් අයදුම්පත් ඉදිරිපත් කළ පුද්ගලයින් 1,863 කටගෙවී විශ්‍රාම වැටුප් ලබා දී නොතිබුණි. |
| (ආ) 20 වගන්තිය | උපදේශන කමිටුව සඳහා නිල බලයෙන් පත්වන සාමාජිකයන් 06 දෙනෙකු හා නම් කළ සාමාජිකයන් 06 දෙනෙකු වශයෙන් සාමාජිකයන් 12 දෙනෙකු පත් කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 06 දින දක්වා සියලුම සාමාජිකයන් පත්කිරීම් අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී උපදේශන සභාව රැස්වී නොතිබුණු අතර අවසන් වරට උපදේශක සභාව රැස්වී තිබුණේ 2016 නොවැම්බර් 03 වන දිනය. මේ අනුව අවුරුදු 03ක් තුළ උපදේශන සභාව පවත්වා නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ මූලධර්ම , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස හැසිරුණු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ සමිපත් සහසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කෘත්‍යසිමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රයෝජනය කර නොමැති බව

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත පරිදි වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට සාමාජිකයන් හට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු බව සඳහන් වේ. එසේ වුවද ඊට පටහැනිව ආයතනය විසින් විශ්‍රාම වැටුප ගෙවන් කළ දින සිට ගෙවීම සිදු කර තිබීමෙන් 2017 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා ගොඩින් 27,049 කට එකතුව රු.584,359,397ක විශ්‍රාම වැටුප් මුදල් නිසව පැවතිණි. එසේම මූලා දුෂ්කරතා හේතුවෙන් 2012 – 2013 කාල පරිච්ඡේදයට අදාළව ගොඩින් 90,573කට හිමි විශ්‍රාම වැටුප් රු.3,033,329,200 ක්ද ගෙවා නොතිබුණි.

(ආ) 2012 වර්ෂය අවසන් වනවිට යෝජනා ක්‍රමයේ සක්‍රීය දායකයින් සංඛ්‍යාව 959,254ක් වූ අතර, 2012 වර්ෂයෙන් පසු යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ, මෙලෙසින් වූ , මියගිය සංඛ්‍යාව හා වාර්ෂික නොගෙවීම මත ඉවත් වීම් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට සක්‍රීය සමාජික සංඛ්‍යාව, වාර්ෂිකව එකතු වන දායකයා හා ගෙවිය යුතු නිවැරදි විශ්‍රාම වැටුප් වටිනාකම නොපමණද යන්න නිශ්චය කිරීමට නොහැකිව පැවතුණි.

(ඇ) 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වූ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළත් ගොවි දායකයින්ගේ තීව දත්ත තොරතුරු ඇතුළත් කර පද්ධතිය යාවත්කාලීන කිරීම කළයුතු බව 2015 අගෝස්තු 25 වන දින පැවැත්වූ උපදේශක කාරක සභා වාර්තාවේ සඳහන්ව තිබුණි. ඒ අනුව රු.1,726,875ක් වැයකර දිස්ත්‍රික්ක 08 ක පමණක් සම්පූර්ණ කටයුතු සිදු කර තිබුණි. අනිකුත් දිස්ත්‍රික්ක වලද කඩිනමින් එම කාර්යය නිමකර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට මණ්ඩලය කටයුතු නොකිරීම නිසා ඒ වෙනුවෙන් දරන ලද වියදම නිෂ්ඵාර්ය බවට පත්ව තිබුණි.

(ඈ) දැනට පවතින ක්‍රමය වෙනුවට ගොවි ප්‍රජාව වෙනුවෙන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හදුන්වා දීම සඳහා විද්වත් කමිටුව 2019 ජූලි 01 දින රැස්වූ අතර එම කමිටුව වෙත ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මගින් ඉදිරිපත් කළ විකල්ප යෝජනා ක්‍රම 4 ට අදාළව නණනය කිරීම වාර්තා සකස් කිරීම, එම යෝජනා ක්‍රම 4 න් තෝරාගත් යෝජනා ක්‍රමය සකස් කිරීමට අදාළ තොරතුරු විද්වත් කමිටුව වෙත නැවත යොමු

කිරීම, එම යෝජනා සම්බන්ධයෙන් අධ්‍යයන වාර්තා සකස් කිරීමෙන් අනතුරුව අගෝස්තු මාසය තුළදී භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම හා එයට අනුමැතිය ලබා ගැනීම හා සම්බන්ධීකරණය කිරීමට තීරණය ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඉ) නොගෙවූ විශ්‍රාම වැටුප් ලාභීන්ගේ මුදල් හා මියගිය පුද්ගලයන්ගේ විස්තර යාවත්කාලීන කර ගැනීම සඳහා තැපැල්පති විසින් දිසා ගිණුම් කාර්යාල වලට අයත් තැපැල් හා උප තැපැල් ස්ථානාධිපතිවරුන් වෙත නිකුත් කර තිබූ 2015 ජූලි 07 දිනැති ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් ලිපිය පරිදි, මණ්ඩලය මගින් ලබා දී ඇති විදුලුත් ලිපිනය සාවිතා කර නොගෙවන ලද විශ්‍රාම වැටුප්ලාභීන්ගේ විස්තර වාර්තාවක් මාසිකව දිසා ගිණුම් කාර්යාලයන්හි තැපැල් හා උප තැපැල් ස්ථානාධිපතිවරුන් විසින්කෘෂිරක්ෂණ මණ්ඩලයට එවිය යුතු වුවද මාතර හා කොළඹ දිසා ගිණුම් කාර්යාල එසේ නොකිරීම නිසා මාතර රු.1,000,000 - රු.1,700,000ක හා කොළඹ රු.100,000 - රු.300,000ක මුදල් ප්‍රමාණයන් වසර පුරා කෘෂිරක්ෂණ මණ්ඩලය හා දිසා ගිණුම් කාර්යාල අතර හුවමාරු වෙමින් පැවතිණි.

(ඊ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ බැංකු ගිණුම් 03 කට අදාළව 1992 වර්ෂයේ සිට පැවත එන තැන්පත් කළ හමුත් උපලබ්ධි නොවූ රු.1,179,624ක් වටිනා චෙක්පත් 117 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.විශ්‍රමරත්න
විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒජීඑල්/ඊ/පිෂ්/01/19/02 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි 19 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.විශ්‍රමරත්න

විගණකාධිපති

පිටපත්:- 01. ලේකම් - කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් අමාත්‍යාංශය


අංක 306/72, කොළඹුලු පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 20 - 24 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naoi.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒජිවි/ඉ/ පිළි /01/1902 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි 15 දින

ගරුතුමි,

කළමනාකාරීත්ව හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ශ්‍රීලංකා විගණන ආඥාපනත 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සමිතිවේදන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාරූපණය කළ මාතෘකා**

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විභාවිතිය ආදායම් ප්‍රකාශනය, ඉදිරි වසරකට වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් නිලුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) වගන්තියට සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ශ්‍රීලංකා විගණන පනතේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියට ප්‍රකාරව මාගේ වාර්තාව යටා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාරූපණය කළ මාතෘකා සඳහා සඳහන් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා නිලුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාරූපණය කළ මාතෘකා සඳහා සඳහන්**

(අ) ශ්‍රී ලංකා නිලුම්කරණ ප්‍රමිති වලින් බැහැරවීම

ශ්‍රී ලංකා නිලුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සඤ්ඤිත දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම් සඳහා අදාළ ගණන තත්ත්වේරුව කාලානුරූපීව සිදු කළ යුතු

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naod.gov.lk

වුවද 2007 වර්ෂයෙන් පසුව එය සිදුකර නොතිබුණි. 2007 වර්ෂයට අදාළ විශ්‍රාම වැටුප් වගකීම් ප්‍රතිපාදනය රු.1,242,006,539 ක් වුවත් 2019 දෙසැම්බර් 31 දිනට එවැනි ආයුගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් වගකීම රු.3,915,569,738ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ගණකාධිකරණ අඩුපාඩු

2011 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ඉල්ලුම් කළ ධීවරයන් 121 දෙනෙකුට හිමි නොගෙවූ විශ්‍රාම වැටුප් එකතුව රු. 3,685,792 ක් ගෙවීවා සේ සලකා ගෙවිය යුතු ගිණුමින් ඉවත් කර තිබුණි. මේ හේතුවෙන් ගෙවිය යුතු ගිණුම මෙම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි.

(ඇ) යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් වගකීම රු.3,915,569ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 9.04ක වැඩි වීමකි. එසේම සමුච්ඡිත අරමුදලෙහි සෘණාත්මක තත්ත්වය රු.3,288,940,708ක් දක්වා එනම් ඉකුත් වර්ෂයට වඩා සියයට 11.58ක වැඩි වී තිබීමෙන් එයද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. තවද ඉදිරි වර්ෂයන් තුළදී මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය විය හැකි බැවින් ඒ පිළිබඳ සලකා යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කොට මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට ආයතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය යෝජනා ක්‍රමය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකසුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම,

චෙතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් ඇති බව

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) සහ 1.2 (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට යෝජනා ක්‍රමය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති විධිවිධානවලට යොමුව | විස්තරය |
|---|---|
| **1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත** | |
| (i) 16 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට සාමාජික ගාස්තු ගෙවීම පැහැර හරින ලද සාමාජිකයන් 72 දෙනකුගේ සාමාජිකත්වය අවලංගු කිරීමට ප්‍රථමයෙන් ඒ සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් අවලංගු වූ සහතිකයක් නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අයිතිය ද අහිමි වී තිබුණි. සාමාජිකත්වය අවලංගු වුවන් හට ශුද්ධ වාරික හා පොලිය ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,293,842 ක් ආපසු ගෙවා තිබුණි. |
| (ii) 20 වගන්තිය | 2019වර්ෂය වෙනුවෙන් මණ්ඩලයේ උපදේශක කාරක සභාවේ සියලුම සාමාජිකයන් පත්කර තිබුණු නමුදු 2016 නොවැම්බර් 03 දිනෙන් පසුව කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යෝජනා ක්‍රමයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. **වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) සමාලෝචිත වර්ෂය තුළ දායකයින් 100ක් බඳවා ගැනීම තුලින් රු.307,000ක දායක මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු සාමාජිකයෙකු යෝජනා ක්‍රමයට බඳවා ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී මරණ, බෙලහීනතාවය සහ නිසි පරිදි වාරික නොගෙවීම මත දායකයින් 96 දෙනෙකු යෝජනා ක්‍රමයෙන් ඉවත්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයට මුළු දායකය රු.340,189 ක් වුවද මුළු විශ්‍රාම වැටුප් ගෙවීම රු.63,346,699ක්ද ඉද්ධ වාරික ගෙවීම රු.1,293,842 ක් හා මරණ ඛෙලගීන ප්‍රතිලාභ ගෙවීම රු.368,000ක් වුයෙන් ලැබුණු දායකය ඉක්මවා අරමුදලින් රු.64,668,352 ක් යෝජනා ක්‍රමයෙන් ගෙවීම කර තිබුණි.

(ඇ) වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වුවද යෝජනා ක්‍රමය විසින් එය සකස්කළ දින සිට ගෙවීම කිරීම හිසා ධීවරයන් 129 දෙනෙකුට හිමි රු.3,940,215 ක විශ්‍රාම වැටුප් ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපචිත කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ தந்தி Telegrams: රක්ෂණ ஞ்சுறை Rakshana

117, ඉහළදොරාම පාර, හෝමාගම,
ඉහළගොඩ

මගේ අංකය எமது இலக்கம் My Ref. No. 2019/4/5/බු/ර/2

ඔබේ අංකය உமது இலக்கம் Your Ref. No.

දිනය திகதி Date 2020.07.22

විගණන අධිකාරී,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**2019 වර්ෂයේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද,2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගවිගන්නිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු යැවීම.**

මා වෙත එවන ලද අංක AGL/E/AAIB/01/19/15 දරණ 2020/06/11 දිනැති 2019 වර්ෂයේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගවිගන්නිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව හා බැඳේ.

එකී වාර්තාවෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සකස් කල පිළිතුරු වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

නොමේ වෙනත්, අදාල විගණන වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අපගේ දැඩි අවධානය යොමු වී ඇති බවත්, ඉදිරියේදී මෙවැනි දෝෂයන් මගහරවා ගැනීමට කටයුතු කරන බවත්, දන්වා සිටීමට කැමැත්තෙමි.

සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

දුරකථන தொலைபேசி Telephones
සභාපති தலைவர் 011-2812571
011-2812572
011-2812573
අධ්‍යක්ෂක 011-5732397
011-2812574
ප්‍රධාන කාර්යාලය தலைமையகம் 011-5384000
ෆැක්ස් பெக்ஸ் Fax

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

1.2 **තත්වාගණනය කල මතය සඳහා පදනම**

(අ) ගොවීන්ගේ මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම සඳහා වෙන් කිරීම ගොවි විශ්‍රාම වැටුප් අරමුදල මගින් ගණනය කොට ගොවීන්ගේ මරණ හා බෙලහීන පාරිතෝෂික අරමුදලට බැර කරන අතර, ඊට අදාල තොරතුරු ජ'නල් සටහන් අංක 12 මගින් අනාවරණය කර ඇත. දැනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නව දායකයින් බඳවා ගැනීමකින් තොරව ක්‍රියාත්මක වන බැවින්, ආයු ගණක තක්සේරුවක් සිදුකර නොමැති අතර, ඉදිරියේදී විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග ආයුගණක තක්සේරුව නියමිත පරිදි සිදු කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) මගියංගනය, ඇඹිලිපිටිය හා අනුරාධපුරය යන නිල නිවාසයන්හි ඉඩම් වල වටිනාකම හා ඇඹිලිපිටිය නිල නිවාසයේ වටිනාකම තක්සේරු කර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂකවරුන් සමග සාකච්ඡා කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් එම කටයුතු අවසාන කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.**

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.**

2 **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

3 **අනෙකුත් විගණන නිරීක්ෂණය**

(අ) 2021 වර්ෂයේ දී ඇඹිලිපිටියේ පිහිටි නිල නිවාසයෙහි අවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකර භාවිතයට ගත හැකි තත්වයට ගෙනඒමට කටයුතු සැලසුම් කර ඇත.

(ආ) මහනුවර ඉඩමේ ගැටළු සහගත තත්වයක් තිබූ බැවින් මිනින්දොරු දෙපාර්තමේන්තුවෙන් නැවත මැන මායිම් සලකුණු කරගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර ඉන්පසුව ඉදිරි කටයුතු කිරීම සිදුකරනු ඇත.

1

අම්පාර,මනම්පිටිය හා මහව යන ප්‍රදේශයන්හි පවරාගෙන ඇති ඉඩම් නැවත විමර්ශනයට භාජනය කර ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) ඉදිරි වර්ෂය තුළ දී මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ඇති අතර අදාළ භූමිය වෙන් කර ගැනීමෙන් පසු ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මූලික බිම් නිර්මාණය කරදීම ඉටුකරගැනීමට කටයුතු කරනු ඇත. කාර්ය ඉටුවන තෙක් එය ප්‍රාග්ධන අත්තිකාරමක් ලෙස දක්වා ඇත.

(ඈ) මණ්ඩලයේ සේවයෙන් ඉවත් වී ගිය/ විශ්‍රාම ගිය නිළධාරීන්ගේ, ගෙවීම් පැහැර හැර ඇති ණය ශේෂයන් හා පොළී මුදල් අයකර ගැනීම සඳහා එන්තරවාසි යවා ඇති අතර, ඒ අනුව ගෙවීම් නොකලහොත් ඉදිරියේදී ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. තවද, මෙසේ පැහැර හැර තිබූ බොහෝ නිලධාරීන්ගේ ණය ශේෂයන් ඔවුන් සේවක අර්ථසාධක අරමුදල් ලබාගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛණ ලබාගැනීමට මණ්ඩලය වෙත පැමිණෙන අවස්ථාවලදී අයකර ගැනීමට කටයුතු කල අතර, අනෙකුත් නිලධාරීන්ගේ ණය ශේෂයන් ඇපකරුවන් මගින් අයකර ගැනීමටත් කටයුතු කරමින් පවතී.

(ඉ) මණ්ඩලයට විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු රු. 708,347/- ක මෙම ශේෂය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා දැනටමත් කටයුතු සිදුකරමින් පවතී.

(ඊ) මෙම ව්‍යාපෘතීන් නවතා දැමීමක් සිදුවී නොමැති අතර, ගම්පහ හා බදුල්ල දිස්ත්‍රික්ක වල සිදු කරන ලද මූලික ව්‍යාපෘතීන් (Feasibility Study) මගින් ලද අත්දැකීම් අනුව මෙම වැඩසටහන දීප ව්‍යාප්තව සිදුකිරීමට අදහස් කෙරේ. ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනා මේ වන විටත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

(උ) කඩිනමින් වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලීම් සිදුකර ඇති අතර, මුදල් ලද වහාම ගොවීන් වෙත වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. 2020 ජූලි මාසය වන විට 2019/20 මහ කන්නය ද ඇතුළුව එම කන්නයේ ප්‍රතික්ෂේප වූ ගොවීන්ගේ වන්දි හැර ඊට පෙර කන්නයන් සඳහා ද වන්දි ගෙවීම් අවසන් කර ඇත.

(ඌ) මේ වන විට ගම්පහ සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වලද මේ වන විට දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වන්දි ගණනය ආරම්භ කර ඇත. එසේම දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගොවි හැඳුනුම්පත් ලබාදීමට මෙතෙක් සැලසුම් කර නොමැත. ඉදිරියේදී විධිමත් ගොවි හැඳුනුම්පතක් නිකුත් කිරීම සම්බන්ධයෙන් මේවන විට සාකච්ඡා කරමින් පවතී.

(එ) පැවති දේශගුණික තත්වය තුල දැඩි අවදානමක් හටගෙන තිබුණු බැවින් හා මෙම තත්වයෙහි පෙර පැවති කන්න හා සසඳන විට දැඩි අවධානමක් ඇති බැවින් ප්‍රතිරක්ෂණය

ලබාගෙන ඇත. මෙම ප්‍රතිරක්ෂණය සඳහා පදනම් වූයේ රක්ෂණ ක්‍රියාපටිපාටියට අනුව ප්‍රතිරෝකථනය කරන ලද වගකීමකි. එසේ ඔලාපොරොත්තු වූ පරිදි හානියක් සිදු වූයේ නම් ප්‍රතිරක්ෂණයෙන් හානි පූරණය කිරීමට හැකිවනු ඇත. මෙම ප්‍රතිරක්ෂණය ලබා ගැනීමේදී කැබිනට් මණ්ඩලය අනුමත පෙත්ඩර් මණ්ඩලයක් මගින් හා ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගෙන් සැලසුම්ලත් තාක්ෂණික කමිටුවක් මගින් මෙය සිදු කිරීමට කටයුතු කර ඇති අතර රක්ෂණ ක්‍රමවේදය තුළ කටයුතු කර ඇති නිසා මෙම වාරික ඕදල නිෂ්කාර්යය වියදමක් ලෙස සලකා ගත නොහැක. මණ්ඩලයේ පාලනයෙන් බැහැර කාලගුණික හා වෙනත් හානි සම්බන්ධයෙන් වඩා නිවැරදි ප්‍රතිරෝකථනයක් කිරීමේ හැකියාවක් නොමැති වීමේ හේතුව නිසාත්, ඔලාපොරොත්තු වූ පරිදි හානි වාර්තා නොවූ නිසාත්, ප්‍රතිරක්ෂණයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොමැත.

**(ඒ)** 2019 යල කන්නය සඳහා ප්‍රතිරක්ෂණය යටතේ ලැබිය යුතු රක්ෂණ වන්දි ඕදල් ලබාදෙන ලෙස අවස්ථා ගණනාවකදී ඔවුන්ට ලිඛිතව මෙන්ම වාචිකවද දැනුවත් කර ඇති අතර, මේ පිළිබඳව මහා භාණ්ඩාගාරය හා ජාතික රක්ෂණ භාර අරමුදල සමඟ සාකච්ඡා කර ඇත. එහිදී මේ සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය පියවර ගන්නා බව අපෙන්න දැනුම් දී ඇත.

**(ඓ)** පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු මෙම සඟළු ලුවෙවාලු වාසියුරු වරම සඳහා පියවර ගනිමින් සිටින අතර මාණ්ඩලික ශ්‍රේණියේ නානතුරු ඉක්මනින් බඳවාගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිගේ අනුමැතිය ලබාගෙන ඇති අතර, පුරප්පාඩු සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීම් පළකිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතී.

.....

3

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் சுமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ ලිපිනය Telegrams: රක්ෂණ Rakshana

117, ශ්‍රීමද්දාරාම පාර, හංගොඩවිල,
ශ්‍රීජයවර්ධනපුර

මගේ අංකය My Ref. No. 2019/4/5/ඉ/ —ගොඩ/2—

ඔබේ අංකය Your Ref. No. ———

දිනය Date 2020.06.22

විගණන අධිකාරී,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**2019 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද,2018 අංක 19දරණ ජාතික විගණන පනතේ 12 වගවගන්නිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා සිදුකුරු සැපයීම.**

මා වෙත එවන ලද, අංක AGL/E/FPS/01/19/02 දරණ 2020/05/26 දිනැති '2019 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගවගන්නිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව හා බැඳේ.

එකී වාර්තාවෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සකස් කල පිළිතුරු විංරිතාව මේ සමඟ ඉදිරිපත් කරමි.

මහාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

දුරකථන Telephones: සභාපති 011-2812571, 011-2812572, 011-2812573
අධ්‍යක්ෂ 011-5732397, 011-2812574
ප්‍රධාන කාර්යාලය 011-5384000
ෆැක්ස් Fax

## ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව2018 අංක 19දරණ ජාතික විගණන පනතේ 12 වනවගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මිතය

1.2 තත්වාගණනය කළ මිතය සඳහා පදනම

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් බැහැර වීම**

2007 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම් පිළිබඳ සිදු කරන ලද ආයුගණනය තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර කිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.

මේ වන විට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පුළුල් කිරීමෙන් සාධාරණ දායකත්වයක් විශ්‍රාම වැටුප් දායකයාගෙන් ලබාගැනීමට අදාල සාකච්ඡා පැවැත්වෙමින් ඇත. ඒ අනුව ඉදිරියේදී මේ පිළිබඳව විධිමත් ආකාරයකින් නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීමට හැකිවේයයි අදහස් කෙරේ.

(ආ) **යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම**

අංක 153/49 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමට කටයුතු කර ඇති අතර ස්වයං මූල්‍ය පදනමකින් පවත්වාගෙන යා හැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් එමඟින් හඳුන්වාදෙන ලදී. ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශක්‍යතා ලුවිද විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ගොඩ නැඟී ඇති විශ්‍රාම වැටුප් වගකීමට සාපේක්ෂව අරමුදල ගොඩනැඟීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත දැනටමත් අවශ්‍ය වාර්තාවන් ඉදිරිපත් කර ඇති අතර, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබීමෙන් පසු අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

1

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

2 ඉදිරිපත් කිරීමේදී හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**නීති රීති විධිවිධාන වලට යොමුව**

(අ) **4 වගන්තිය**

2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරණ ගොවි විශ්‍රාම වැටුප් අති විශේෂ ගැසට් නිවේදනය පරිදි විශ්‍රාම වැටුප් ගෙවීමද මෙම යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු වාර්තය ඉහල අගයක් ගත් බැවින් මේ සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවන්හිදී ලබාදුන් උපදෙස් පරිදි මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරන ලද අතර ඒ අනුව මෙම යෝජනා ක්‍රමයට බඳවා ගැනීම ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමට සිදු විය. 2015 වර්ෂයේදී සිදුවූ රාජ්‍ය ප්‍රතිපත්ති වෙනසත් සමග නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලෙස ඇමැතිතුමා වෙත උපදෙස් ලැබුණි. ඒ අනුව ක්‍රියාත්මක වී නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස්කොට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමුකර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකරන ලදී මෙහි දී මෙම යෝජනා ක්‍රමය විශේෂඥ කමිටුවකට යොමු කිරීමෙන් උපදෙස් ලබාගත යුතු බවට තීරණය විය. 2019 වර්ෂයේ සිතිවූ නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, නව ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට යෝජනා කර ඇති බැවින් ඉදිරියේදී නව රජයේ ප්‍රතිපත්තියට අනුව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට අපේක්ෂිතය.

(ආ) **15 (2) (3) වගන්ති**

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායක වී ඇති ගොවීන් අඛණ්ඩව වාරික 05 ක් ගෙවීම පහාර හැරියහොත් ඔවුන්ගේ දායකත්වය අවලංගු වන අතර ඒ පිළිබඳව ඔවුන් යෝජනා ක්‍රමයට දායක වන අවස්ථාවේදී අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කරන අතර, ඔවුන් වෙත ලබාදෙන වාරික මුදල් සටහන් පොතේ සහ සහනික ඔප්පුවෙහි ඒ පිළිබඳව පැහැදිලිව සටහන් කර ඇත. එසේ දායකත්වය අවලංගු වූ ගොවීන්ගේ ගෙවූ වාර මුදල් ඔවුන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී පොළියද සමගින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) **20 වගන්තිය**

ගොවි විශ්‍රාම වැටුප් උපදේශක කාරක සභාවේ සාමාජිකයින් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට හා කඩිනමින් උපදේශක කාරක සභාව රැස්වීමට අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිතය.

3. **වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) 20,000 කට අධික ගොවීන් සංඛ්‍යාවක් විශ්‍රාම වැටුප් ලැබීම සඳහා පොරොත්තු ලේඛණයේ සිටි බැවින් එම ගොවීන් කඩිනමින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් ලේඛණයට ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මෙම නිසා පොරොත්තු ලේඛණයේ සිටි ගොවීන් 20,503 කට විශ්‍රාමවැටුප් ගෙවීමට හැකියාව ලැබී ඇත. ඉදිරියේදී කිසිම හිඟ මුදලක් ඇති නොවන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම විශ්‍රාම වැටුප් ලේඛණයට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මෙම හිඟ මුදල භාණ්ඩාගාර ප්‍රතිපාදනයන් අනුව ඉදිරියේදී ක්‍රමිකව ගෙවීමට කටයුතු කරනු ලබන අතර, හිඟ විශ්‍රාම වැටුප් මුල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ලෙස ගිණුම් ගත කර ඇති අතර, ගෙවනු ලබන අවස්ථාවේදී එකී වගකීමෙන් ඉවත් කරනු ලැබේ.

(ආ) යෝජනා ක්‍රමයේ සක්‍රිය දායකයන් හඳුනා ගැනීම සඳහා පසු වාරික පරිගණක ගත කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. ඉදිරියේදී අඛණ්ඩව පසු වාරික පරිගණක ගත කිරීමේ ක්‍රියාවලිය සිදුකිරීමට සැලසුම් කර ඇති අතර, මේ වන විට අභ්‍යාසලාභීන් තිදෙනෙකු පසු වාරික පරිගණක ගත කිරීම සඳහා පූර්ණ කාලීනව යොදවා ඇත. ඉදිරියේදී මෙම දත්ත ඇතුලත් කිරීමේ ධාරිතාව තවත් වැඩිකිරීමට අපේක්ෂා කෙරේ. යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ, බෙලහීන වූ හා මියගිය දායකයන්ගේ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත

(ඇ) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්ව තොරතුරු යාවත්කාලීන කිරීමේ වැඩසටහනේදී, තොරතුරු ඉදිරිපත් කර තිබූ ගොවීන්ගේ සංඛ්‍යාව අඩ අගයක් ගත්ත ද ලැබී ඇත තොරතුරු දිස්ත්‍රික් මට්ටමින් පරිගණක ගත කොට යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. මණ්ඩලය අපේක්ෂා කල පරිදි ගොවීන් සමීක්ෂණයට නිසි පරිදි තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා අදාල ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වී ඇති අතර, ඉදිරියේදී මෙම තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ.

(ඈ) ගොවි හා ධීවර ප්‍රජාව සඳහා නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පත් කරන ලද විද්වත් කමිටුව 9% ආයෝජන අනුපාතය යටතේ ගොවි හා ධීවර ප්‍රජාව වෙනුවෙන්

විශ්‍රාම වැටුපක් සැකසීම සුදුසු බවට තීරණය කරන ලදි. තවද මෙම යෝජනා ක්‍රමයෙන් සඳහා ආදායම් ගණනය කිරීමේ ක්‍රමවේදයන් සොයා බැලීමටත් තීරණය විය. වගා බදු අරමුදල හා ගොවිසෙන ලොතරැයි ආදායම් මේ සඳහා යොදා ගත හැකි බව මූලික වශයෙන් නිරීක්ෂණය කරන ලදි.

නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිළිබඳ සඳහන් කර ඇති බැවින් එම රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිත ය.

(ඉ) නොගෙවූ විශ්‍රාම වැටුප් ආපසු එවීම පිළිබඳ තැපැල්පති විසින් නිකුත් කරන ලද 2015 ජූලි 07 දිනැති උපදෙස් ලිපිය අනුව දිසාගණකාධිකාරී කාර්යාල කටයුතු කර නොමැති බවට විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද නිරීක්ෂණය පිළිබඳ තැපැල්පතිතුමා දැනුවත් කිරීම කටයුතු කරන ලදි. ඒ අනුව විශ්‍රාම වැටුප් ගෙවීම සෑම මසකම 07 වෙනි දින සිට 15 වන දින තුළ වැඩ කරන දින 06ක් ඇතුලත සිදු කළ යුතු බවත්, සියලු ගොවි විශ්‍රාම වැටුප් සාරාංශ, නොගෙවන ලද විශ්‍රාම වැටුප්ලාභීන්ගේ විස්තර හා ඉතිරි මුදල් ඊළඟ මාසයේ 10 වෙනි දිනට ප්‍රථමයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලැබීමට සැලැස්විය යුතු බවත්, ඒ පිළිබඳ දිසාගණකාධිකාරීවරු දැනුවත් කර රජයේ විගණනය මගින් පෙන්වා දී ඇති ප්‍රමාදයන් වලක්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දැනුම් දී ඇත.

මේ වන විට මාතර හා කොළඹ දිසා ගණකාධිකාරීවරුන් දැනුවත් කර නොගෙවූ විශ්‍රාම වැටුප් මුදල් හා නාමලේඛණ කඩිනමින් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

(ඊ) මෙම ශේෂයන් වසර 15-25ක් අතර පැරණි ශේෂයන් වන අතර 2003 වර්ෂයේදී මේ පිළිබඳ සොයා බලා නිවැරදි කල හැකි සියළුම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කල අතර එසේ සොයා ගත නොහැකි වූ ශේෂයන් මෙලෙස ඉදිරියට ගෙනවිත් ඇත. මෙම තත්වයට බොහෝ විට හේතු වී ඇත්තේ එකම චෙක්පතට දෙවරක් රිසිට්පත් නිකුත් කිරීම වේ. මේ පිළිබඳව දිගින් දිගටම විගණන කමිටු වලදී හා මහා භාණ්ඩාගාරයේදී පැවති විශේෂ සාකච්ඡා වලදී කරුණු සොයා බැලීමෙන් පසුව, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එහි අනුමැතිය ලැබූ පසු ගිණුම් වලින් කපාහැරීමට බලාපොරොත්තු වේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ ලිපිනය / Telegrams: රක්ෂණ බැංකුව Balcchana

117, ශ්‍රීසුමංගල පාර, හංවැල්ල, බුලත්සිංහල

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. 2019/A/S/මු/වි/2

ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.

දිනය / திகதி / Date 2020.06.22

විගණන අධිකාරි,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**2019 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද,2018 අංක 19දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.**

මා වෙත එවන ලද, අංක AGL/E/Fish/01/19/02 දරණ 2020/05/19 දිනැති 2019 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව හා බැඳේ.

එහි වාර්තාවෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සකස් කල පිළිතුරු, වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

සභාපති,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය.

දුරකථන / தொலைபேசி / Telephones
සහකාරී / துணைச் / Fax

සහකාරී / துணைச் 011-2812571, 011-2812572, 011-2812573
අධ්‍යක්ෂ 011-5732397, 011-2812574
දුම්රිය සේවාලය / தொடருந்து நிலையம் 011-5384000

**2019 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 2018 අංක 19දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු සංයුක්ත**

1. **මූලික ප්‍රකාශන**

1.1 **තත්වාගණනය කළ මාසය**

1.2 **තත්වාගණනය කළ මාසය සඳහා පදනම**

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් බැහැරවීම්**

2007 වර්ෂයේදී ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සදු කරන ලද ආශ්‍රගණනය තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.

මේ වන විට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පුළුල් කිරීමෙන් සාධාරණ දායකත්වයක් විශ්‍රාම වැටුප් දායකයාගෙන් ලබාගැනීමට අදාල සාකච්ඡා ධීවර අමාත්‍යාංශය හා මණ්ඩලය අතර පැවැත්වෙමින් ඇත. ඒ අනුව ඉදිරියේදී මේ පිළිබඳව විධිමත් ආකාරයකින් නව ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීමට හැකිවේයැයි අදහස් කෙරේ.

(ආ) **ගණකාධිකරණ අඩුපාඩු**

විගණනය විසින් පෙන්වා දී ඇති එම ගිණුම්කරණ දෝෂයේ නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

යෝජිත නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සකස් කිරීමේදී මෙම දෝෂයන් මගහරවා ගැනීමට අවශ්‍ය නාක්ෂණික හා අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි.

(අ) **යෝජනා ක්‍රමයේ අරමුදල් පැවැත්ම**

ගොවි හා ධීවර ප්‍රජාව සඳහා නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පත් කරන ලද විද්වත් කමිටුව 9% ආයෝජන අනුපාතය යටතේ ගොවි හා ධීවර ප්‍රජාව මෙනුවෙන් විශ්‍රාම වැටුපක් සැකසීම සුදුසු බවට නිරණය කරන ලදි. තවද මෙම යෝජනා ක්‍රමයෙන් සඳහා ආදායම් ගණනය කිරීමේ ක්‍රමවේදයන් සොයා බැලීමටත් නිරණය විය. එහා බදු අරමුදල හා

ගොවිසෙත ලොතරැයි ආදායම් මේ සඳහා යොදා ගත හැකි බව මූලික වශයෙන් නිරීක්ෂණය කරන ලදි.

නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිළිබඳ සඳහන් කර ඇති බැවින් එම රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිත ය.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

2 **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**නීති රීති විධිවිධාන වලට යොමුව**

(i) **16 වගන්තිය**

අඛණ්ඩව වාරික 10 ක් නොගෙවූ දායකයින්ගේ දායකත්වය අහෝසි වන බව යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ ධීවරයින්ට පූර්ව දැනුම් දීමක් කර ඇත.

තවද, එසේ දායකත්වය අවලංගු වීම පිළිබඳව දැනුම්දීම ධීවර දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, දායකත්වය අවලංගු වූ ධීවරයින්ට ධීවර දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මගින් නව දායකයකු ලෙස නැවත ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට හැකියාව ඇත.

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සම්බන්ධ නිසි බලධාරියා වන ධීවර දෙපාර්තමේන්තුව වෙත විගණන වීමසුමේ දක්වා ඇති කරුණු නැවත සිදුනොවීමට අදාල ක්‍රියාමාර්ග ගන්නා ලෙස මවුන්ව දැනුවත් කරනු ලැබේ.

(ii) **20 වගන්තිය**

ධීවර විශ්‍රාම වැටුප් උපදේශක කාරක සභාවේ සාමාජිකයින් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට හා කඩිනමින් උපදේශක කාරක සභාව රැස්වීමට අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිතය.

3. **වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන්නේ ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වන අතර සාමාජිකයින් බඳවාගැනීම ඇතුලුව කාර්යසාධනය ක්‍රියාත්මක වනුයේ ධීවර

දෙපාර්තමේන්තුව මගිනි. ඉදිරියේදී ධීවර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව මෙම යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයකින් යුතු නව යෝජනා ක්‍රමයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට අපේක්ෂා කරන අතර, ඒ අනුව වඩා ඵලදායී ක්‍රියාත්මක සැලැස්මක් අනුව යෝජනා ක්‍රමය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

නිසිපරිදි වාරික නොගෙවන ධීවරයින් යෝජනා ක්‍රමයෙන් ඉවත්කරන බව දායකයින් බඳවා ගන්නා අවස්ථාවේදී දැනුවත් කර ඇත. තවද, මරණයක් හෝ බෙලහීනතාවයක් ඇති වුවහොත් මරණ පාරිතෝෂික හෝ බෙලහීන ප්‍රතිලාභ ලබාදීම යෝජනා ක්‍රමයේ අන්තර්ගතව ඇත.

(ආ) දැනට පවතින ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයකින් යුතු යෝජනා ක්‍රමයක් නොවන බැවින් නව බඳවාගැනීම් ප්‍රවර්ධනය කිරීම සිදු නොකරයි. නමුත් යෝජනා ක්‍රමයට දායකවී ඇති ධීවරයින් වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා විශ්‍රාම වැටුප් ලැබීම සඳහා සුදුසුකම් ලබන බැවින් මෙලෙස විශ්‍රාම වැටුප් ගෙවීම් වර්ධනය වී ඉවතට ඇදී යන අරමුදල ප්‍රමාණය වැඩිවී ඇත.

(ඇ) දිගුකාලයක් ධීවර විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම පමාවී ඇති ධීවරයින් හට හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමේදී එසේ ප්‍රමාද වීමට හේතු වූ කාරණා සොයා බැලීමෙන් පසු ගෙවීම් කිරීමේදී පැරණි හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවීම නිසා මෙම තත්වය උදාවී ඇත. යුද්ධය පැවති දිස්ත්‍රික්කයන්ගේ ධීවර විශ්‍රාම වැටුප් අයදුම් කිරීමේදී විශාල ප්‍රමාදයන් දක්නට ලැබුණු බැවින් එසේ ප්‍රමාද වීමට හේතු කාරණා ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් ඇතුළු දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්ගෙන් ඒ පිළිබඳව තහවුරු ලබාගැනීමෙන් පසු අදාල මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

---

3